# අ.පො.ස (උ.පෙළ) විභාගය - 2017

# ඇගයීම් වාර්තාව

# 71 - සිංහල

**පර්යේෂණ හා සංවර්ධන ශාඛාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව.**

# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2017

# ඇගයීම් වාර්තාව

# 71 - සිංහල

**පර්යේෂණ හා සංවර්ධන ශාඛාව**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,**
**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.**

**සියලු ම හිමිකම් ඇවිරිණි.**

**සිංහල**

ඇගයීම් වාර්තාව - අ.පො.ස. (උපෙළ) විභාගය - 2017

# හැඳින්වීම

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය, ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයේ අවසාන සහතිකකරණ විභාගය යි. ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අවසානයේ සිසුන්ගේ සාධන මට්ටම සහතික කිරීම මෙම විභාගයේ ප්‍රධාන අරමුණ වුව ද ජාතික විශ්වවිද්‍යාලවලට, වෙනත් උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලට මෙන් ම ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට සුදුස්සන් තෝරා ගැනීම ද මෙම විභාගයේ ප්‍රතිඵල මත සිදු කෙරෙන බැවින් සාධන පරීක්ෂණයක් වශයෙන් මෙන් ම තේරීමේ පරීක්ෂණයක් වශයෙන් ද අ.පො.ස. (උ.පෙළ) විභාගය, ඉතා වැදගත් තත්ත්වයක් උසුලයි. එමෙන් ම තෘතීයික මට්ටමේ රැකියා සඳහා ද ප්‍රවේශ සුදුසුකම් සහතික කෙරෙන විභාගයක් වශයෙන් මෙය පිළිගැනේ. 2017 වර්ෂයේ දී මෙම විභාගය සඳහා 206630ක් පාසල් අයදුම්කරුවෝ ද 46700ක් පෞද්ගලික අයදුම්කරුවෝ ද පෙනී සිටියහ.

මෙම විභාගයෙන් උසස් සාධන මට්ටමක් ලබා ගැනීම සඳහා සිසුහු ද ඔවුන්ගේ එම අපේක්ෂා සපුරාලීම සඳහා ගුරුවරු හා දෙමව්පියෝ ද දැඩි වෙහෙසක් දරති. මෙම ඇගයීම් වාර්තාව සකස්කර ඇත්තේ ඔවුන්ගේ එම අපේක්ෂා ඉටුකර ගැනීම පිණිස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් සහාය ලබා දීමක් වශයෙනි. මෙම ඇගයීම් වාර්තාවේ ඇතුළත් තොරතුරු විභාග අපේක්ෂකයන්ට, ගුරු භවතුන්ට, විදුහල්පතිවරුන්ට, ගුරු උපදේශක මහත්ම මහත්මීන්ට, විෂයභාර අධ්‍යක්ෂවරුන්ට, දෙගුරුන්ට හා අධ්‍යාපන පර්යේෂකයන්ට එක සේ ප්‍රයෝජනවත් වනු නොඅනුමාන ය. එබැවින් මෙම වාර්තාව වැඩි පිරිසකගේ පරිශීලනය සඳහා යොමු කිරීම වඩාත් සුදුසු වේ.

මෙම ඇගයීම් වාර්තාව I, II හා III යනුවෙන් කොටස් තුනකින් සමන්විත වේ. අ.පො.ස. (උ.පෙළ) සිංහල විෂයයෙහි විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ I කොටසෙහි අඩංගු වේ. ඒ යටතේ විෂයය සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව, ඔවුන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය, දිස්ත්‍රික් මට්ටමින් පාසල් අයදුම්කරුවන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය, පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ව්‍යාප්තිය යන විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු ද සිංහල විෂයයේ I හා II පත්‍රවල ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය, එම ප්‍රශ්නවලට හා එම එක් එක් ප්‍රශ්නයෙහි කොටස්වලට ලකුණු ලබා ගෙන ඇති ආකාරය සවිස්තරාත්මක ව දැක්වෙන විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද අන්තර්ගත වේ. අ.පො.ස. (උ.පෙළ) 2017 විභාගයේ සිංහල විෂයයෙහි I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න හා එම ප්‍රශ්නවලට අයදුම්කරුවන් පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවේ II කොටසෙහි අඩංගු වෙයි. ඒ යටතේ I හා II ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා සංවර්ධනාත්මක යෝජනා අන්තර්ගත වේ. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාව මගින් උත්තර පත්‍ර ඇගයීමේ නිරත වූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන හා සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු, නිරීක්ෂණ, අදහස් හා යෝජනා ද සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory) හා අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory) යොදා ගනිමින් අයදුම්කරුවන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය මගින් ලබා ගත් තොරතුරු ද මෙම ඇගයීම් වාර්තාව සකස් කිරීම සඳහා පදනම් කර ගෙන ඇත.

ප්‍රශ්න පත්‍රවල එක් එක් ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් සැලකිලිමත් විය යුතු කරුණු ද ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පිළිබඳ අදහස් හා යෝජනා ද මෙම වාර්තාවෙහි III කොටසෙහි ඇතුළත් කර ඇත. විවිධ නිපුණතා හා එම නිපුණතා මට්ටම්වලට ළඟා වීම සඳහා ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ආකාරය පිළිබඳ ව මෙයින් මහත් පිටිවහලක් ලැබෙනු ඇතැයි සිතමි.

ඉදිරියේ දී සම්පාදනය කරනු ලබන ඇගයීම් වාර්තාවල ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම සඳහා ඵලදායී අදහස් හා යෝජනා අප වෙත යොමු කරන ලෙස කාරුණික ව ඉල්ලමි. මෙම වාර්තාව සැකසීම සඳහා අවශ්‍ය තොරතුරු සැපයූ ප්‍රධාන, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන්ට හා සහකාර පරීක්ෂකවරුන්ටත් උනන්දුවෙන් හා සක්‍රිය ව දායක වූ සැකසුම් කමිටු සාමාජිකයන්ටත් වගකීමෙන් කටයුතු කළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හා කාර්ය මණ්ඩලයටත් මාගේ හෘදයංගම ස්තුතිය පළ කරමි.

බී. සනත් පූජිත
විභාග කොමසාරිස් ජනරාල්

2020.05.14
පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල.

| | | |
|---|---|---|
| **උපදේශකත්වය** | : | බී. සනත් පූජිත<br>විභාග කොමසාරිස් ජනරාල් |
| **මෙහෙයවීම හා සංවිධානය** | : | ගයාත්‍රි අබේගුණසේකර<br>විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන) |
| **සම්බන්ධීකරණය** | : | එස්. ප්‍රනවදාසන්<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>(පර්යේෂණ හා සංවර්ධන - පාසල් විභාග) |
| **විෂය සම්බන්ධීකරණය** | : | පී.ඩී.එන්.මැණිකේ<br>සහකාර විභාග කොමසාරිස් |
| **සංස්කරණය** | : | මහාචාර්ය රත්න විජේතුංග<br>පූජ්‍ය ආචාර්ය මොරකන්දේගොඩ අරියවංස හිමි<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>රුහුණු විශ්වවිද්‍යාලය<br><br>ශ්‍රීයානි අබේවික්‍රම<br>ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය I (විශ්‍රාමික) |
| **සැකසුම් කමිටුව** | : | ඊ.ආර්. නිමල් ප්‍රේමකුමාර<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (විශ්‍රාමික)<br>ජාතික අධ්‍යාපන ආයතනය<br><br>ධම්මික පරාක්‍රම<br>ගුරු සේවය I<br>ක/ විද්‍යාරත්න පිරිවෙන් විද්‍යායතනය, හොරණ<br><br>ආර්.කේ.ඒ.එල්. පද්මසිරි<br>ගුරු උපදේශක<br>කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය<br>කුලි/ නැගෙනහිර නක්කාවත්ත<br><br>වාසනා පයාගල<br>ගුරු සේවය I<br>නාලන්ද විද්‍යාලය<br>කොළඹ 10 |

| | | |
|---|---|---|
| **පරිගණක පිටපත සැකසුම** | : | ආර්.ඩී. ඉෂානි කෞශල්‍යා රුහුණුගේ<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු |
| **පිටකවරය නිර්මාණය** | : | ආර්.එම්. නිලුපුල් ෂෙහාන් යසරත්න<br>පරිගණක දත්ත සටහන් ක්‍රියාකරු |

# ඇතුළත පිටු


පිටු අංකය

**I කොටස**

1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

1.1 විෂය අභිමතාර්ථ 2

1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

1.2.1 විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 3
1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය 3
1.2.3 ප්‍රථමවරට පෙනී සිටි පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 4
1.2.4 ලකුණු ලබා ගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව 5

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය

1.3.1 I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය 6
1.3.2 I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය 6
1.3.3 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 7
1.3.4 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය 8
1.3.5 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය 8
1.3.6 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය 9

**II කොටස**

2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 12
2.1.2 I ප්‍රශ්නයෙහි ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 13

2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යූහය 37
2.2.2 II ප්‍රශ්න පත්‍රය - I කොටස 38
2.2.3 II ප්‍රශ්න පත්‍රයේ I කොටස සඳහා අපේක්ෂිත ලකුණු දීමේ පටිපාටිය 40
2.2.4 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස 41
2.2.5 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 42
2.2.6 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ (වර්ගීකරණය අනුව) 45
2.2.7 II ප්‍රශ්න පත්‍රයේ II කොටස හා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 47
2.2.8 II ප්‍රශ්න පත්‍රයේ II කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා 68

**III කොටස**

3. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා

3.1 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු 69
3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අදහස් හා යෝජනා 71

## I කොටස

### 1. විෂය අභිමතාර්ථ හා විෂය සාධනය පිළිබඳ තොරතුරු

#### 1.1 විෂයයෙහි අභිමතාර්ථ

- ලේඛන ව්‍යවහාරය පාදක කොට ගෙන මනා අවබෝධයෙන් යුතු ව ශ්‍රවණය, කථනය, පඨනය (කියවීම), ලිවීම යන චතුර්විධ භාෂා කුසලතා සංවර්ධනය කිරීම
- ලිඛිත ප්‍රකාශන නිරවුල් ව හා අවබෝධයෙන් යුතු ව ඉදිරිපත් කිරීම සඳහා නිවැරදි භාෂා කුසලතා වර්ධනය කිරීම
- ලේඛන ව්‍යවහාරය ආශ්‍රිත ව අක්ෂර, පද, වාක්‍ය හා අර්ථ භාවිතය පිළිබඳ පරිචයක් ඇති කිරීම
- කාලීන සමාජ පරිසරයේ පවත්නා වස්තු හා සිදුවීම් පිළිබඳ නිරවුල් අවබෝධය වර්ධනය කිරීම
- සංස්ලේෂණ හා විශ්ලේෂණ කුසලතා වර්ධනය කිරීම
- විවිධ මානව චර්යා හා ජීවන වෘත්තීන්ට අදාළ ව ප්‍රායෝගික ව භාෂාව භාවිත කිරීමේ කුසලතා වර්ධනය කිරීම
- සංස්කෘතික දායාද, සාම්ප්‍රදායික ආචාර ධර්ම, ජීවන දෘෂ්ටි, ආකල්ප හා ඇගයීම් පිළිබඳ කුසලතා සිංහල භාෂා සාහිත්‍යය පාදක කොටගෙන වර්ධනය කිරීම
- සාහිත්‍ය නිර්මාණ පරිශීලනය මගින් ලබා ගත් පරිචය හා අත්දැකීම් ආශ්‍රයෙන් සාහිත්‍ය රසඥතා වර්ධනය හා නිර්මාණකරණය සඳහා යොමු කිරීම

## 1.2 විෂය සාධනය පිළිබඳ සංඛ්‍යානමය තොරතුරු

### 1.2.1 විෂයය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

| මාධ්‍යය | පාසල් | පෞද්ගලික | එකතුව |
|---|---|---|---|
| සිංහල | 49877 | 13058 | 62935 |

වගුව 1

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය

| ශ්‍රේණිය | පාසල් අපේක්ෂකයන් | | පෞද්ගලික අපේක්ෂකයන් | | එකතුව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | සංඛ්‍යාව | ප්‍රතිශතය | සංඛ්‍යාව | ප්‍රතිශතය | | |
| A | 10273 | 20.60% | 1811 | 13.87% | 12084 | 19.20% |
| B | 15858 | 31.79% | 3154 | 24.15% | 19012 | 30.21% |
| C | 14332 | 28.73% | 4244 | 32.50% | 18576 | 29.52% |
| S | 7132 | 14.30% | 2863 | 21.93% | 9995 | 15.88% |
| F | 2282 | 4.58% | 986 | 7.55% | 3268 | 5.19% |
| එකතුව | **49877** | **100** | **13058** | **100** | **62935** | **100** |

වගුව 2

### 1.2.3 ප්‍රථම වරට පෙනී සිටි පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

| දිස්ත්‍රික්කය | පෙනී සිටි සංඛ්‍යාව | විශිෂ්ට සම්මාන සාමර්ථ්‍යය (A) ලැබූ | | අධි සම්මාන සාමර්ථ්‍යය (B) ලැබූ | | සම්මාන සාමර්ථ්‍යය (C) ලැබූ | | සාමාන්‍ය සාමර්ථ්‍යය (S) ලැබූ | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| 1. කොළඹ | 2538 | 306 | 12.06 | 660 | 26.00 | 859 | 33.85 | 539 | 21.24 | 2364 | 93.14 | 174 | 6.86 |
| 2. ගම්පහ | 3775 | 671 | 17.77 | 1090 | 28.87 | 1211 | 32.08 | 602 | 15.95 | 3574 | 94.68 | 201 | 5.32 |
| 3. කළුතර | 2473 | 532 | 21.51 | 702 | 28.39 | 662 | 26.77 | 410 | 16.58 | 2306 | 93.25 | 167 | 6.75 |
| 4. මහනුවර | 3224 | 650 | 20.16 | 898 | 27.85 | 925 | 28.69 | 603 | 18.70 | 3076 | 95.41 | 148 | 4.59 |
| 5. මාතලේ | 1134 | 201 | 17.72 | 344 | 30.34 | 348 | 30.69 | 197 | 17.37 | 1090 | 96.12 | 44 | 3.88 |
| 6. නුවරඑළිය | 972 | 92 | 9.47 | 308 | 31.69 | 366 | 37.65 | 168 | 17.28 | 934 | 96.09 | 38 | 3.91 |
| 7. ගාල්ල | 3095 | 629 | 20.32 | 920 | 29.73 | 801 | 25.88 | 511 | 16.51 | 2861 | 92.44 | 234 | 7.56 |
| 8. මාතර | 2230 | 441 | 19.78 | 687 | 30.81 | 595 | 26.68 | 340 | 15.25 | 2063 | 92.51 | 167 | 7.49 |
| 9. හම්බන්තොට | 1584 | 297 | 18.75 | 533 | 33.65 | 410 | 25.88 | 233 | 14.71 | 1473 | 92.99 | 111 | 7.01 |
| 10. යාපනය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 11. කිලිනොච්චි | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 12. මන්නාරම | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 13. වව්නියාව | 71 | 2 | 2.82 | 21 | 29.58 | 26 | 36.62 | 19 | 26.76 | 68 | 95.77 | 3 | 4.23 |
| 14. මුලතිව් | 5 | 0 | 0 | 2 | 40.00 | 2 | 40.00 | 1 | 20.00 | 5 | 100.00 | 0 | 0 |
| 15. මඩකලපුව | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| 16. අම්පාර | 887 | 177 | 19.95 | 261 | 29.43 | 243 | 27.40 | 145 | 16.35 | 826 | 93.12 | 61 | 6.88 |
| 17. ත්‍රිකුණාමලය | 226 | 28 | 12.39 | 68 | 30.09 | 77 | 34.07 | 40 | 17.70 | 213 | 94.25 | 13 | 5.75 |
| 18. කුරුණෑගල | 3792 | 736 | 19.41 | 1226 | 32.33 | 1127 | 29.72 | 557 | 14.69 | 3646 | 96.15 | 146 | 3.85 |
| 19. පුත්තලම | 1472 | 275 | 18.68 | 471 | 32.00 | 429 | 29.14 | 229 | 15.56 | 1404 | 95.38 | 68 | 4.62 |
| 20. අනුරාධපුරය | 2241 | 496 | 22.13 | 628 | 28.02 | 610 | 27.22 | 340 | 15.17 | 2074 | 92.55 | 167 | 7.45 |
| 21. පොළොන්නරුව | 888 | 153 | 17.23 | 263 | 29.62 | 282 | 31.76 | 157 | 17.68 | 855 | 96.28 | 33 | 3.72 |
| 22. බදුල්ල | 1887 | 366 | 19.40 | 580 | 30.74 | 589 | 31.21 | 287 | 15.21 | 1822 | 96.56 | 65 | 3.44 |
| 23. මොනරාගල | 1156 | 196 | 16.96 | 357 | 30.88 | 365 | 31.57 | 188 | 16.26 | 1106 | 95.67 | 50 | 4.33 |
| 24. රත්නපුරය | 2462 | 595 | 24.17 | 743 | 30.18 | 668 | 27.13 | 349 | 14.18 | 2355 | 95.65 | 107 | 4.35 |
| 25. කෑගල්ල | 2274 | 417 | 18.34 | 650 | 28.58 | 706 | 31.05 | 392 | 17.24 | 2165 | 95.21 | 109 | 4.79 |
| **සමස්ත දිවයින** | 38386 | 7260 | 18.91 | 11412 | 29.72 | 11301 | 29.44 | 6307 | 16.43 | 36280 | 94.51 | 2106 | 5.48 |

වගුව 03

1.2.4 ලකුණු ලබා ගෙන ඇති ආකාරය - පන්ති ප්‍රාන්තර අනුව


| පන්ති ප්‍රාන්තරය | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91-100 | 2 | 0.00 | 62935 | 100.00 |
| 81-90 | 1079 | 1.71 | 62933 | 100.00 |
| 71-80 | 13538 | 21.51 | 61854 | 98.28 |
| 61-70 | 19545 | 31.06 | 48316 | 76.77 |
| 51-60 | 14275 | 22.68 | 28771 | 45.72 |
| 41-50 | 8331 | 13.24 | 14496 | 23.03 |
| **31-40** | **4137** | **6.57** | **6165** | **9.80** |
| 21-30 | 1661 | 2.64 | 2028 | 3.22 |
| 11-20 | 258 | 0.41 | 367 | 0.58 |
| 01-10 | 108 | 0.17 | 109 | 0.17 |
| 00-00 | 1 | 0.00 | 1 | 0.00 |

වගුව 4

මෙම විෂයය සඳහා 31 - 40 ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් සංඛ්‍යාව 4137 කි. එය ප්‍රතිශතයක් වශයෙන් 6.57%කි. ලකුණු 40 හෝ ඊට අඩුවෙන් ලබා ඇති අපේක්ෂකයන් සංඛ්‍යාව 6165ක් වන අතර, එය ප්‍රතිශතයක් වශයෙන් 9.8%කි.

1.3 විෂය සාධනය පිළිබඳ විශ්ලේෂණය.

1.3.1 I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය





මෙම ප්‍රස්තාරයෙන් I පත්‍රයේ එක් එක් ප්‍රශ්න තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශත දක්වා ඇත. තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- මෙහි I ප්‍රශ්නය අනිවාර්ය වන අතර අපේක්ෂකයන්ගෙන් 99%ක් ඊට පිළිතුරු සපයා තිබිණි. අංක 2 සිට 8 දක්වා ප්‍රශ්නවලින් හතරක් තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ය. අපේක්ෂකයන්ගෙන් අඩු ම ප්‍රතිශතයක් තෝරා ගෙන ඇත්තේ 4 වන ප්‍රශ්නය වන අතර එය තෝරා ගෙන ඇත්තේ 24%ක් පමණි.

ප්‍රස්තාරය 1 (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

1.3.2. I ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය





ප්‍රස්තාරය 3 (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

මෙම ප්‍රස්තාරයෙන් I පත්‍රයේ ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගත් ආකාරය දක්වා ඇත. ප්‍රශ්න අංක 01 සඳහා ලකුණු 40ක් ද අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 15 බැගින් ද වෙන් කර ඇත. මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා: මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 40කි. එම ලකුණුවලින් 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 31 - 40 තෙක් ලබා ගත් ප්‍රතිශතය 14%කි. 51% - 75% ප්‍රාන්තරයේ එනම් ලකුණු 21-30 තෙක් ලබා ගත් ප්‍රතිශතය 54කි. 26% - 50% ප්‍රාන්තරයේ එනම් ලකුණු 11-20 තෙක් ලබා ගත් ප්‍රතිශතය 29%කි. එමෙන් ම වෙන් කර ඇති ලකුණු 0% - 25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 00 - 10 තෙක් ලබා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 4%කි.


### 1.3.3 I ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය




ප්‍රස්තාරය 3 (RD/16/04/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

මෙහි ඉහළ ම පහසුතා දර්ශකය දක්වා ඇත්තේ පළමු ප්‍රශ්නයේ (ඉ) කොටසෙහි (i) අනුකොටසට ය. එය 0.93කි. එයින් අදහස් වන්නේ අපේක්ෂයන්ගෙන් 93%ක් එම ප්‍රශ්නයට සාර්ථක ව පිළිතුරු සපයා ඇති බවයි. එනම් එහි පහසුතාව 93%කි. 0.08ක අවම පහසුතා දර්ශකය ඇත්තේ (උ) කොටසෙහි (ii) අනු කොටසට ය. එහි පහසුතාව 8%කි. එයින් අදහස් වන්නේ අපේක්ෂකයන්ගෙන් 8%ක සුළු පිරිසකට පමණක් මෙම ප්‍රශ්නයට සාර්ථක පිළිතුරු සැපයිය හැකි වුව ද අපේක්ෂකයන්ගෙන් 92%ක පිරිසකට එම ප්‍රශ්නයට සාර්ථක පිළිතුරු සැපයීමට නොහැකි වූ බවයි.

### 1.3.4 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න තෝරා ගෙන ඇති ආකාරය





ප්‍රස්තාරය 4 (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

මෙම ප්‍රස්තාරයෙන් II පත්‍රයේ එක් එක් ප්‍රශ්න තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශත දක්වා ඇත. තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- 1, 2 හා 3 ප්‍රශ්න අනිවාර්ය වේ. නමුත් එම ප්‍රශ්න සඳහා පිළිතුරු සපයා ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 97% බැගිනි. ප්‍රශ්න අංක 4 සිට 8 දක්වා ප්‍රශ්නවලින් දෙකක් තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ය. ඒ අනුව 78% ක් වූ වැඩි ප්‍රතිශතයක් 8 ප්‍රශ්නය ද 4%ක් වූ අවම ප්‍රතිශතයක් 7 ප්‍රශ්නය ද තෝරා ගෙන ඇත.

### 1.3.5 II ප්‍රශ්න පත්‍රයෙහි ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගෙන ඇති ආකාරය





ප්‍රස්තාරය 5 (RD/16/02/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

මෙම ප්‍රස්තාරයෙන් II පත්‍රයේ ප්‍රශ්න සඳහා ලකුණු ලබා ගත් ආකාරය දක්වා ඇත. ප්‍රශ්න අංක 01 සඳහා ලකුණු 20ක් ද 2,3 ප්‍රශ්න සඳහා ලකුණු 25 බැගින් ද, 4,5,6,7,8 ප්‍රශ්න සඳහා ලකුණු 15 බැගින් ද වෙන් කර ඇත. මෙම ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා: මෙහි 1 ප්‍රශ්නය සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණය 20කි. එම ලකුණුවලින් 76% - 100% ප්‍රාන්තරයේ එනම් ලකුණු 16 - 20 තෙක් ලබා ගත් ප්‍රතිශතය 11%කි. 51% - 75% ප්‍රාන්තරයේ එනම් ලකුණු 11-15 තෙක් ලබාගත් ප්‍රතිශතය 46කි. 26% - 50% ප්‍රාන්තරයේ එනම් ලකුණු 6-10 තෙක් ලබා ගත් ප්‍රතිශතය 37%කි. එමෙන් ම වෙන් කර ඇති ලකුණුවලින් 0% - 25% ප්‍රාන්තරයේ එනම් ලකුණු 00 - 05 තෙක් ලබා ගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 6%කි.

### 1.3.6 II ප්‍රශ්න පත්‍රය සඳහා සාධනය

**අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2017**
**71 - සිංහල - II පත්‍රය**
**I කොටසේ ප්‍රශ්නවල පහසුතා දර්ශක**




ප්‍රස්තාරය 6 (RD/16/05/AL) පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)


ඉහත ප්‍රස්තාරයෙන් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- I කොටසෙහි 1.5 වන ප්‍රශ්නයෙහි පහසුතා දර්ශකය 0.98කි. එයින් අදහස් වන්නේ අපේක්ෂයන්ගෙන් 98%ක් එම ප්‍රශ්නයට නිවැරදි පිළිතුරු සපයා ඇති බව ය. එනම් එහි පහසුතාව 98% කි. අවම පහසුතාව 1.4 ප්‍රශ්නය සඳහා දක්වා ඇත. එහි පහසුතා දර්ශකය 0.16ක් වන අතර එයින් අදහස් වන්නේ අපේක්ෂකයන්ගෙන් 16%ක පිරිසක් එම ප්‍රශ්නයට නිවැරදි පිළිතුර සපයා ඇති නමුත් 84%ක පිරිසක් නිවැරදි පිළිතුරු සැපයීමට අසමත් වී ඇති බවයි.

**අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2017**


**71 - සිංහල - II පත්‍රය**

**II කොටසේ ප්‍රශ්නවල පහසුතා දර්ශක**




ප්‍රස්තාරය 7.1 (RD/16/05/AL පෝරමයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

II කොටසේ 2-8 දක්වා ප්‍රශ්නවල පහසුතා දර්ශක දැක්වෙන ප්‍රස්තාර පිටු අංක 9,10 හි දක්වා ඇත.




ප්‍රස්තාරය **7.2** (RD/16/05/AL පෝරමයෙන් ලබා ගත් තොරතුරු ඇසුරෙන් සකස් කරන ලදි.)

පිටු අංක 10 හා 11 ප්‍රස්තාර ඇසුරින් තොරතුරු ලබා ගන්නා ආකාරය පහත සඳහන් උදාහරණයෙන් පෙන්වා දී ඇත.

උදා:- 2 ප්‍රශ්නයෙහි (ii) අනුකොටසෙහි 0.98ක වැඩිම පහසුතා දර්ශකය දක්වා ඇත. එයින් අදහස් වන්නේ අපේක්ෂකයන්ගෙන් 98%ක් එම ප්‍රශ්නයට සාර්ථක පිළිතුරු සපයා ඇති බව ය. එනම් එහි පහසුතාව 98%කි. 3 වන ප්‍රශ්නයේ iv හා v කොටස් 0.01ක අඩු ම පහසුතා දර්ශක දක්වා ඇත. එයින් අදහස් වන්නේ අපේක්ෂකයන්ගෙන් 1%ක ඉතා සුළු පිරිසකට පමණක් එම කොටස්වලට සාර්ථක ව පිළිතුරු සැපයිය හැකි වුව ද 99% ක් පිරිසකට එම කොටස්වලට සාර්ථකව පිළිතුරු සැපයීමට නොහැකි වූ බවයි.

# II කොටස

## 2. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.1 I ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

#### 2.1.1 I ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

- ⋆ කාලය පැය 03කි.
- ⋆ ප්‍රශ්න අටකින් සමන්විත වේ. **පළමුවන** ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු අතර පිළිතුරු සඳහා වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගත යුතු වේ.
- ⋆ 1 ප්‍රශ්නය කොටස් **හයකින්** සමන්විත වේ. සියලු කොටස්වලට පිළිතුරු සැපයිය යුතු ය. අනෙක් ප්‍රශ්න **හත** අතුරෙන් අභිමත ප්‍රශ්න **හතරක්** තෝරා ගත යුතු වේ.

I පත්‍රය සඳහා මුළු ලකුණු

- ⋆ ප්‍රශ්න අංක 01 = ලකුණු 40
- ⋆ ප්‍රශ්න අංක 2 - 8 තෙක් ප්‍රශ්නයකට
- ⋆ ලකුණු 15 බැගින් ප්‍රශ්න 4 සඳහා ( 15 x 4) = ලකුණු 60

**2.1.2** I පත්‍රයෙහි ප්‍රශ්න සඳහා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා.

**01 ප්‍රශ්නය හා අපේක්ෂිත පිළිතුරු.**

**1.** (අ) පෙරාතු දවසක දී සිටාණෝ රජගෙට ගොසින් එන තෙනැත්තෝ එක් සාකුස් ඇති දනවු මිනිසකු කුම්මාසයන් පිරුණු කබලුපූවක් කන්නවුන් දැක සම්පත් මහත් වූවත් අදහස කුඩා හෙයින් ඒ කබලුපූවෙහි රුචියක් ඇතිව ගෙන තමන්ගේ ගෙට ගොසින් 'ඉදින් කබලුපූවක් කනු කැමැත්තෙමි කීම් නම් මා කැමති වූවා සේ ම බොහෝ දෙනත් කන්ට සිතා ගනිති. එසේ කලට මාගෙන් බොහෝ සාල් හා කිරි පැණි සකුරු ආදී වූ බොහෝ දෙයට අළුවි පෙනෙයි. කිසි කෙනකුන්ටත් නොකියම්'යි සම්පත් ඇති නියාව කාටත් නොහඟවන්නා සේ ම කබලුපූවට කළ ආලයත් සිටුදුවණියන් පමණකටත් නොහඟවති. නොහැඟවීමෙන් කල් යත් යත් කසායුස වත් කොට පිසූ කබලුපූ සේ පඬුවන් පැහැ ඇති විය. නොතර මාලුකඩෙක වැල් පැදලූ කලක් මෙන් ඇඟ නහරවැලුත් ඉපිළ ගියේ ය.

(i) සිටාණන්ට කබලුපූවෙහි රුචියක් ඇති වූයේ ඇයි?

(ii) සිටුතුමා කබලුපූවක් කනු කැමති බව කාහටවත් නො පැවසූයේ ඇයි?

(iii) කල්යාමේ දී සිටාණන්ගේ සිරුර කිනම් පැහැයක් ගත්තේ දැයි පහදා දෙන්න.

(iv) **"නොතර මාලුකඩෙක වැල් පැදලූ කලක් මෙන්"** යන්නෙහි අර්ථය පහදන්න. (ලකුණු 04 යි.)

(i) දනව්වැසි මිනිසෙකු කුම්මාසයන් පිරුණු කබලුවක් කන ආකාරය දකින්ට ලැබීම නිසා

(ii) එවිට බොහෝ දෙනෙකු කන්නට කැමති වන නිසාත් එසේ වුවහොත් තමාගෙන් බොහෝ සාල්, කිරි, පැණි, සකුරු ආදී දේ වියදම් වන නිසාත් ය.

(iii) කහ දියර වත් කොට පිසූ කබලුවක් ලෙස පාණ්ඩු පාට/ කහ පැහැ විය

(iv) ශක්තිමත් නොවූ පැරණි රෙදි කැබැල්ලක නූල් මතු වුවා සේ/ නූල් පැදී පෙනෙන්නා සේ/නූල් ඇද්දා සේ

(ආ) බෝධිසත්වයෝ ඒ චන්ද්‍ර කුමාරයනුත් කල් යවා නොඑන හෙයින් "එක්තරා අන්තරායෙක් විය යුතු ය'යි තුමූ එතනට ගොස් දෙදෙනා ම විලට බට පියවර සටහන් දැක "මේ විල රාක්ෂසයකු අධිගෘහිත විලක් වුව මැනවැ"යි සිතා කඩුව උරයේ එල්වා ගෙන දුන්න තගා දුනු මිට හීය ලා ගෙන සිටියාහු ය. දිය රකුසු බෝධිසත්වයන් දියට නොබස්නා දැක වල දඬු කපා ඇවිදිනා පුරුෂයකු මෙන් තමාගේ ස්වරූපය පාලා බෝධිසත්වයන්ට කියන්නේ "පින්වත් වූ පුරුෂය, තොපි මග ගමන් යාමෙන් මිරිකී ගියව, කුමක් හෙයින් මේ විලට බැස නා පියා පැන් බී නෙළුම්ල හා නෙළුම්දැලි කා මල් පැළඳ සැප සේ නො යවූ දැ"යි කිවූ ය.

(i) බෝධිසත්වයන් තම සොහොයුරන්ට වූ අනතුර දැනගත්තේ කෙසේ ද?

(ii) දියට නොබසින බෝධිසත්වයන් ඉදිරියෙහි දිය රකුසා කිනම් ස්වරූපයකින් පෙනී සිටියේ ද?

(iii) බෝධිසත්වයෝ විල අසල කිනම් ආකාරයකින් සිටියාහු ද? යන්න විස්තර කරන්න.

(iv) '**කල් යවා නොඑන හෙයින්**' හා '**මග ගමන් යාමෙන් මිරිකී ගියව**' යන පාඨවල අර්ථ ලියන්න. (ලකුණු 04 යි.)

(i) දෙදෙනා විලට බැස්සා වූ පියවර/ අඩි/ පා සටහන් දැක

(ii) කැලයේ ලී දඬු කපමින් ඇවිදිනා පුද්ගලයෙකු ලෙස

(iii) කඩුව උරහිසේ එල්ලා ගෙන දුන්න ඔසවා එහි මිටෙහි හීය තබාගෙන/ දුන්න මානා ගෙන

(iv) **කල් යවා නොඑන හෙයින්** - පැමිණීමට ප්‍රමාද වූ බැවින්, කල්ගත වීත් නොපැමිණි නිසා
**මග ගමන් යාමෙන් මිරිකී ගියව** - මාර්ගයේ ඇවිද යාමෙන් වෙහෙසට / පීඩාවට පත් වූයෙහි ය.

(ඉ) එතැන් පටන් කම්මාරතිස්සයෝ දානාදී වූ පින්කම් කෙරෙමිනි ආයු කෙළවර එයින් මිය අනුරාධපුර නුවර දුටුගැමුණු රජ්ජුරුවන්ට පුත් ව උපන්හ. ඔවුන් මව්කුසින් බිහිවීම හා සමග සියලු ලංකාද්වීපයෙහි එකපැහැර සුවඳ රත්හැල් වර්ෂ කළේ ය. යටත් පිරිසෙයින් උදුනෙහි තබන ලද තණසාල් ආදී බතුදු පෙරළී සුවඳ හැල්සාලේ බත් ම විය. තණ වරා ආදී වූ කටුසර පිරූ කොටුගුලු සුවඳ හැලින් පිරිණ. වී නැති සිස් කොටුගුලු ද එපරිද්දෙන් ම හැලින් පිරුණේ ය. උදක් ඔවුන් උපන් දවස මතු නොවෙයි. ඒ කුමාරයන්ට තුන්මසින් සත්මසින් නවමසින් කළ මනා ඒ ඒ මඟුල් දිනයෙහි ද බත් කැවීම්, කන්විදීම්, යුවරජ තැන් ලැබීම් ආදී වූ ඒ ඒ මඟුල් දිනයෙහි ද මුළු ලක්දිව එක පැහැර ඇල් වැසි වැස පිරී ගිය, තණ වරා ආදී වූ ශස්‍යජාතීහු ද පෙරළී ශාලි ජාති ම වූහ. මෙසේ ඒ රාජකුමාරයන් නොයෙක් ආශ්චර්ය ලොව පහළ කෙරෙමින් ශාලිබන්ධු ව උපන් හෙයින් ඔවුන්ට ශාලි කුමාර ය යි නම් තුබූහ.

(i) කම්මාරතිස්සට තමන් විසින් කරන ලද පුණ්‍යකර්මවල විපාක ලැබුණේ කෙසේ ද?

(ii) ඔහු මව්කුසින් බිහිවීමත් සමග සිදු වූ ආශ්චර්ය කුමක් ද?

(iii) රාජ කුමාරයා ශාලි කුමාර යැයි ප්‍රසිද්ධ වූයේ කවර හෙයින් ද?

(iv) '**කටුසර**' හා '**කොටුගුලු**' යන වචනවල අරුත් පහදන්න. (ලකුණු 04 යි.)

(i) දුටුගැමුණු රජුගේ පුතු වී ඉපදීමෙන්

(ii) සියලු ලංකාදීපයේ එක විටම (එක්වරම) සුවඳවත් රත්හැල් වර්ෂා වැස්සේය. අඩුම තරමින් ළිපෙහි ඉදෙමින් තිබුණු තණහාල් ආදී බත් ද වෙනස් වී සුවඳ ඇල් හාලේ බත් බවට පත් විය. තණ වරා ආදී කටුසර බෝග (හේන්වල හැදෙන උඳු, තල, මුං ආදී ධාන්‍ය) පිරවූ කෝෂ්ඨාගාර/අටු / කොටු ධාන්‍යාගාර ද සුවඳ ඇල් හාල්වලින් පිරුණි. වී නැති හිස් කෝෂ්ඨාගාර ද එලෙසින් ම ඇල්හාලින් පිරුණි. (ධාන්‍යාගාර, ධාන්‍යවලින් පිරීගිය යනුවෙන් තිබුණද පිළිගන්න)

(iii) ඇල් හාල්වලට සම්බන්ධයක් ඇතිව/ ඇල් හාල්වලට නෑදැයකු වී ඉපදුණු බැවිනි

(iv) කටුසර - හේන්වල වැවෙන ධාන්‍ය වර්ග / මෙනේරි ආදී ධාන්‍ය වර්ග / තණවරා ආදී ධාන්‍ය වර්ග
කොටුගුලු - කෝෂ්ඨාගාර / ධාන්‍යාගාර / අටු / කොටු / බිසි / ධාන්‍ය ගබඩා

(ඊ) මහත සසර සයුරෙහි කුමුටුව සරන
අනත සත නිවන් පුර ගෙන යන සිතින
සතත සොඳුරු බුදුකුරු ගුණ දම් පුරන
දියත පසිඳු නතිඳුන් දැක ගොස් සොබන

පව ර රුසිරු මහ සෑ සමග බෝ තුරු
නොහැ ර නැමැද බැති පෙම් සිතිනි විසිතුරු
වෙහෙ ර පුද පසඟ තුරු රැව් නොදෙන තුරු
මිතු ර තොසින් වැද සැදී සොඳුරු පහතුරු

(i) නාථ දෙවිඳු බුදුකුරු ගුණදම් පුරන්නේ කුමක් සඳහා ද?

(ii) 'සසර සයුරෙහි' යන්නෙහි කාව්‍යාලංකාරය නම් කරන්න.

(iii) ගිරවාට මහසෑය සහ බෝරුක නමදින්නට කීවේ කවර ආකාරයට ද?

(iv) '**පුද පසඟ තුරු රැව්**' යන්නෙහි අර්ථය ලියන්න. (ලකුණු 04 යි.)

(i) සංසාරයේ සරන අනන්ත සත්ත්වයා, නිවන් පුරවයට ගෙන යන සිතින්

(ii) රූපක / රූපකාලංකාරයකි/ ශබ්ද අලංකාර

(iii) භක්ති ප්‍රේමය සිතින් අත් නොහැර

(iv) පංච තූර්ය නාද පූජාව

(ළ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) **"නුවණැත්තවුන් විසින් ශීලවිශුද්ධිය කොට ගෙන තමතමන්ට පිහිට විය යුතු ය."**

(ii) **"සියලු වැව් පොකුණු හෝ කඳුරැලි ආදිය ප්‍රසන්න ජලයෙන් පිරී සිටිනේ ය."**

(iii) **"එසේ හෙයින් නැවත ගිහිගෙය විසිය නො හෙමි."**

(iv) **"ඕක පරෙස්සමෙන් තියාගන්න. හරි වටින දෙයක්."**

(v) **"යකෙක්, යකෙක්, මේ මූණමල් ගහේ යකෙක් ඉන්නවා."**

(vi) **"හාමු මං ගිහින් එන්නම්. හාල් තුනපහ ගන්ඩ කඩේ යන්ඩත් තියෙනවා"** (ලකුණු 08 යි.)

(i) සද්ධර්මරත්නාවලියේ පටාචාරා කථා වස්තුවෙන් උපුටාගත් පාඨයකි. තමාගේ ඥාතීන් අහිමිව දෙව්රමට පැමිණි සිටු දියණියන් උදෙසා පැවැත්වූ ධර්ම දේශනාව කෙළවර බුදුන් වහන්සේ විසින් පටාචාරාට මෙසේ දේශනා කරන ලදි.

(ii) පන්සිය පනස් ජාතක පොතේ ගණ්ඩතින්දු ජාතකයෙහි අන්තර්ගත පාඨයකි. රජු පිළිබඳ වූ රටවැසියන්ගේ ආකල්පය දැන පුරෝහිත ද සමග ආපසු නුවර බලා එන ගමනේ දී රාජ්‍ය පාලනය විවේචනය කරමින් දිය සුන් පොකුණෙහි සිටි මඬුවා විසින් පුරෝහිත බමුණාට මෙසේ පවසන ලදි.

(iii) සද්ධර්මාලංකාරයෙහි ආරඤ්ඤක අභය ස්ථවිර කථා වස්තුවෙහි ඇතුළත් පාඨයකි. අභය තෙරුන්ගේ උපස්ථානය අවසානයේ සුවපත් වන හරන්තික විසින් තමන් පැවිදි කරන්න යැයි ඉල්ලා සිටිමින් අභය තෙරුන්ට මෙසේ පවසන ලදි.

(iv) මළගිය ඇත්තෝ නවකතාවෙන් උපුටාගත් පාඨයකි. දෙවෙන්දොරා සං නොරිකෝගේ නිවසට ගිය අවස්ථාවේ දී ඇගේ පියා වන නකජිමා සං කඩදාසියක කැපූ මෝස්තරයක් ඔහුට තෑගි දුන්විට නොරිකෝ සං විසින් දෙවෙන්දොරා සංට මෙසේ පවසන ලදි.

(v) රත්නාවලී නාට්‍යයෙන් උපුටාගත් පාඨයකි. උදයන රජතුමා සහ විදූෂක ඇසමන් වැලේ මල් පිපී ඇත්දැයි බැලීම සඳහා යන අවස්ථාවේ මූණමල් ගසේ සිටි සැළලිහිණියාගේ හඬ ඇසී බියට පත්වන විදූෂක විසින් රජතුමාට පවසන ලදි.

(vi) අපේක්ෂා කෙටිකතාවෙන් උපුටාගත් පාඨයකි. අපේක්ෂාගේ විභාග ජයග්‍රහණය ගැන ඇගේ මව වන හාමිනාගෙන් අසා දැනගන්නා භාග්‍යාගේ මව අවසානයේ දී තමාගේත් ඔවුන්ගේ ජීවන පසුබිමෙහිත් ඇති දූරස්ථභාවය පිළිබඳ ව මෙනෙහි කරන මොහොතේ හාමිනා විසින් භාග්‍යාගේ මවට මෙසේ කියන ලදි.

(ළු) පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් කරන්න.

**අට වයස් නොදරුවා**
**හැට පිරුනු කලු සමින්**
**වැසුනු ඇටසැකිල්ලකි**

**එහෙත් ඔහු සිනා සෙයි**
**දත් පුරා සිනාසෙයි**
**කට පුරා සිනාසෙයි**

**ඇට පෙනෙන මුහුන මත**
**දෙකන තෙක් දිග් ගැහුනු**
**සිනාවෙන් ඔහු මුහුන**
**පුරුදු නැති සිත්තරෙකු**
**නොංචි කෝලමට කැපූ**
**සරිය වෙස් මුහුනකට**

වමත පොල් කටුවෙ සිට
කට ලඟට ගොස් වැටෙන
ලී කැබැල්ලකි සුරත

බට්ටෙක් මෙන් ඔරලෝසුවෙ
ගනන් බලා තුන් විඩයක්
උඩහට පහලට ගිය අත
හිස් පොල් කටුවේ
එකවර නැවතින

"පොඩි ළමයෝ
බත්
ඉවර ද කාලා"

පුදුමයෙන් මෙන් බලා මා දෙස
දෙකන තෙක් දික් සිනා පාලා
වීසිකොට පොල් කටුව කානුවේ
පිස දමයි අත ඉරුනු සරමේ (ලකුණු 16 යි.)

මෙම කවි පන්තියේ දී කවියා දරිද්‍රතාවෙන් පරිපීඩිත වූ සමාජ ස්තරයක ඛේදනීය යථාර්ථය ප්‍රතිනිර්මාණය කිරීම සිය අරමුණ බවට පත් කර ගෙන තිබේ. එම සමාජ යථාර්ථය මගින් පාඨකයා සංවේදී ලෙස අත්දැකීමට සහභාගි කරවා ගැනීමේ කාව්‍යමය පරිසරයක් නිර්මාණය වී තිබේ.

මෙහි අපට මුණගැසෙන අට වයස් දරුවාට තමා පෙළන සමාජ අසාධාරණය පිළිබඳ අවබෝධයක් නැත. එබැවින් ඔහු ලද පමණින් සතුටු වෙයි. ඔහු කට පුරා සිනාසෙයි. එමගින් දරුවාගේ අහිංසකබව පිළිබඳ දයාර්ද්‍ර හැඟීමක් පාඨකයා තුළ ජනිත වේ. මුළු කාව්‍ය පුරා විහිදී ඇත්තේ ආහාර, ඇඳුම්, වාසස්ථාන යන මූලික අවශ්‍යතා පවා සම්පූර්ණ නොවූ දරුවකුගේ කටුක ජීවන යථාර්ථයයි.

දරිද්‍රතාවෙන් පෙළෙන දරුවාගේ කායික ස්වරූපය චිත්ත රූපයකට නැගෙන පරිදි කවියා ධ්වනිථාර්ථවත්, සංක්ෂිප්ත භාෂාවක් උපයෝගි කර ගනියි.


'අට වයස් නොදරුවා
හැට පිරුනු කලු සමින්
වැසුනු ඇට සැකිල්ලකි' යනුවෙන් පැවසීමෙන් කවියා මවන වාක්චිත්‍රය ඔපවත් වීමට ඔහු යොදා ගන්නා රූපකාර්ථවත් භාෂාව බෙහෙවින් ඉවහල් වී ඇත.

' දිවා භෝජනය' යන මාතෘකාව උත්ප්‍රාසවත්ය - 'බත් ඉවරද කාලා' වැනි යෙදුම් මගින් ද කවියා සංවේදී බව මෙන් ම උත්ප්‍රාසය ද ධ්වනිත කරවයි.

නව්‍ය වූත්, ඖචිත්‍ය ගුණයෙන් සමන්විත වූත් උපමා රූපක භාවිත කරන කවියා එමගින් තේමාවට නොමඳ ආලෝකයක් ලබා ගන්නට සමත් වේ.

එසේ ම නිසඳැස් කාව්‍ය ආකෘතිය යොදා ගන්නා කවියා සංයමයකින් යුතු ව සහෘදයා බුද්ධිමය එළඹුමකින් සමාජ විෂමතා කෙරෙහි සවිඥානකත්වයට පත් කිරීමෙහි ලා උත්සුක වී ඇති ආකාරය දක්නට ලැබේ.


**1 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**





මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වන අතර ඒ සඳහා පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 98%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 40ක් හිමි වේ.

| | | |
|---|---|---|
| ඉන් ලකුණු 00 - 10 | ප්‍රාන්තරයේ | 4%ක් ද |
| ලකුණු 11 - 20 | ප්‍රාන්තරයේ | 29%ක් ද |
| ලකුණු 21 - 30 | ප්‍රාන්තරයේ | 53%ක් ද |
| ලකුණු 31 - 40 | ප්‍රාන්තරයේ | 14%ක් ද |

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 30ට වඩා ලබා ගත් පිරිස 14%ක් වන අතර 33%ක පිරිසක් ලබා ගෙන ඇත්තේ ලකුණු 21ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයේ කොටස් 6 තුළ ප්‍රශ්න අනුකොටස් 23ක් ඇතුළත් වේ. පහසුතාව 70% හෝ ඊට වැඩි අගයක් ගන්නා අනුකොටස් 8ක් වන අතර පහසුතාව 40% හෝ ඊට අඩුවෙන් ලබා ගත් ප්‍රශ්න අනුකොටස් සංඛ්‍යාව 11කි.

මෙම පත්‍රයේ පළමු වන ප්‍රශ්නය කොටස් හයකින් සමන්විත වේ. ඉන් අර්ථාවබෝධය සඳහා (අ), (ආ), (ඉ), (ඊ) යන කොටස් හතර ද අවස්ථා සම්බන්ධය සඳහා (උ) කොටස ද රසාස්වාදය සඳහා (ඌ) කොටස ද වෙන් කෙරේ.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ (අර්ථාවබෝධය)**

අර්ථාවබෝධය සඳහා ඇති කොටස් හතරෙහි සෑම කොටසක් ම අනුකොටස් හතරකින් යුක්ත වේ. එම ප්‍රශ්න තෝරා ගෙන ඇත්තේ නිර්දිෂ්ට ග්‍රන්ථවලිනි. මෙම කොටස් සඳහා පිළිතුරු සැපයීමේ දී තෝරා ගත් පදවලට ලිහිල් බසින් අරුත් දැක්වීමත් සංකීර්ණත්වයෙන් යුතු වාක්‍ය තුළින් යෝග්‍ය පිළිතුරු තෝරා ගැනීමත් කෙරෙහි අපේක්ෂකයන්ගේ ඉහළ පහසුතා මට්ටමක් විද්‍යමාන නො වේ. නමුත් නිර්දිෂ්ට ඡේදය ඇසුරෙන් ඍජු ව ම අසා ඇති ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු සතුටුදායක ය.
මෙහි (ආ) කොටස හැරුණු විට (අ), (ඉ), (ඊ) කොටස්වල (iv) අනුකොටසට අනුව පැහැදිලි වන්නේ පරිකථා ලිවීම සම්බන්ධයෙන් අපේක්ෂකයන් සතුටුදායක මට්ටමක් නොපෙන්වන බව ය.
සංකීර්ණ වාක්‍ය අතුරෙන් යෝග්‍ය පිළිතුරු තෝරා ගැනීමේ දී අපේක්ෂකයන් දැඩි දුෂ්කරතාවකට මුහුණ දී ඇති බව (ඊ) කොටසේ (i), (ii), (iii) අනුකොටස්වලට ලබා ඇති පහසුතාවලින් ගම්‍ය වේ.

**නිගමන හා යෝජනා**

මේ අනුව සම්භාව්‍ය සාහිත්‍යයේ වචනවල අරුත් පැහැදිලි ව හා නිරවුල් ව තේරුම් ගැනීමටත්, සංකීර්ණ වාක්‍යයක ගැබ් වූ අදහස් උකහා ගැනීමටත් අපේක්ෂකයන්ගේ අවධානය යොමු කළ යුතු ය. දැනුම පාදක කොට ගෙන නොදන්නා තොරතුරු වටහා ගැනීමේ හැකියාව අපේක්ෂකයන් තුළ ඇති කළ යුතු ය. ගද්‍ය, පද්‍ය පාඨවල අර්ථාවබෝධය අපේක්ෂකයන්ට ලබා දිය යුතු ය. නිර්දිෂ්ට පැරණි කථා වස්තු උගන්වා අවසන්වන විට විචාර ප්‍රශ්න සාකච්ඡා කිරීමට අමතරව ඒ ඒ කථාවස්තුවෙන් තෝරා ගත් ඡේද යටතේ ප්‍රශ්න ඉදිරිපත් කර සිසුන්ට පිළිතුරු සැපයීමට අවස්ථාව ලබා දීම වැදගත්ය. සන්දේශ කාව්‍යයේ වර්ණනා අවසානයේ ද මෙම ක්‍රියාකාරකම සිදු කළ හැකි ය. එහි දී මෙවැනි ප්‍රශ්නවලට සාර්ථක ලෙස පිළිතුරු දීමේ හුරුවක් අපේක්ෂකයන්ට ලැබේ.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ (අවස්ථා සම්බන්ධය)**

(උ) කොටස යටතේ ඇති උද්ධෘත පාඨවල අවස්ථා සම්බන්ධය දැක්වීමේ දී පිළිවෙළින් අනුකොටස් (iii), (v), (vi) යන අනුකොටස් සඳහා පිළිතුරු සැපයීම තරමක සාර්ථක මට්ටමක පැවතිය ද (ii), (i), (iv), යන අනුකොටස් සඳහා පිළිතුරු ලිවීමේ දී අසාර්ථක බවක් පෙන්නුම් කොට ඇත. මෙයින් පැහැදිලි වනුයේ අපේක්ෂකයන් තුළ ස්මරණ ශක්තිය පහළ මට්ටමක පවතින බව ය.

**නිගමන හා යෝජනා**

පැරණි හා නූතන ග්‍රන්ථ පරිශීලනය කිරීමේ දී නිරවුල් අවබෝධයකින් යුක්ත ව කියවීමටත් කියවීම තුළින් මතක ශක්තිය වර්ධනය කර ගැනීමටත් හැකියාවක් අපේක්ෂකයන් තුළ ඇති කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. පාඩම් අවසානයේ දී නිර්දිෂ්ට නවකතා කෙටිකතා හා පුරාතන කථාවස්තුවලට අදාළ ව අවස්ථා සම්බන්ධය පාඨ කිහිපයක් අභ්‍යාස වශයෙන් දෛනිකව සිසුන්හට ලබා දී පිළිතුරු ලියන ආකාරය සාකච්ඡා කිරීම මෙහි දී වැදගත් වේ.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ (රසාස්වාදය)**

(උ) කොටස යටතේ රසාස්වාදය සඳහා අපේක්ෂකයන්ගේ පහසුතා මට්ටම සතුටුදායක තත්ත්වයක් දක්නට ඇත. මෙය නූතන පද්‍ය සාහිත්‍යයේ දක්නට ඇති සරල පද්‍ය පන්තියක් බැවින් අපේක්ෂකයන්ට පිළිතුරු සැපයීමට පහසුතාවක් ලැබී ඇත. එසේ නමුදු අඩු පහසුතා මට්ටම සහිත අපේක්ෂකයන් රසාස්වාදය කිරීම වෙනුවට පද්‍ය පන්තියේ එන අර්ථ විග්‍රහයක යෙදී තිබිණි. පද්‍ය පන්තියේ වස්තුවිෂය, කාව්‍යෝක්ති භාවිතය, කරුණු පැහැදිලි කිරීම සඳහා උචිත නිදසුන් පාඨ උපුටා දැක්වීම ආදී කාව්‍ය රසාස්වාදයේ දී භාවිතා කළ යුතු ශිල්පීය ක්‍රම පිළිබඳ ව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නැත.

**නිගමන හා යෝජනා**

කාව්‍ය රසාස්වාදයේ දී කාව්‍ය විචාර මූලධර්ම පිළිබඳ නිවැරදි ව හඳුනා ගත හැකි පරිදි අවබෝධයක් අපේක්ෂකයන්ට ලබා දීම වැදගත් වේ. කාව්‍යෝක්ති පිළිබඳ සැලකීමේ දී උපමා, රූපක, සංකේත, ආකෘතිය යනාදිය පිළිබඳ අවධානය යොමු කළ යුතු ය. රසාස්වාදය යනු කවි පෙළ ගැන කෙරෙන විස්තරයක් නොවන බවත් අපේක්ෂකයන් අවබෝධ කර ගත යුතු ය. පද්‍ය පන්තිය මගින් සහෘදයා තුළ දනවන (ධ්වනිත කරන) හැඟීම් රසාස්වාදයෙන් ඉස්මතු කර දැක්වීම අවශ්‍ය ය.

## 02 ප්‍රශ්නය

**2.** "කථාවස්තු ප්‍රබන්ධයේ දී සද්ධර්මරත්නාවලී කතුවරයා ධර්ම දේශනා ශෛලිය, උසස් ගද්‍ය රීතියකට සරිලන පරිදි සකසා ගත්තේ ය." නියමිත කථා වස්තු ඇසුරෙන් මේ අදහස විමසන්න. (ලකුණු 15 යි.)

**නැතහොත්**

ලේඛකයාගේ විවරණයට හසුවන කථාවස්තුවල චරිත විග්‍රහය සදාතනික අගයකින් යුක්ත වන ආකාරය නියමිත ජාතක කතා **දෙකක්** ඇසුරෙන් පහදන්න. (ලකුණු 15 යි.)

**සද්ධර්මරත්නාවලිය** දඹදෙණි යුගයේ දී රචනා වූ බණ කතා කෘතියක් වූ බැවින් එය ධර්ම දේශනා ශෛලියට අනුගත ව රචනා වී තිබේ. කථාවස්තු ආරම්භයේ දී මෙන් ම අවසානයේ දීත් උපදේශාත්මක අදහසක් ඉදිරිපත් කිරීම, හැකි සෑම අවස්ථාවකදී ම චරිත හා සිද්ධි ආශ්‍රයෙන් ශ්‍රාවකයාට යහපත් ජීවිතයකට අවශ්‍ය අවවාද හෝ උපදෙස් හෝ ලබාදීම යනාදිය මෙම කතාවල දැකිය හැකි ලක්ෂණයකි.
එසේ වුව ද කතුවරයා උගත්කමින් අඩු සාමාන්‍ය ජනයාට කතා කීමේ සිය අරමුණ සාක්ෂාත් කර ගැනීමට වඩා යෝග්‍ය වන නිර්මාණශීලී භාෂා රීතියක් ඒ සඳහා උපයෝගි කර ගත් ආකාරය දක්නට ලැබේ. එම රීතියෙහි කැපී පෙනෙන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- ශ්‍රාවකයාගේ සුබාවබෝධයට ඉවහල් වන සරල භාෂාවක් භාවිත කිරීම

  නිද :" සැවැත්නුවර සතළිස් කෙළක් විතර ........ මනහර රූ ධරති. " යනුවෙන් කෙරෙන පටාචාරා වර්ණනය.

- පොදු ජනවහරෙහි යෙදුම්වලින් පෝෂණය වීම
  නිද : පරමන්, පිසමන්, උපන්වනින්, උන්දැලා, දුප්පත්කම, වකගසාගෙන, බඩ දරුවනුත්, දරුවන් වදන්ට, බඩපුරාම

■ පවසන දෑ වඩාත් පැහැදිලි වීමටත්, රසවත් වීමටත් පොදු ජනයාට ප්‍රත්‍යක්ෂ, උපමා භාවිතය

නිද : රෑ දෙවරු වී පැහැරියා සේ
වසිනා වැසි බෝවා සේ
පිට පිට හෙළා විදුලිය ගසන්නා සේ
ගින්නකට දමා ලූ ලුණු මෙන්

■ ධර්මෝපදේශ හා බුද්ධ වර්ණනා සම්බන්ධ අවස්ථාවල දී දීර්ඝ වාක්‍ය ශෛලිය, තත්සම පද හා රූපකාලංකාර භාවිතය

නිද : ★ යම් කෙනෙක් රූ අරූ පස් කඳින් අවිද්‍යා ප්‍රත්‍යයේ රූ උපද්දී
★ තඹවන් නිය නැමැති කෙසුරෙන් හොබනා වූ සක් නැමැති පියුම්කෙමි ඇති බුදුන්ගේ පා පියුම්
★ මහණෙනි, කුල පහදන්නවුන් විසින් සැදැවටත්, භාගයටත් හානියක් නොකොට

■ අනුප්‍රාසවත් පද භාවිතය

නිද : නොකල් නොවේලා, ගැසී මැසී
කෙලි කොල්ලන්, දණ්ඩක් පතක්

■ චරිත හා අවස්ථාවලට අනුකූල කෙටි සංවාද යොදා ගැනීම

නිද : " තෙපි කා කුමක් කෙරේ ද "
" ඒ වැස්ස අනුන්ට වට වැස්සෙක් ද "


ඉහත කරුණු හැර පිළිතුර සඳහා යෝග්‍ය වන තවත් කරුණු ඉදිරිපත් කර තිබේ නම් ඒවා ද පිළිගැනීම සුදුසු ය.

**නැතහොත්**

ජාතක කතා රචකයා තම කථා වස්තුවල චරිත යොදා ගන්නේ ඒවාට සදාතනික අගයක් ආරෝපණය කරමිනි.

ඡද්දන්ත ජාතකයේ ඡද්දන්ත ඇතා, චුල්ල සුභද්‍ර ඇතින්න, සුභද්‍රා බිසව, බරණැස් රජ, වැදි පුත්‍රයා ගණ්ඩතින්දු ජාතකයේ පංචාල රජ සහ ඔහුගේ අමාත්‍යාදීන්, රාජ පුරුෂයන්, දනව් වැසි මිනිසුන්,සම්බුලා ජාතකයේ සම්බුලා බිසව හා සොත්ථිසේන රජු දේවධර්ම ජාතකයේ රජුගේ දෙවන බිසව, මහිංසාස කුමාරයා යන මේ චරිත ඇසුරෙන් ජාතක කතා රචකයා මනුෂ්‍යත්වය හා බැඳුණු සදාතනික හා සංකීර්ණ ගති ලක්ෂණ විග්‍රහ කරනුයේ ඒවාට සාර්වත්‍රික වටිනාකමක් හිමිකර දෙමිනි. ඉහත දැක්වූ කතා හා චරිත ඇසුරෙන් යෝග්‍ය ලෙස පිළිතුර සකසා තිබීම අපේක්ෂා කෙරේ.


**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**





මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 86%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 5%ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 16%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 49%ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 30%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 30%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 21%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




- ⋆ මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ගෙන් 82%ක බහුතරයක් සද්ධර්මාරත්නාවලිය ඇසුරෙන් සකස් වූ ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා ඇති අතර 5%ක සුළු පිරිසක් ජාතක කතා ඇසුරින් සකස් වූ ප්‍රශ්නයට පිළිතුරු සපයා ඇත.




* මෙම ප්‍රශ්නය විකල්ප ප්‍රශ්න දෙකකින් සමන්විත ය. ඉන් පළමුවන විකල්ප ප්‍රශ්නයෙහි පහසුතාව 64%ක් වන අතර දෙවන විකල්ප ප්‍රශ්නයෙහි පහසුතාව 55%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

මෙම ප්‍රශ්නය සම්භාව්‍ය ගද්‍ය සාහිත්‍යයට අයත් සද්ධර්මරත්නාවලියෙන් හා ජාතක කතා පොතෙන් සකස් වී ඇත. මෙහි පළමු විකල්ප ප්‍රශ්නයෙන් කතා වස්තු ප්‍රබන්ධයේ දී සද්ධර්මරත්නාවලී කතුවරයා ධර්ම දේශනා ශෛලිය උසස් ගද්‍ය රීතියකට සරිලන පරිදි සකසා ගත් ආකාරයත් දෙවන විකල්පයෙන් ලේඛකයාගේ විවරණයට හසු වන කතා වස්තුවල චරිත විග්‍රහය සදාතනික අගයකින් යුක්ත වන ආකාරයත් විමර්ශනය කෙරේ.

මෙහි පළමු විකල්ප ප්‍රශ්නය කෘතියේ ආකෘතිය හා සම්බන්ධ වන ආකාරයෙනුත් දෙවන විකල්ප ප්‍රශ්නය කෘතියේ අන්තර්ගතය හා සම්බන්ධ වන ආකාරයෙනුත් සකස් වී ඇත.

මෙම විකල්ප ප්‍රශ්න දෙක ම තෝරා ගත් ප්‍රතිශතය 86%ක් වැනි ඉහළ අගයක් ගනී. එයින් පළමු විකල්පයෙහි පහසුතාව 64% ක් වන අතර දෙවන විකල්පයෙහි පහසුතාව 55%ක් වන ඊට වඩා අඩු අගයක් ගෙන තිබේ.

**නිගමන හා යෝජනා**

සද්ධර්මරත්නාවලියේ නිර්දිෂ්ට වූ කතා දෙකකි. එහෙත් ජාතක කතා පොතෙන් කතා හතරක් නිර්දිෂ්ට වී ඇත. කතා හතරක් කියවා තේරුම් ගැනීමත් ඉන් කතා දෙකක් ඇසුරෙන් පිළිතුරු ලිවීමත් මගින් පෙනී යන්නේ පහසුතාව අතින් අපේක්ෂකයන්ට ගැටලු මතු වී ඇති බව යි. එහෙත් සද්ධර්මරත්නාවලියේ කතා දෙකක් පමණක් නිර්දිෂ්ට ව ඇති නිසා එමගින් අපේක්ෂකයන්ට වැඩි පහසුතාවක් ඇති විය.

සම්භාව්‍ය සාහිත්‍ය ඇසුරෙන් විමර්ශනය පාදක කොට ගත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී ප්‍රස්තුත කතා වස්තුව විස්තර කිරීම කෙරෙහි පමණක් ඇතැම් අපේක්ෂකයන්ගේ අවධානය යොමු වී ඇති බව පෙනේ. එයින් පැහැදිලි වන්නේ කිසියම් කෘතියක් කෙරෙහි විමර්ශනාත්මක කරුණු ඉදිරිපත් කිරීමට ඇති හැකියාව පහළ මට්ටමකින් පවතින බව යි.

සද්ධර්මරත්නාවලිය හා ජාතක කතා පොත ආශ්‍රයෙන් මතුකර ගත හැකි විචාරාත්මක කරුණු පාදක කර ගෙන රචිත ශාස්ත්‍රීය ලිපි ලේඛන අධ්‍යයනය කෙරෙහි අපේක්ෂකයන් යොමු කරවීම වඩාත් ප්‍රයෝජනවත් වෙයි. එසේ නිර්දිෂ්ට නොවන කෘතිවලින් ලබා ගන්නා දැනුම ද යොදා ගනිමින් නිර්දිෂ්ට කථාවලට අදාළ විචාර ප්‍රශ්න සඳහා පිළිතුරු ලිවීමට අපේක්ෂකයන් යොමු කළ යුතු ය. ඔවුනගේ පිළිතුරු ඇගයීම මගින් පිළිතුරු ලිවීමේ අඩුපාඩු පෙන්වා දීම වඩාත් ප්‍රයෝජනවත් වේ.

**3.** "සමාජයක මුල් බැස ඇති ආචීර්ණකල්පිත ආකල්ප කෙරෙහි සද්ධර්මාලංකාර කතුවරයාගේ දෘෂ්ටිය කිනම් ස්වරූපයකින් යුක්ත වී දැයි" නියමිත කථාවස්තු ආශ්‍රයෙන් විමර්ශනයක යෙදෙන්න. (ලකුණු 15 යි.)

සද්ධර්මාලංකාරය සාම්ප්‍රදායික බණ කතා කෘතියක් වුවද අතීත සමාජය තුළ මුල් බැසගෙන තිබූ ආචීර්ණ කල්පිත ආකල්ප කෙරෙහි කතුවරයා ප්‍රගතිශීලී දෘෂ්ටියක් පළ කළ ආකාරය දැකිය හැකිය. එයට නිදසුන් ලෙස පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

සාලිරාජ වස්තුව

- සාලියරාජ කුමාරයා අශෝකාමාලා නැමැති සැඩොල් තරුණිය විවාහ කර ගැනීම, පසුව දුටුගැමුණු රජු පවා ඇගේ රූපය හා යහපත් ගති ලක්‍ෂණ හමුවේ කුලවාදය ප්‍රතික්‍ෂේප කිරීම.


- වැදූ මවට චණ්ඩාල කෙල්ල යැයි එක වචන මාත්‍රයකින් බිණීම වැනි අකුසල කර්ම සුළුකොට තැකීමේ සමාජගත ආකල්පය නිෂේධනය වන ආකාරයෙන් කතා ඉදිරිපත් කිරීම.

ආරණ්‍යක අභය ස්ථවිර කතා වස්තුව

- සොරකම්කරන්නාට ඇඩි දඩුවම් පැමිණවිය යුතු බව උපාසකගේ ස්ථාවරය වේ. එහෙත් සත්පුරුෂයාට ද වඩා අසත්පුරුෂයනට මෛත්‍රී කිරීම උතුම් මිනිසුන්ගේ ලක්‍ෂණය විය යුතු බව අභය තෙරුන් උපාසකට පෙන්වා දෙනුයේ දුර්ගුණ ඇති මිනිසුන් සමාජයෙන් කොන් කිරීමේ ආචීර්ණ කල්පිත ආකල්පය ප්‍රතික්‍ෂේප කරමිනි.

- රාත්‍රී භාගයේ දී යක්‍ෂයකු ගමට පැමිණෙන බවට උපාසක කරන ප්‍රකාශය හමුවේ ආචීර්ණ කල්පිත ආකල්ප දරන හරන්තිකගේ සමීපතමයන් පවා පිහිට වීම ප්‍රතික්‍ෂේප කරන අවස්ථාවේ දී අභය තෙරුන් එම ආකල්පවලට එරෙහි ව කටයුතු කරමින් සොරාට පිහිට වීම.


**3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්‍ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 59%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 6%ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 17%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 52%ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 25%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 25%ක් වන අතර අපේක්‍ෂකයන්ගෙන් 23%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




★මෙම ප්‍රශ්නයේ පහසුතාව 61%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

මෙම ප්‍රශ්නය තුළින් අපේක්ෂා කරන්නේ සමාජයක මුල් බැස ඇති ආචීර්ණ කල්පිත ආකල්ප කෙරෙහි සද්ධර්මාලංකාර කතුවරයාගේ දෘෂ්ටිය කිනම් ස්වරූපයකින් යුක්ත දැයි විමර්ශනය කිරීමයි. මෙහි පහසුතාව 61%කි. ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 59%කි. ඉන් ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 25%ක් වැනි අඩු ප්‍රතිශතයකි. අපේක්ෂකයන්ගෙන් 23%ක් ම ලබා ගෙන ඇත්තේ ද ලකුණු 8ට අඩුවෙනි. ප්‍රශ්නයෙන් අපේක්ෂිත "සමාජයක මුල් බැස ඇති ආචීර්ණ කල්පිත ආකල්ප කෙරෙහි සද්ධර්මාලංකාර කතුවරයාගේ දෘෂ්ටිය කිනම් ස්වරූපයකින් යුක්ත දැයි" යන්න පිළිබඳ අපේක්ෂකයන් තුළ වූ අනවබෝධය පිළිතුර සාර්ථක නොවීමට හේතු වූ බව පෙනේ.

**නිගමන හා යෝජනා**

නියමිත කතාවස්තුව මතකයේ තබා ගැනීම පමණක් නොව කතුවරයා සමාජයේ විවිධ පැතිකඩ නිරූපණය කිරීමට දරන ලද උත්සාහය කවරේ ද යන්න පිළිබඳ අවබෝධය අපේක්ෂකයන් තුළ ඇති කළ යුතු ය. ඒ පිළිබඳ ගැඹුරින් අවධානය යොමු නො කළ නිසා සාර්ථක පිළිතුරු සැපයීමට පැවති අවස්ථාව අපේක්ෂකයන්ගෙන් ඈත් වී ගිය බවක් පෙනේ. එබැවින් ඒ පිළිබඳ ගුරුභවතුන් අවධානය යොමු කළ යුතු ව ඇත. එහිදී පාඩම කියවා එහි කතාව පැහැදිලි කර දීම, දුරවබෝධ වචනවලට අරුත් සැපයීම මෙන් ම කථාවස්තුව විවිධ පැතිවලින් විමර්ශනය කිරීම ද අවශ්‍ය වේ."ආචීර්ණ කල්පිත" වැනි යෙදුමක අරුත වටහා ගැනීමට නම් පංති කාමරය තුළ සිදුවන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අමතරව විවිධ පොත පත කියවා භාෂාවේ විවිධ ව්‍යාවහාර පිළිබඳ ව දැනුමක් ලබා ගැනිමට  සිසුන් යොමු කිරීම ද අවශ්‍ය වේ.

**04** ප්‍රශ්නය

**4.** **වර්ණනාවල විවිධත්වයට අනුරූප වන ලෙසට උචිත කාව්‍යෝක්ති නිර්මාණයෙහි ලා ගිරා සන්දේශ කතුවරයා, දක්වන සාමර්ථ්‍යය වර්ණනා *තුනක් වත්* ආශ්‍රය කොට ගෙන සාකච්ඡා කරන්න.** **(ලකුණු 15 යි.)**

කාව්‍යෝක්ති යනු කාව්‍ය රසය තීව්‍ර කිරීමට ඉවහල් වන විශේෂ අරුත් කැටි කොට ගත් යෙදුම් විශේෂයකි. දීර්ඝ සන්දේශ කාව්‍යයක් වන ගිරා සංදේශයේ වර්ණනා සමූහයක් ඇතුළත් වන අතර ඒවාට විවිධත්වයක් ලබා දීම සඳහා ඉවහල් වන කාව්‍යෝක්ති, වර්ණනා තුනක් ඇසුරෙන් විමසා බැලීම අපේක්ෂා කෙරේ.

මීට උචිත වර්ණනා සඳහා නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

- පුර වැනුම
  " පියකරු තෙනෙන් පැරදී පිවිසි වන විල "
  " කලා සපිරි සිසිවත මනකලාවන් "
  " රොදක් කන අලක මුතුපට ගොතා බැඳ "

- දියකෙළි වැනුම
  " කෙළනා ලිය පියොවුරු බිත ගැසෙමින "
  " කොමළඟනන් වුවනත් උඩුකුරු කොට "
  " සෙදනා ලොවිනා ළඳුනා ලෙසිනා "
- නිශා වැනුම
  " විදා සිනිඳු සුදුරැස් දිගු පිය පතර "
  " වියත උදුළ කිරණෙව් රළ පැහැ පැහැස "


- වන වැනුම
  " අතු අතිනැද ගසාය තුරු රැසාය "
  " ඉඳුනිල් කොළ තුරා එපැහැය පුරා යා "
  " නිති වැළලාගෙන තුරු හිමියනි "
  " නොමඳ රැසින් රැඳුණු අවට "
  " කරඳ කුසුම් දැක තුරු යට "

මේ හැර තොටගමු වෙහෙර වැනුම

උදා : සැඳෑ වැනුම් මෙන් ම මග වැනුමේ අදාළ වෙනත් කව්වලින් ද පිළිතුරට යෝග්‍ය නිදසුන් දැක්විය හැකි ය.

**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**


**4 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 24%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 7%ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 13%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 42%ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 38%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 38%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 20%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




- මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 62%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

ගිරා සන්දේශය ආශ්‍රයෙන් සකස් වී ඇති මෙම ප්‍රශ්නය මගින් උචිත කාව්‍යෝක්ති නිර්මාණයෙහි ලා ගිරා සන්දේශ කතුවරයා දක්වන ලද සාමර්ථ්‍යය පිළිබඳ වර්ණනා තුනක් ඇසුරෙන් විස්තර කිරීම පිළිතුරෙන් අපේක්ෂිත ය. මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමට ඉදිරිපත් වූ විභාග අපේක්ෂකයන් ප්‍රතිශතයක් ලෙස 24%කි. මෙයින් ගම්‍යමාන වන්නේ ඉතා අඩු අපේක්ෂකයන් ප්‍රමාණයක් මෙම ප්‍රශ්නය තෝරා ගැනීමට ඉදිරිපත් වී ඇති බව යි. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 38%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 20%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි

**නිගමන හා යෝජනා**

මෙම ප්‍රශ්නය සමස්තයක් ලෙස බැලූ විට පිළිතුරු සැපයීමට පහසු ප්‍රශ්නයක් වුව ද එය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 24%ක ප්‍රමාණයකි. ගිරා සන්දේශ කතුවරයාගේ වර්ණනා චාතුර්යය පිළිබඳ අපේක්ෂකයන්ගේ අවධානය යොමු කරවීමත් එම වර්ණනාවල විවිධත්වය කෙරෙහි අවබෝධයක් ඔවුන් තුළ ඇති කිරීමත් අවශ්‍ය බව මෙහි දී පැහැදිලි වේ.

**5 ප්‍රශ්නය**

**5.** **"සාර්ථක චරිත හා සිද්ධි නිරූපණය උදෙසා ජපානයේ පරිසරය හා සමාජ සංස්කෘතික පසුබිම කතුවරයාට ඉවහල් විය." 'මළ ගිය ඇත්තෝ' නවකතාව ඇසුරෙන් විභාග කරන්න.** (ලකුණු 15 යි.)

මළගිය ඇත්තෝ නවකතාවේ චරිත හා සිද්ධි නිරූපණයට ජපානයේ පරිසරය හා සමාජ සංස්කෘතික පසුබිම ඉවහල් වී ඇති ආකාරය පිළිබඳ කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

මෙහි දී සැලකිය යුතු කරුණක් නම් මෙම කෘතියෙන් නිරූපණය වන්නේ සමස්ත ජපන් සමාජය නොවන බවයි. ඉන් නිරූපණය වන්නේ ජපානයේ පහළ ජන සමාජයයි. එහෙත් එම ජන සමාජය තුළ දක්නට ඇති සමාජ සංස්කෘතික ලක්ෂණ කිහිපයක් ඇසුරෙන් චරිත හා සිද්ධි ගොඩ නැගෙන ආකාරය පිළිබඳ ව අවධානය යොමු කළ හැකි ය.

ඒ සඳහා ගත හැකි නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

- ★ යුද්ධය නිසා ජපන් සමාජයේ සිදු වූ බිඳවැටීම, නොරිකෝගේ පවුල පෙළෙන දිළිඳු බව සහ අනෙකුත් ජීවන ප්‍රශ්න විද්‍යමාන වීම.

- ★ ස්ත්‍රියට නිරන්තරයෙන් පිරිමියකු යටතේ දිවි ගෙවන්නට සිදු වී ඇති සමාජ පසුබිමක නොරිකෝ විවාහයෙන් සිය අනාගතය සුරක්ෂිත කර ගැනීමට කල්පනා කිරීම

- ★ අගන්තුක සත්කාරය ඇතුළු ජපන් සමාජයේ සුවිශේෂ ආචාරධර්ම මගින් නොරිකෝ සං හා දෙවෙන්දොරා සං අතර සමීප සම්බන්ධයක් ගොඩ නැගීම හා එය විවාහයකින් කෙළවර විය යුතු ය යන ස්ථාවරයට පැමිණීම
- ★ ජපන් කලාවත්, ආපන ශාලාත් නොරිකෝ සං හා දෙවෙන්දොරා සං අතර සමීප සම්බන්ධයක් ගොඩ නැගීමට ඉවහල් වීම


- ★ ජපන් පරිසර විචිත්‍රත්වයෙන් දෙවෙන්දොරා සංගේ සෞන්දර්යාත්මක හැඟුම් විකසිත වීම

- ★ මළවුන් පිදීම වැනි විශ්වාස මගින් සිය ජීවන ගැටලු සඳහා පිළියම් සෙවීමට නොරිකෝ සං පෙලඹීම

- ★ දෙවෙන්දොරා සං හා ඇසුරෙන් තමන් සමාජයේ ගර්හාවට ලක්වෙති'යි නොරිකෝ බියට පත් වීම

**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**


**5 ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 50%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 7%ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 21%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 52%ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 20%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 20%ක් වන අතර ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයන්ගෙන් 28%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




★ මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 57%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

පිළිතුරු ලිවීමට තෝරා ගත් විභාග අපේක්ෂකයන් ප්‍රතිශතයක් ලෙස 50%කි. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 20%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 28%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 08ට අඩුවෙනි. සාර්ථක චරිත හා සිද්ධි නිරූපණය උදෙසා ජපානයේ සමාජ හා සංස්කෘතික පසුබිම මළගිය ඇත්තෝ නවකතාව ඇසුරෙන් විස්තර කිරීමට කතුවරයාට හැකි වී ඇති අන්දම පිළිබඳ විමසා බැලීම මෙම ප්‍රශ්නයේ අරමුණ වී ඇත. මෙහි දී අපේක්ෂකයන් ජපන් සමාජය හා පරිසරය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගෙන උදාහරණ සහිත ව පිළිතුරු ඉදිරිපත් කළ යුතු ව තිබිණි. නමුත් මනා අවබෝධයකින් යුතු ව ප්‍රශ්නය හඳුනා ගෙන පිළිතුරු සැපයීමට අපේක්ෂකයන්ට හැකියාවක් නොතිබුණු බව ඔවුන් සැපයූ පිළිතුරුවලින් අනාවරණය වේ.

**නිගමන හා යෝජනා**

බොහෝ පිළිතුරුවල අඩංගු වී තිබුණේ මළගිය ඇත්තෝ නවකතාවේ නොරිකෝ හා දෙවොන්දරා සං ගේ කතාවයි. ප්‍රශ්නයට අදාළ පිළිතුරු සැපයීමේ දී අපේක්ෂකයන් ප්‍රශ්නය අවබෝධ කොට ගෙන ඊට අදාළ ව පිළිතුරු සැපයීමට අපොහොසත් වී ඇත. නවකතාව ඇසුරෙන් මතු කෙරෙන ජපන් සමාජයේ විවිධ පැතිකඩ පිළිබඳ මනා වැටහීමක් ලබා ගැනීමට අපොහොසත් වීම මෙයට හේතුව බව පෙනෙයි. නවකතා ගැඹුරින් අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාව මෙහි දී පැහැදිලි වේ. නවකතාව පරිශීලනය කිරීමේ දී ඉන් පිළිබිඹු වන ජපන් සමාජය හා ජපන් සංස්කෘතිය පිළිබඳ ව ද ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කිරීමට ගුරුභවතුන් ක්‍රියා කළ යුතු ය. ජපන් ජීවිතය, ජපන් සංස්කෘතිය සමග ඇඩි සේ බද්ධ වී ඇති හෙයින් නවකතාව තුළ සාර්ථක චරිත නිරූපණයට හා සිද්ධි නිරූපණයට ඉඩ හසර සැලසී ඇති අයුරු අවධාරණය කළ යුතු ය. ඒ සඳහා නිර්දිෂ්ට නවකතාව පාදක කර ගෙන විග්‍රහාත්මක ව විචාරයක් කිරීමට හැකිවන අයුරින් ශිෂ්‍යයන්ගේ දැනුම පුළුල් කිරීම සඳහා අවශ්‍ය මග පෙන්වීම් කළ යුතු ය.


## 6 ප්‍රශ්නය

**6.** **කුටුම්බ ජීවිතයෙහි සංකීර්ණ ස්වභාවය ප්‍රතිනිර්මාණයෙහි ලා නූතන කෙටිකතාකරුවන් උත්සුක වී ඇති ආකාරය නියමිත කෙටිකතා තුනක් වත් ආශ්‍රය කොට ගෙන සාකච්ඡා කරන්න.** (ලකුණු 15 යි.)

නූතන කෙටිකතා රචකයන් කුටුම්භ ජීවිතයෙහි සංකීර්ණත්වය ප්‍රතිනිර්මාණයට උත්සුක වී ඇති ආකාරයට නිර්දිෂ්ට කෙටිකතා සංග්‍රහයේ ඇතුළත් මුදියන්සේ මාමා, තාත්තා, සාක්කි තුනක්, අපේක්ෂා වැනි නිර්මාණ ආශ්‍රයෙන් පැහැදිලි කළ හැකිය.

ප්‍රදීපාගාරය යට, මාවතේ දරුවෝ, පුතාගේ ශිෂ්‍යත්වය, තමන්ගේ දරුවෝ, තාත්තාගේ මළගම වැනි කෙටිකතා මගින් ද ප්‍රශ්නයට අදාළ කරුණු ඉදිරිපත් කළ හැකිය.


**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 38%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

| | | | |
|---|---|---|---|
| ලකුණු | 00 - 03 | ප්‍රාන්තරයේ | 6%ක් ද |
| ලකුණු | 04 - 07 | ප්‍රාන්තරයේ | 17%ක් ද |
| ලකුණු | 08 - 11 | ප්‍රාන්තරයේ | 49%ක් ද |
| ලකුණු | 12 - 15 | ප්‍රාන්තරයේ | 28%ක් ද |

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 28%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 23%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




★ මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 61%කි.

### පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ

පිළිතුරු ලිවීමට තෝරා ගත් විභාග අපේක්ෂකයන් ප්‍රතිශතයක් ලෙස 38%කි. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 28%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 23%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි. කුටුම්බ ජීවිතයේ සංකීර්ණ ස්වභාවය හඳුනා ගෙන එය නිර්මාණාත්මක ව ඉදිරිපත් කර ඇති ආකාරය නිර්දේශිත කෙටිකතා ඇසුරෙන් නිරූපණය වන අයුරු විමසා බැලීම මෙම ප්‍රශ්නයේ අරමුණ වී තිබේ. ගෘහ ජීවිතයේ දී පුද්ගලයන් මුහුණ දෙන විවිධ ප්‍රශ්න, ගැටලු චිත්ත පීඩා ආදිය කෙටි කතාවල ඇතුළත් චරිත ආශ්‍රයෙන් හඳුනා ගෙන ඒවා නිදසුන් ලෙස ඉදිරිපත් කරමින් පිළිතුරු ලිවීම අපේක්ෂකයන් කළ යුතු ව තිබිණි. ප්‍රශ්නයට අනුව නිර්දිෂ්ට කෙටිකතාවල විග්‍රහ වන ගෘහ ජීවිතයේ සංකීර්ණතා මැනවින් හඳුනා ගෙන පිළිතුරු සැපයීමට බොහෝ අපේක්ෂකයන්ට හැකියාවක් නොතිබුණු බව ඔවුන් සැපයූ පිළිතුරුවලින් අනාවරණය විය.

### නිගමන හා යෝජනා

බොහෝ පිළිතුරුවල අන්තර්ගත වී තිබුණේ තෝරා ගත් කෙටිකතාවල එන චරිත හා චරිත ලක්ෂණයි. කුටුම්බ ජීවිතයේ සංකීර්ණතාව යන්න අවබෝධ කර ගැනීමට අපේක්ෂකයන් යොමු විය යුතු ය. කෙටි කතාවේ චරිත අනෙකුත් චරිත සමග පවත්වන අන්තර් සම්බන්ධතා හා එමගින් පැන නගින ගැටලු එම චරිත මුහුණ දෙන දුෂ්කරතා ආදිය කෙරෙහි අපේක්ෂකයන්ට වැටහීමක් නොතිබූ බව ප්‍රදර්ශනය වෙයි. එබැවින් කෙටිකතා කියවීමේ දී චරිත නිරූපණය කර ඇති ආකාරය පිළිබඳ විචාරශීලී මනසින් යුතු ව අධ්‍යයනය කිරීමේ අවශ්‍යතාව මෙහි දී පැහැදිලි වෙයි. එසේම එක් එක් කෙටිකතාව තුළ අන්තර්ගත ශිල්පීය ලක්ෂණ වෙන් වෙන් ව සිසුන් සමග සාකච්ඡා කිරීම අවශ්‍ය වේ. එම ලක්ෂණ සඳහා නිදසුන් ඉදිරිපත් කිරීම මගින් අපේක්ෂකයන් හට කෙටිකතාවේ විවිධ පැතිකඩ පිළිබඳ ව පැහැදිලි අවබෝධයක් අපේක්ෂකයන්ට ඇතිකර ගත හැකි ය.

## 07 ප්‍රශ්නය


**7.** පුද්ගල හා සමාජ අත්දැකීම් නිරූපණයෙහි ලා නූතන කවීන් ප්‍රකට කළ මානව හිතවාදී දෘෂ්ටිය නියමිත පද්‍ය පන්ති **තුනක් වත්** නිදසුන් කොට දක්වමින් පහදන්න. (ලකුණු 15 යි.)

නූතන කවියාගේ නිර්මාණ සඳහා බෙහෙවින් ම පාදක වී ඇත්තේ පුද්ගල හා සමාජමය අත්දැකීම් වන අතර මානව හිතවාදී දෘෂ්ටියකින් යුතුව මෙම අත්දැකීම් ප්‍රතිනිර්මාණය කිරීමට ඔවුන් යොමු වූ ආකාරය මෙහි දී විමසා බැලිය යුතු ය.

ඒ අනුව මිනිස් සිතේ ඇති වන අතෘප්තිකර ස්වරූපය, පාළුව, ආදරය, මාපිය දූදරු සෙනෙහස, ගුරු ගෞරවය, කුටුම්භ දිවියේ සෞන්දර්ය වැනි පෞද්ගලික අත්දැකීම් ද, සමාජ අසාධාරණය, දරිද්‍රතාව, සමාජ ක්‍රමයේ පරිවර්තනය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, බුද්ධිය හා භක්තිය අතර ඇති ගැටීම ආදි පෞද්ගලිකත්වය ඔස්සේ සමාජ විවරණයට තුඩු දෙන තේමා ද නූතන පද්‍ය තුළ දක්නට ලැබේ. නිර්දිෂ්ට පද්‍ය මගින් මෙම කරුණු ඉදිරිපත් වන ආකාරය යෝග්‍ය නිදසුන් සහිත ව පෙන්වා දීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

මෙහි පෞද්ගලික අත්දැකීම තේමා කරගත් පද්‍ය නිර්මාණ ලෙස හේරත්හාමි, රුව දැකීම, පිතෘත්වය, දියණියනි, පරිණාමා, ගුරු පියාණෙනි, අන්ධ කවියා වැනි නිර්මාණ ද, සමාජ අත්දැකීම විවරණය කරන පද්‍ය පන්ති ලෙස එතෙර ගිය පොඩි දුවට, ලීස්තර වැට, වලව්වට වැසි ඇවිත්, සුරා සොඬ සැමි වලප, කතරගම, හිඟන්නා, දිවා භෝජනය, පරලොවට පණිවිඩයක් ආදී නිර්මාණ ද පිළිතුරට අදාළ කර හැකිය.


**7** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 64%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

| | | | |
|---|---|---|---|
| ලකුණු | 00 - 03 | ප්‍රාන්තරයේ | 4%ක් ද |
| ලකුණු | 04 - 07 | ප්‍රාන්තරයේ | 12%ක් ද |
| ලකුණු | 08 - 11 | ප්‍රාන්තරයේ | 48%ක් ද |
| ලකුණු | 12 - 15 | ප්‍රාන්තරයේ | 36%ක් ද |

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 36%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 16%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




- ★ මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 66%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

පුද්ගල හා සමාජ අත්දැකීම් නිරූපණයෙහි ලා නූතන කවීන් ප්‍රකට කළ මානව හිතවාදී දෘෂ්ටිය විමසීම මෙම ප්‍රශ්නයේ අරමුණ වේ. මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 57%ක් වීම මගින් පැහැදිලි වන්නේ සාධන මට්ටම ද මධ්‍යස්ථ ස්වරූපයක් ගන්නා බව යි. මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 64%කි. ලකුණු 11 ට වඩා ලබා ගත් ප්‍රතිශතය 36%කි. අපේක්ෂකයන්ගෙන් 16%ක් ලබා ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි. ප්‍රශ්නයට අදාළ පද්‍ය නිර්මාණ හඳුනා ගෙන තිබුණ ද කවීන්ගෙන් ප්‍රකට වන මානව හිතවාදී ගුණය හඳුනා ගැනීමේ දුෂ්කරතාවක් තිබූ බව පැහැදිලි වේ.

**නිගමන හා යෝජනා**

පුද්ගල හා සමාජ අත්දැකීම් නිරූපණයේ දී මානව හිතවාදී බව ප්‍රකට වන අයුරු විමර්ශනය කිරීම මෙම ප්‍රශ්නයේ අරමුණ වූවත් මානව හිතවාදී බව කෙරෙහි අපේක්ෂකයන්ගේ අවධානය යොමු වී නැති බව පෙනේ. පද්‍ය පන්ති තුනක් ඇසුරෙන් පිළිතුරු සැපයීමට අවස්ථාව ලබා දීමෙන් අපේක්ෂකයන්ට ඒ සඳහා පුළුල් අවකාශයක් සපයා තිබුණි. පද්‍ය පන්තියක් නිර්මාණය කිරීමේ දී කවියාගේ තේමාව මෙන් ම කවියාගේ දෘෂ්ටිය ද අපේක්ෂකයාට හඳුනා ගැනීමට අවස්ථාව සලසා දිය යුතු ය. එබැවින් පද්‍ය රසාස්වාදයේ දී එක් එක් කවි පන්තියේ දක්නට ඇති කාව්‍යමය උපක්‍රම උදාහරණ සහිත ව සටහන් කර ගැනීමට සිසුන්ට මග පෙන්විය යුතු ය. ඒ සමග ම එම කාව්‍ය නිර්මාණවලින් ප්‍රකට කෙරෙන ජීවන දෘෂ්ටිය හඳුනා ගැනීමට අවශ්‍ය කරුණු සාකච්ඡා කිරීම ද වැදගත් ය.

**08 ප්‍රශ්නය**


**8.** නාට්‍යෝචිත අවස්ථා ගොඩනගමින් නාට්‍ය විකාශනයෙහි ලා උදයන රජුගේ චරිතය ඉවහල් වී ඇති ආකාරය රත්නාවලී නාට්‍ය පෙළ ඇසුරෙන් උදාහරණ සහිත ව සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

ප්‍රේක්ෂකයා කුතුහලයෙන් නාට්‍යය කෙරෙහි බැඳ තබා ගන්නා හෙවත් ආකර්ෂණය කර ගන්නා අවස්ථා නාට්‍යෝචිත අවස්ථා ලෙස දැක්විය හැකිය. රත්නාවලී නාට්‍ය ද විකාශනය කෙරෙන්නේ මෙම නාට්‍යෝචිත අවස්ථා ඔස්සේ ය. ඒ සඳහා උදයන රාජ චරිතය ඉවහල් වී ඇති ආකාරය විමසා බැලීම පිළිතුරෙන් අපේක්ෂා කෙරේ.

මෙහිදී උදයන රජුගේ චරිතය හා සම්බන්ධ පහත දැක්වෙන අවස්ථා කෙරෙහි අවධානය යොමු කිරීම අවශ්‍ය වේ.

- සාගරිකාගේත් සුසංගතාගේත් කතා බහ හෙළිදරව් කරන සැළලිහිණියාගේ සංවාදය පිළිබඳ ව අවධානය යොමු කරන රජතුමා සාගරිකා පිළිබඳ ව කුතුහලයෙන් යුක්ත වීම.
- සිතුවමෙහි ඇඳි සාගරිකාගේ රූපය දැක ඇයට පෙම් බැඳීම හා ඇය දැකීමට ප්‍රර්ථනා කිරීම
- සාගරිකා මුණ ගැසීමෙන් පසුව නිරායාසයෙන් ඇය හමුවීම පිළිබඳ ව සිතීම
- වෙස්වලා ගත් වාසවදත්තා බිසවට සාගරිකා යැයි රැවටී පෙම්බස් දෙඩීම
- අන්තඃපුර ගින්නෙන් සාගරිකා ගලවා ගැනීම හා වාසවදත්තාගේ ආශීර්වාදයෙන් ඇය තමා සතු කර ගැනීම


**8 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 39%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

| | | | |
|---|---|---|---|
| ලකුණු | 00 - 03 | ප්‍රාන්තරයේ | 8%ක් ද |
| ලකුණු | 04 - 07 | ප්‍රාන්තරයේ | 22%ක් ද |
| ලකුණු | 08 - 11 | ප්‍රාන්තරයේ | 49%ක් ද |
| ලකුණු | 12 - 15 | ප්‍රාන්තරයේ | 21%ක් ද |

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 21%ක් වන අතර, අපේක්ෂකයන්ගෙන් 30%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




- මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 55%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

රත්නාවලි නාට්‍ය ඇසුරෙන් සකස් වූ මෙම ප්‍රශ්නයෙන් අපේක්‍ෂා කළේ නාට්‍යෝචිත අවස්ථා ගොඩ නගමින් නාට්‍ය විකාශනයෙහි ලා උදයන රජුගේ චරිතය ඉවහල් වී ඇති ආකාරය නාට්‍ය පෙළ ඇසුරෙන් උදාහරණ සහිත ව පැහැදිලි කිරීම යි. මෙහි පහසුතාව 55%කි. මෙම ප්‍රශ්නය තෝරා ගත් ප්‍රතිශතය 39%කි. ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 21%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 30% ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.

ප්‍රශ්නයෙන් අපේක්ෂිත නාට්‍යෝචිත අවස්ථා ගොඩ නගමින් නාට්‍ය විකාශනයෙහි ලා උදයන රජුගේ චරිතය ඉවහල් වී ඇති අයුරු උදාහරණ සහිත ව මතු කර දැක්විය හැකි වුව ද ඒ පිළිබඳ ව ඇතැම් අපේක්ෂකයන් අවධානය යොමු කොට නොතිබූ හෙයින් ඉහළ සාධන මට්ටමක් වෙත ළඟා වීම දුෂ්කර වී ඇත. එසේ වුව ද ඇතැම් අපේක්ෂකයන් ප්‍රශ්නය මැනැවින් හඳුනා ගෙන පිළිතුරු සපයා තිබුණු ආකාරය අනාවරණය විය.


**නිගමන හා යෝජනා**

නාට්‍යයක දී ඒ ඒ චරිත විවිධ අවස්ථාවලට මුහුණ පාන ආකාරය විදහා දැක්වෙයි. රත්නාවලී නාට්‍යයේ එන උදයන රජුගේ චරිතය එවැනි ප්‍රධාන චරිතයකි. නාට්‍යයේ ප්‍රධාන නාට්‍යෝචිත අවස්ථා ගොඩ නැගී ඇත්තේ එම චරිතය තුළින් ය. එම චරිතය ප්‍රේක්ෂක අවධානයට ලක් වී ඇත්තේ ද ඒ නිසා ම ය. අපේක්ෂකයන් මෙම අංශය ගැඹුරින් විග්‍රහ කිරීමට දරන උත්සාහය එතරම් සාර්ථක නොවීමෙන් පෙනෙන්නේ ඒ පිළිබඳ ඔවුන් දැනුවත් ව නොසිටි බවයි.


සංස්කෘත ශෛලිගත නාට්‍ය ශිල්පීය ධර්ම ඇසුරෙන් රත්නාවලී නාට්‍ය නිර්මාණ වී ඇති බවත් එහි ප්‍රබලතාව ඉස්මතු වන්නේ නාට්‍යෝචිත අවස්ථා මත බවත් අපේක්ෂකයන්ට අවබෝධ කරවීම කෙරෙහි සැලකිලිමත් විය යුතු ය. නාට්‍ය පෙළ රස වින්දනයේ දී එහි එන උදයන රජුගේ චරිතය හා සෙසු චරිත විවිධ අවස්ථාවන්හි දී හැසිරෙන ආකාරය නාට්‍ය විකාශනයට කරන බලපෑම් පිළිබඳව ද අපේක්ෂකයන්ගේ අවධානය යොමු කළ යුතු ව ඇත.

ප්‍රශ්නයක් නිවැරදි ව අවබෝධ කරගනිමින් ඊට අදාළ ව උදාහරණ සහිත ව විමර්ශනශීලී ව කරුණු ඉදිරිපත් කරමින් පිළිතුරු ලිවීමට අපේක්ෂකයන් පෙලඹීම ද වැදගත් ය. එමෙන් ම සංස්කෘත නාට්‍ය ගැන ලියැවී ඇති ශාස්ත්‍රීය ලිපි ලේඛන අධ්‍යයනයේ ඇති වැදගත්කම පිළිබඳ අවබෝධය අපේක්ෂකයන් තුළ ඇති කළ යුතු ය.

## අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2017
## 71 - සිංහල
## I ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න සඳහා වර්ගීකරණය අනුව පහසුතාව



1 ප්‍රශ්නයේ අනුකොටස් 23 අතුරෙන් 30%කට වඩා අඩු පහසුතා ලබා ඇති අනුකොටස් 5ක් ම ඇත. අනුකොටස් 16ක් පැරණි ගද්‍ය පද්‍ය සාහිත්‍ය අවබෝධය ඇසුරෙන් සකස් වී ඇති අතර ඉන් 4ක ම පහසුතාව 40%ට අඩු ය. තව ද නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් අවස්ථා සම්බන්ධය විමසන අනුකොටස් 6ක් ඇති අතර එහි සමස්ත පහසුතාව 26%කි. 1හි (උ) කොටස රසාස්වාදය ඇසුරෙන් සකස් කර ඇත. එහි පහසුතාව 60%කි. ප්‍රශ්න අංක 2 සිට 8 දක්වා ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න 4ක් සම්භාව්‍ය සාහිත්‍ය ග්‍රන්ථ ඇසුරෙන් ද ඉතිරි ප්‍රශ්න 4 නූතන ගද්‍ය පද්‍ය සාහිත්‍ය ග්‍රන්ථ ඇසුරෙන් ද සැකසී ඇති අතර ඒවායේ පහසුතාව 61% ත් 63% ත් අතර වේ.




සමස්ත පහසුතාව සැලකීමේ දී 26%ක් වන අඩු ම පහසුතාව නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් අවස්ථා සම්බන්ධය විමසන ප්‍රශ්නවලට ලබා දුන් පිළිතුරුවලට ලැබී ඇත. රසාස්වාදය ප්‍රශ්නය සඳහා 60% පහසුතාවක් ලැබී ඇත. අඩු පහසුතා දක්වා ඇති විෂය ක්ෂේත්‍ර කෙරෙහි වැඩි අවධානයක් ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයේ දී යොමු කළ යුතු ය.

## 2.2 II ප්‍රශ්න පත්‍රය හා පිළිතුරු සැපයීම පිළිබඳ තොරතුරු

### 2.2.1 II ප්‍රශ්න පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03කි.

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **දෙකකින්** සමන්විත ය.

I කොටස - මෙම කොටසට වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 20කි. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 20කි.

II කොටස - අර්ධ ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න 7කි. 2 හා 3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න හතරකට පිළිතුරු සැපයිය යුතු ය.

| | | | |
|---|---|---|---|
| 2 හා 3 ප්‍රශ්න සඳහා (ලකුණු 25 බැගින්) | 25 x 2 | = | 50 |
| තෝරාගත් ප්‍රශ්න දෙක සඳහා (ලකුණු 15 බැගින්) | 15 x 2 | = | 30 |
| II කොටස සඳහා මුළු ලකුණු | 50 x 30 | = | 80 |

II පත්‍රය සඳහා මුළු ලකුණු

I කොටස = 20

II කොටස = 80

20 + 80 = 100

## 2.2.2. II ප්‍රශ්න පත්‍රය - I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. '**සන්ධ්‍යක්ෂර**' අන්තර්ගත වරණය තෝරන්න.
(1) අ, ඉ, උ, ඍ (2) ආ, ඊ, ඌ, ඒ, ඕ (3) ඛ, ඝ, ඥ, ඤ (4) ඒ, ඓ, ඕ, ඖ (5) ය, ර, ල, ව (……)

1.2. **නිවැරදි අක්ෂර වින්‍යාසය** සහිත පද පේළිය තෝරන්න.
(1) අරුණළු, කළණ, කාලගෝල, දැකුම්කලු, පිළිසරණ
(2) අරුණළු, කලණ, කාලගෝල, දැකුම්කළු, පිළිසරණ
(3) අරුණලු, කලණ, කාළගෝල, දැකුම්කලු, පිළිසරණ
(4) අරුණලු, කළණ, කාලගෝල, දැකුම්කළු, පිළිසරන
(5) අරුනළු, කලන, කාළගෝල, දැකුම්කලු, පිලිසරන (……)

1.3. **අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති** පද පේළිය තෝරන්න.
(1) ගුරුළුගෝමී, වෑත්තෑවේ, විද්‍යාචක්‍රවර්ති, ධර්මසේන
(2) බුද්ධපුත්‍ර, පැරකුම්බා, පරාක්‍රම පණ්ඩිත, අලගියවන්න
(3) මෛත්‍රේය, රාහුල, මිහිරිපැන්නේ, ගජමන් නෝනා
(4) සරණංකර, පත්තායමේ ලේකම්, ධම්මානන්ද, කවිශ්වර
(5) අනවමදර්ශී, කුමාරදාස, ධර්මාරාම, වෛදේහ (……)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් **නිරවද්‍ය ප්‍රකාශය** තෝරන්න.
(1) 'යංශය' යනු 'ය' යන්න වෙනුවට යෙදෙන අක්ෂර සංකේතයකි.
(2) 'යංශය' 'ර' කාරයෙන් පරව ද යෙදේ.
(3) 'යංශය'ට පෙර යෙදෙන ව්‍යඤ්ජනය හල් සලකුණ සහිත ව යෙදේ.
(4) අන්‍ය ව්‍යඤ්ජනවලට මෙන් හුදකලා යංශයට ද සියලු පිල්ලම් එක් කළ හැකි ය.
(5) අනුස්වාරයට පූර්වයෙන් යංශය භාවිත කළ හැකි ය. (……)

1.5. **රේඵය, රකාරාංශය, යංශය** හා **ගයනුකිත්ත** සහිත වචන **අනුපිළිවෙළින්** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) ඖචිත්‍ය, මහෞෂධ, සවණ්, උපක්‍රම (2) ප්‍රකෘති, ඓහලෞකික, සකර්මක, අමාත්‍යාංශය
(3) ගර්වය, සුප්‍රබුද්ධ, අව්‍යය, යෞවන (4) සාමුද්‍රික, භුගෘහ, ගෞරවාර්හ, ශල්‍යාගාරය
(5) ප්‍රහර්ෂ, මූර්ධජ, ඖත්සුක්‍යය, භෛෂජ්‍යචිකිත්සක (……)

1.6. එකිනෙකට **අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති** වරණය තෝරන්න.
(1) මාර්ග නීති, මෞලි මංගල්‍යය, රණවිරු උපහාර, සමාජ ප්‍රශ්න
(2) වෛද්‍ය විද්‍යාලය, පෙර අඹර, ප්‍රවාහණ අංශය, මගී ජනතාව
(3) පාසල් අධ්‍යාපනය, ලාංකික අනන්‍යතාව, සාහිත්‍ය මණ්ඩපය, සමූල ඝාතනය
(4) තෙමහල් මන්දිරය, වනවාසී නිකාය, මදුරු මර්දනය, මානව හිතවාදී
(5) මාතෘ උපහාර, ආචාර්ය මණ්ඩලය, ලක් දෙරණ, කිරිය අදියර (……)

1.7. **තත්සම වචන පමණක්** යෙදී ඇති වරණය කුමක් ද?
(1) පාලක, ඵල, පණ, ප්‍රදාන (2) ආකල්ප, විකල්ප, සංකල්ප, කල්ප
(3) ප්‍රමාණ, විමන, ශ්‍රමණ, සමාන (4) චන්දන, වන්දන, කැන්දන, වින්දන
(5) පරිසර, තිරසර, පරිවාර, සුකුමාර (……)

1.8. මුලින් දී ඇති පදයට **විරුද්ධාර්ථයක් නො දෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) සත්පුරුෂ - අසත්පුරුෂ, දුර්ජන, අසජ්ජන, අඥබාල
(2) උච්ච - පහත්, නීච, අධම, උසස්
(3) දැමුණු - අශාන්ත, නොදැමුණු, අසංවර, අදාන්ත
(4) දුර්ලභ - සුලභ, බහුල, අධික, බොහෝ
(5) විදග්ධ - අඥාන, මෝඩ, මූර්ඛ, අවිදග්ධ (……)

1.9. මුලින් දී ඇති පදයට **සමානාර්ථ පදයක්** ඇතුළත් **නො වන** වරණය තෝරන්න.
(1) ස්වර්ණ - රත්රන්, කනක, හේම, රුවන් (2) කූටය - මුදුන, අග්‍රය, කුළ, මස්තකය
(3) කුරුල්ලා - විහඟ, පක්ෂියා, ද්විජ, දද (4) මුහුද - ජලනිධි, සමුද්‍ර, අර්ණව, සිඳු
(5) ස්නේහ - පෙම්වත්, ආලවන්ත, ආදරණීය, ළෙන්ගතු (……)

1.10. **විශේෂණ පූර්ව පද, උපමාන පූර්ව පද, විශේෂණ අපර පද,** හා **උපමාන අපර පද** යන **විශේෂණ සමාස** පද **පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.
(1) පැරකුම්රජ, සුදුමල, සසරකතර, තිසරතන (2) තිසරතන, සසරකතර, සුදුමල, පැරකුම්රජ
(3) සුදුමල, පැරකුම්රජ, තිසරතන, සසරකතර (4) සුදුමල, තිසරතන, පැරකුම්රජ, සසරකතර
(5) සසරකතර, පැරකුම්රජ, තිසරතන, සුදුමල (……)

1.11. **කෘදන්තයක් නො වන පදයක් අන්තර්ගත** වරණය තෝරන්න.

(1) මැරූ, දැරූ, සෑරූ, වැරූ (2) පිසින, ඉසින, නසින, බසින
(3) වැස්ස, මැස්ස, බැස්ස, කැස්ස (4) පැවරීම්, ඇතිරීම්, මැතිරීම්, වැතිරීම්
(5) ඇල්ලූ, දැල්ලූ, සෙල්ලූ, ඉල්ලූ (......)

1.12. පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද **අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින්** දක්වා ඇති වරණය තෝරන්න.

(අ) "**කාලා** රසමුසු බෝජන කර පෙම්" (ආ) "**ගතිති** අය පඬුරු පෙර තියමින්"
(ඉ) "... ළෙල **දිදී** විදුලිය පබා" (ඊ) "ඔවා **දෙනු** පරහට"

(1) පූර්වක්‍රියා, මිශ්‍රක්‍රියා, ත්‍රෛකාලිකක්‍රියා, විධික්‍රියා (2) ත්‍රෛකාලිකක්‍රියා, මිශ්‍රක්‍රියා, විධික්‍රියා, පූර්වක්‍රියා
(3) මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා, ත්‍රෛකාලිකක්‍රියා, විධික්‍රියා (4) පූර්වක්‍රියා, ත්‍රෛකාලිකක්‍රියා, මිශ්‍රක්‍රියා, විධික්‍රියා,
(5) විධික්‍රියා, ත්‍රෛකාලිකක්‍රියා, මිශ්‍රක්‍රියා, පූර්වක්‍රියා (......)

1.13. **උක්ත පද දෙකක්** හා **අනුක්ත පද දෙකක්** අන්තර්ගත වරණය තෝරන්න.

(1) බැතිමතෙක්, ඇතින්නක, මිත්තණියන්, තෝ (2) තවුසකු, නීතීඥයකු, ගදඹෙක්, මඟීන්
(3) ඌරෝ, මීයෝ, බමුණෝ, බිරියන් (4) සතකු, තොප, සුරිඳු, සිඟන්නන්
(5) සොරකු, කොරකු, බිහිරකු, අන්ධයෙක් (......)

1.14. **උපසර්ගයක් යෙදී නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) අවවාද, අවජාත, අවගුණ, අවමාන (2) සම්භාෂණ, සන්තාප, සංවේදන, සම්මාන
(3) පිරිසිදු, පිරිපුන්, පිරිසිඳ, පිරිහුණු (4) සුසර, සුමුදු, සුසිනිඳු, සුරතුරු
(5) දුර්ගුණ, දුහද, දුසිරිත්, දුෂ්කර (......)

1.15. "ආලයෙන් වෙලි **සැදී** මෙ **ලතාමණ්ඩපයෙන් චණ්ඩාතප** ඛණ්ඩිත වේ හිරුරජිඳුගෙ" යන උද්ධෘතයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන් ඇති පද** අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) සන්ධි, කෘදන්ත හා සමාස (2) සමාස, කෘදන්ත හා සන්ධි
(3) කෘදන්ත, සන්ධි හා සමාස (4) සන්ධි, සමාස හා කෘදන්ත
(5) කෘදන්ත, සමාස හා සන්ධි (......)

1.16. **ව්‍යාකරණානුකූල ව නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?

(1) දේවාලය, හිමාලය, ජාත්‍යාලය, විද්‍යාලය
(2) ලට්ට-ලොට්ට, වං-හුං, ලවක්-දෙවක්, තක්කු-මුක්කු
(3) නවදොර, තුන්ලෝ, පස්පියුම්, දසදෙස
(4) ඖචිත්‍ය, කෞශල්‍ය, සෞඛ්‍ය, සෞන්දර්ය
(5) වැදිලි, විදිලි, බැඳිලි, සිඳිලි (......)

1.17. **සමාසයක් නො වන පදයක් ඇතුළත්** වරණය තෝරන්න.

(1) දිවිසයුර, සසරකතර, හදවිල, ජීවනකුසුම (2) නිහඬ, නිමල, නිපුණ, නිවරද
(3) නිල්දිය, සුදුහුණු, රතුපලස, කළුපැල්ලම (4) රජගෙදර, තාපසාරාමය, බිලුකුඩුව, ළමාසමිතිය
(5) තුන්දොස්, තෙමඟුල, අටලෝදහම, පසිඳුරන් (......)

1.18. **එක ම වර්ගයට අයත් සන්ධි පද** අන්තර්ගත වරණය තෝරන්න.

(1) කොළඟ, නුවනඟ, මුවඟ, හිරඟ (2) චූලෝදර, සහෝදර, පයෝධර, යශෝධර
(3) ගොක්කොළ, ලිබ්බොක්ක, අස්සන, කම්මල (4) සම්මන්ත්‍රණ, සානුනාසික, සානුකම්පික, සමලංකෘත
(5) ඇවුරුදු, ඇඟිලි, ඇස, ඇඟසව් (......)

1.19. ව්‍යාකරණානුකූල ව **නිවැරදි වැකිය** තෝරන්න.

(1) මේ පාසලෙහි ශිෂ්‍යයන් නැත.
(2) සියලු සිංහලයෝ බෞද්ධයෝ නො වෙති.
(3) මේ ගමෙහි දෙවි කෙනෙක් වැනි මිනිසෙක් වෙසෙයි.
(4) දරුවා ද මම ද මිනිස්සු ද ගමට යති.
(5) වලා පෙළ අහසේ පා වෙති. (......)

1.20. **වඩාත් ම නිවැරදි පද බෙදීම** සහිත වාක්‍යය තෝරන්න.

(1) ගුණවත්යැයි කියූ දරුවෝ දෙමාපියන් බැලීමටවත් නොපැමිණියහ.
(2) සුභාවිත ගීත කලාව වූ කලී රචනයේ ත් වාදනයේ ත් ගායනයේ ත් සුසංයෝග ය යි.
(3) විදුහල්පතිතුමාද විදුහල්පතිතුමියද දරුවන් ගේ අභිවෘද්ධි ය පිණිස වැඩ කරන්නා හ.
(4) ක්‍රීඩාභූමියේ දී දක්ෂතාව මෙන් ම සංයමය ද අතිශයින් වැදගත් ය.
(5) ගුණගරුකව ජීවත් වන්නෝ නිහඬ තාව අගය කරති. (......)

(ලකුණු 20 යි.)

## 2.2.3 II පත්‍රයේ I කොටස සඳහා අපේක්ෂිත ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 1.1 | 4 |
| 1.2 | 3 |
| 1.3 | 5 |
| 1.4 | 5 |
| 1.5 | 3 |
| 1.6 | 5 |
| 1.7 | 2 |
| 1.8 | 2 |
| 1.9 | 1 |
| 1. 10 | 4 |
| 1. 11 | 3 |
| 1. 12 | 4 |
| 1. 13 | 1 |
| 1. 14 | 4 |
| 1. 15 | 5 |
| 1. 16 | 1 |
| 1. 17 | 2 |
| 1. 18 | 5 |
| 1. 19 | 2 |
| 1. 20 | 4 |

* නිවැරදි එක් පිළිතුරකට ලකුණු 01 බැගින් මුළු ලකුණු **20** කි.

### 2.2.4 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති ආකාරය - ප්‍රතිශත ලෙස

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | Missing |
| 1.1 | 4 | 5.23 | 7.73 | 14.00 | **60.57** | 12.37 | 0.10 |
| 1. 2 | 3 | 14.27 | 30.63 | **30.17** | 23.27 | 1.60 | 0.07 |
| 1. 3 | 5 | 2.70 | 1.33 | 1.40 | 1.30 | **93.17** | 0.10 |
| 1. 4 | 5 | 63.50 | 6.27 | 7.33 | 6.63 | **16.10** | 0.17 |
| 1. 5 | 3 | 0.43 | 0.57 | **98.00** | 0.17 | 0.80 | 0.03 |
| 1. 6 | 5 | 29.47 | 12.10 | 26.77 | 12.27 | **19.10** | 0.30 |
| 1. 7 | 2 | 18.60 | **29.77** | 23.87 | 17.03 | 10.57 | 0.17 |
| 1. 8 | 2 | 1.47 | **85.20** | 4.07 | 4.87 | 4.27 | 0.13 |
| 1. 9 | 1 | **23.97** | 17.80 | 35.97 | 20.10 | 1.97 | 0.20 |
| 1. 10 | 4 | 9.87 | 6.10 | 16.40 | **56.47** | 11.03 | 0.13 |
| 1. 11 | 3 | 11.67 | 7.03 | **70.93** | 5.10 | 5.20 | 0.07 |
| 1. 12 | 4 | 8.70 | 2.00 | 5.20 | **79.97** | 4.10 | 0.03 |
| 1. 13 | 1 | **65.30** | 18.63 | 2.07 | 12.43 | 1.50 | 0.07 |
| 1. 14 | 4 | 2.77 | 27.27 | 11.17 | **37.10** | 21.60 | 0.10 |
| 1. 15 | 5 | 2.63 | 5.63 | 13.67 | 4.77 | **72.97** | 0.33 |
| 1. 16 | 1 | **44.53** | 12.23 | 14.60 | 20.43 | 8.13 | 0.07 |
| 1. 17 | 2 | 8.50 | **57.60** | 4.40 | 19.87 | 9.40 | 0.23 |
| 1. 18 | 5 | 14.63 | 27.00 | 16.60 | 6.23 | **35.30** | 0.23 |
| 1. 19 | 2 | 12.67 | **47.20** | 7.00 | 18.43 | 14.53 | 0.17 |
| 1. 20 | 4 | 8.53 | 9.23 | 2.30 | **74.63** | 5.17 | 0.13 |

එක් එක් ප්‍රශ්නය යටතේ නිවැරදි වරණය තෝරා ඇති ශිෂ්‍ය ප්‍රතිශතය අඳුරු කර ඇති කොටුවලින් දක්වා ඇත.

**2.2.5 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**

බහුවරණ ප්‍රශ්න 20කින් සමන්විත මෙම ප්‍රශ්න පත්‍රය මගින් සිංහල භාෂාව පිළිබඳ අපේක්ෂකයන් සතු නිරවුල් දැනුම, අවබෝධය, ස්මරණ හැකියාව, භාෂා පරිචය හා භාවිතය යන කුසලතා මැන බැලීම හා ඇගයීම අපේක්ෂිත ය.

මෙම බහුවරණ ප්‍රශ්න 20ට ම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. සිංහල ප්‍රශ්න පත්‍රයට හිමි පැය තුනක කාලයෙන් නිශ්චිත කොටසක් මෙම I කොටසේ ප්‍රශ්න 20ට ම පිළිතුරු සැපයීම සඳහා වෙන් කර නොමැති වුවත් සාමාන්‍යයෙන් පැය භාගයක කාලයක් ඒ සඳහා යෙදීම ප්‍රමාණවත් වේ යැයි අපේක්ෂා කෙරේ.

අංක **9** පිටුවේ ඇති ප්‍රස්තාරයෙහි හා **41** පිටුවේ ඇති වගුවේ දැක්වෙන තොරතුරුවලට අනුව එම ප්‍රශ්න 20 අතුරෙන් පහසුතාව 75% සහ ඉන් ඉහළ ප්‍රතිශතයක් පෙන්වන්නේ 1.3, 1.5, 1.8 හා 1.12 ප්‍රශ්නයි. එනම් මෙම පත්‍රයට පිළිතුරු සැපයූ අපේක්ෂකයන්ගෙන් 75%කට වඩා වැඩි පිරිසකට මෙම ප්‍රශ්නවලට නිවැරදි ව පිළිතුරු සැපයීමට හැකි වී තිබේ. එබැවින් එකී ප්‍රශ්න පහසුත ම ප්‍රශ්න ලෙස සැලකිය හැකි වේ. එම ප්‍රශ්න අතුරෙන් අංක 1.5 ප්‍රශ්නය වඩාත් පහසු ප්‍රශ්නය වී ඇති අතර එහි පහසුතාව 98%ක් වේ. මීළඟට පහසු ප්‍රශ්නය වී ඇත්තේ අංක 1.3යි. එහි පහසුතාව 93%ක් වේ. අනතුරුව 85%ක පහසුතාව ඇත්තේ අංක 1.8 ප්‍රශ්නයට ය.

මෙහි දී අංක 1.5 ප්‍රශ්නයෙන් විමසා ඇති අක්ෂර සංකේත යෙදීමේ අනුපිළිවෙළ පිළිබඳ ව අපේක්ෂකයන්ගෙන් වැඩි සංඛ්‍යාවක් සාර්ථක ව පිළිතුරු සපයා ඇත. අංක 1.3 ප්‍රශ්නයෙහි නිවැරදි අකාරාදි පිළිවෙළ දී ඇති වරණ ඔස්සේ පහසුවෙන් හඳුනා ගැනීමට අපේක්ෂකයන් සමත් වී ඇත. අංක 1.8 ප්‍රශ්නයෙහි විරුද්ධාර්ථවත් පද හඳුනා ගැනීමෙහි ඇති පහසුතාව හේතුවෙන් වැඩි අපේක්ෂකයන් පිරිසක් නිවැරදි පිළිතුර තෝරා ගත් බව පැහැදිලි වේ.

අංක 1.1, 1.10, 1.11, 1.13,1.15,1.17 හා 1.20 යන ප්‍රශ්නවල පහසුතාව 50% - 75% අතර ප්‍රාන්තරයට අයත් වේ. අනෙකුත් ප්‍රශ්නවලට සාපේක්ෂ ව මෙම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අපේක්ෂකයන්ට පහසු වී ඇති බව අනාවරණය වේ. අංක 1.2, 1.14, 1.16, 1.18 හා 1.19 යන ප්‍රශ්නවල පහසුතාව 30% - 50% අතර ප්‍රාන්තරයට අයත් වේ.

අංක 1.4, 1.6, 1.7 හා 1.9 යන ප්‍රශ්නවල පහසුතාව 30%ට වඩා අඩුවන බැවින් එම ප්‍රශ්න බොහෝ අපේක්ෂකයන්ට නිවැරදි ව පිළිතුරු සැපයීමට දුෂ්කර වූ ප්‍රශ්න ලෙස සැලකිය හැකි ය. ඒ අතුරෙන් වඩාත් ම දුෂ්කර වී ඇති ප්‍රශ්නය වන්නේ අංක 1.4 ප්‍රශ්නය යි. එහි පහසුතාව 16%ක් වේ. එසේ සාධන මට්ටම අඩු වීමට හේතු වී ඇත්තේ අපේක්ෂකයන් තුළ අක්ෂර සංකේත භාවිතය හා යෙදීම පිළිබඳ ව පැවති අනවබෝධය බව පෙනී යයි.

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අනිවාර්ය බහුවරණ ප්‍රශ්න 20 පිළිවෙළින් භාෂා කුසලතා, ව්‍යාකරණ, අවබෝධය හා විශ්ලේෂණය යන ප්‍රධාන තේමාවලට යෝග්‍ය ආකාරයෙන් සකස් කර ඇත. භාෂා කුසලතා යටතේ අක්ෂර වින්‍යාසය (1.1, 1.2, 1.4, 1.5), අකාරාදි පිළිවෙළ (1.3), වචන කෝෂය (1.6, 1.7, 1.8 හා 1.9) පද බෙදීම (1.20) යන අංශවලට අදාළ ව ප්‍රශ්න ඉදිරිපත් කර ඇත.

ව්‍යාකරණය යන තේමාව යටතේ 1.10, 1.11, 1.12, 1.13, 1.14, 1.15, 1.16, 1.17, 1.18 හා 1.19 යන ප්‍රශ්න ඇතුළත් කළ හැකි ය. අවබෝධය හා විශ්ලේෂණය මේ සෑම ප්‍රශ්නයක් සමග ම අනුබද්ධ ව පවතී. සෑම ප්‍රශ්නයක් ම යොමු වන්නේ වරණ පහක් යටතේ ය. එම වරණ පහෙන් යෝග්‍ය වරණය තෝරා ගැනීමේ අවබෝධය අපේක්ෂකයන් තුළ තිබිය යුතු ය. විශ්ලේෂණය ද මේ සියලු ප්‍රශ්න සමග බැඳී පවතී. මෙහි දී එක් එක් වරණය විශ්ලේෂණය කරමින් දැනුම හා අවබෝධය උපයෝගි කර ගෙන වඩාත් යෝග්‍ය වරණය තෝරා ගැනීමට අපේක්ෂකයන් යොමු කෙරෙන බව කිව යුතු ය.

සිංහල II පත්‍රයෙහි I කොටසට අයත් බහුවරණ ප්‍රශ්න 20 පහත දැක්වෙන පරිදි ප්‍රධාන තේමා තුනක් යටතේ වර්ගීකරණය කළ හැකි වේ.

- භාෂා කුසලතා - 1.1, 1.2, 1.3, 1.4, 1.5, 1.6, 1.7, 1.8, 1.9, 1.20
- ව්‍යාකරණය - 1.10, 1.11, 1.12, 1.13, 1.14, 1.15, 1.16, 1.17, 1.18, 1.19
- අවබෝධය හා විශ්ලේෂණය - 1.1 සිට 1.20 තෙක් ප්‍රශ්න 20ම

**භාෂා කුසලතා**

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු බහුවරණ ප්‍රශ්න අතුරෙන් ප්‍රශ්න 10ක් ම ඉදිරිපත් කර තිබුණේ භාෂා කුසලතා තේමාව යටතේ ය. II පත්‍රයට හිමි මුළු ලකුණු ප්‍රමාණයෙන් 10%ක් මෙයට වෙන් වන සේ තේමා අතර බර තබා ඇත. බහුවරණ ප්‍රශ්න 20 අතුරෙන් පහසුත ම ප්‍රශ්නය අංක 1.5 වන අතර එය භාෂා කුසලතා තේමාවට අයත් වේ. එහි පහසුතාව 98% කි. මීළඟට මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් අංක 1.3, 93%ක පහසුතාවක් ද, අංක 1.8 , 85%ක පහසුතාවක් ද දක්වා ඇත. ඒ අනුව වඩාත් පහසු ප්‍රශ්න ත්‍රිත්වය ම ඇතුළත් ව ඇත්තේ භාෂා කුසලතා තේමාවට ය. ඒ ප්‍රශ්න තුනෙහි ම පහසුතාව 75% ඉක්මවා ඇත. මෙම තේමාවට අයත් ප්‍රශ්න අතුරෙන් දුෂ්කර බවක් පෙන්වන්නේ අංක 1.4 හා 1.6 ප්‍රශ්න වේ. ඒවායේ පහසුතාව පිළිවෙළින් 16% හා 19% වේ.

භාෂා කුසලතා තේමාව යටතේ ඇති ප්‍රශ්න අතුරෙන් අංක 1.4 ප්‍රශ්නයට අපේක්ෂකයන් දී ඇති පිළිතුරු වඩාත් අසාර්ථක වී ඇත. එම ප්‍රශ්නය සඳහා නිවැරදි පිළිතුර අයත් පස්වන වරණය තෝරා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 16%කි. අපේක්ෂකයන්ගෙන් 64%ක් පළමු වරණය ද, 6%ක් දෙවන වරණය ද, 7%ක් තුන්වන වරණය ද, 7%ක් සිවුවන වරණය ද පිළිතුර ලෙස තෝරා ඇත. අංක 1.4 යටතේ දී ඇති ප්‍රශ්නය වන්නේ 'අක්ෂර සංකේත යෙදීම පිළිබඳ නිවැරදි ප්‍රකාශය යෙදී ඇති වරණය දී ඇති වරණ අතුරෙන් තෝරා ගැනීම යි''. අක්ෂර සංකේත යෙදෙන සියුම් අවස්ථා නිවැරදි ව හඳුනා ගැනීමට අපේක්ෂකයන්ගේ දැනුම මෙහි දී ප්‍රමාණවත් වී නොමැති බව මින් අනාවරණය වේ.

භාෂාවක් අධ්‍යයනය කිරීමේ දී පොත් පත් සඟරා මෙන් ම ශාස්ත්‍රීය ලිපි ලේඛන පරිශීලනයට ගුරුවරුන් යොමු වීම සහ සිසුන්ට අවශ්‍ය මග පෙන්වීම ලබා දීම මෙහි දී වැදගත් වේ. මෙම ප්‍රශ්න දහයෙහි ම පහසුතාව සලකා මධ්‍ය පහසුතාව ගණනය කළ විට භාෂා කුසලතා තේමාවේ සමස්ත පහසුතාව 53%කි.

**ව්‍යාකරණ**


සිංහල II පත්‍රයෙහි I කොටසෙහි ව්‍යාකරණ තේමාව යටතේ ප්‍රශ්න 10ක් අඩංගු වී ඇති අතර II ප්‍රශ්න පත්‍රයේ ලකුණුවලින් 10%ක් එම තේමාවට වෙන් ව තිබේ. එම ප්‍රශ්න 10 අතුරෙන් වැඩි ම පහසුතාව වන 80%ක අගයක් ලබා ගෙන ඇත්තේ අංක 1.12 ප්‍රශ්නය යි. මීට අමතර ව අංක 1.11, 1.13, 1.15 හා 1.17 යන ප්‍රශ්න පිළිවෙළින් 71%, 65%, 73% හා 58% යනා දි වශයෙන් පහසුතා අගයන් පෙන්වා ඇත. ව්‍යාකරණ තේමාව යටතේ අඩු ම පහසුතාවක් පෙන්වා ඇත්තේ 1.18 වන ප්‍රශ්නය යි. එහි පහසුතාව 35%කි. මෙම ප්‍රශ්නයේ නිවැරදි පිළිතුර අයත් වන්නේ පස්වන වරණයට වුවත් එය තෝරා ගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 35%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 15%ක් පළමුවන වරණය ද, 27%ක් දෙවන වරණය ද, 17%ක් තෙවන වරණය ද, 6%ක් සිවුවන වරණය ද තෝරා ගෙන ඇත.

ව්‍යාකරණ අංග නිවැරදි ව හඳුනා ගැනීම පිළිබඳ ව අපේක්ෂකයන්හට මනා අවබෝධයක් නොමැති වීම මෙහි දී කැපී පෙනේ. මේ අතර එම ප්‍රශ්නය නිරවුල් ව හඳුනා ගත් අපේක්ෂකයන් පිරිසක් ද සිටි බව පැහැදිලි වේ. මෙම ප්‍රශ්න දහයෙහි ම පහසුතාව සලකා මධ්‍යයක පහසුතාව ගණනය කළ විට ව්‍යාකරණ තේමාවේ සමස්ත පහසුතාව 57%කි.

**අවබෝධය හා විශ්ලේෂණය**


සිංහල II පත්‍රයේ I කොටසෙහි ඇතුළත් ප්‍රශ්න 20ම අවබෝධය හා විශ්ලේෂණය පාදක කොට ගෙන ඉදිරිපත් කෙරේ. අපේක්ෂකයන් නිවැරදි වරණය තෝරා ගැනීමේ දී දක්වා ඇති සියලු වරණ විශ්ලේෂණය කොට නිවැරදි වරණය පමණක් තෝරා ගැනීම සඳහා යෝග්‍ය අවබෝධයකින් යුක්ත විය යුතු ය. මේ කරුණු දෙක කෙරෙහි ම අනවබෝධයෙන් යුක්ත ව වැරදි වරණයක් තෝරා ගත් අවස්ථා කිහිපයක් දක්නට ඇත. අංක 1.4, 1.6 හා 1.9 යන ප්‍රශ්න නිදසුන් වශයෙන් දැක්විය හැකි ය. අවබෝධය හා විශ්ලේෂණ හැකියාව දුර්වල මෙවැනි ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සැපයීමේ කුසලතා ප්‍රගුණ කර ගත හැකි ය. භාෂා භාවිතය පිළිබඳ ව ලියැවුණු ශාස්ත්‍රීය ලේඛන මැනවින් පරිශීලනය කිරීමට අපේක්ෂකයන් යොමු කිරීමේ අවශ්‍යතාව මෙහි දී පැහැදිලි වේ.

2.2.6 II ප්‍රශ්න පත්‍රයේ I කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ (වර්ගීකරණය අනුව) :




අක්ෂර වින්‍යාසය යටතේ ප්‍රශ්න 4න් 2ක් ද අකාරාදි පිළිවෙළ යටතේ දී ඇති එක ම ප්‍රශ්නය ද පද බෙදීම යටතේ දී ඇති එකම ප්‍රශ්නය ද වචන කෝෂය යටතේ දී ඇති ප්‍රශ්න හතරෙන් එකක් ද, පද වර්ගීකරණය යටතේ දී ඇති ප්‍රශ්න 9න් 6ක් ද ඉහත වර්ගීකරණය අනුව 50%ට වැඩි පහසුතා දක්වා ඇත.

| වර්ගීකරණය | ප්‍රශ්න සංඛ්‍යාව | පහසුතාව වැඩිම | | පහසුතාව අඩුම | |
|---|---|---|---|---|---|
| | | ප්‍රශ්නය | පහසුතාව | ප්‍රශ්නය | පහසුතාව |
| 1. අක්ෂර වින්‍යාසය | 4 | 1.5 | 98% | 1.4 | 16% |
| 2. අකාරාදි පිළිවෙළ | 1 | 1.3 | 93% | - | - |
| 3. වචන කෝෂය | 4 | 1.8 | 85% | 1.6 | 19% |
| 4. පද බෙදීම | 1 | 1.20 | 75% | - | - |
| 5. පද වර්ගීකරණය | 9 | 1.12 | 80% | 1.18 | 35% |
| 6. වාක්‍ය නිර්මාණය | 1 | 1.19 | 47% | - | - |




II ප්‍රශ්න පත්‍රයේ I කොටසේ වර්ගීකරණය අනුව පහසුතාව ඉහත ප්‍රස්තාරයෙන් නිරූපණය කෙරේ. ඒ අනුව වැඩි ම පහසුතාව 93%ක් ලබා ගෙන ඇත්තේ අකාරාදි පිළිවෙළ යටතේ ඉදිරිපත් කර ඇති එක ම ප්‍රශ්නයට ය. සමස්ත පහසුතාව සැලකූ විට පද බෙදීම යටතේ සකසා ඇති ප්‍රශ්නය සඳහා ඊළඟට වැඩි ම පහසුතාව වන 75% හිමි කර ගෙන ඇත. අඩු ම පහසුතාව ලබා ඇත්තේ වචන කෝෂය යටතේ ඇති ප්‍රශ්න 4ට ය. එහි සමස්ත පහසුතාව 40%කි. අඩු ම පහසුතාව ප්‍රදර්ශනය කෙරෙන වචන කෝෂය යටතේ අන්තර්ගත ප්‍රශ්න හතර සකස් වී ඇත්තේ (1.6) අනුරූපී වචන යුගල භාවිතය, (1.7) තත්සම පද භාවිතය, (1.8) විරුද්ධාර්ථ පද භාවිතය හා (1.9) සමානාර්ථ පද භාවිතය පිළිබඳ අපේක්ෂකයා සතු දැනුම හා අවබෝධය මැන බැලීම අරමුණ කොට ගෙනයමින් (1.8) විරුද්ධාර්ථ පද භාවිතය පිළිබඳව 85% ක පහසුතාවක් අපේක්ෂකයා ප්‍රදර්ශනය කළත් අනෙකුත් අංශ සඳහා 30% ට අඩු පහසුතාවක් ප්‍රදර්ශනය කොට තිබීමෙන් පෙනී යන්නේ එම අංශ පිළිබඳ අපේක්ෂකයා සතු දැනුම හා අවබෝධය අවම මට්ටමක පවතින බවයි. මේ තත්ත්වය මඟ හරවා ගැනීම පිණිස අදාළ විෂය කරුණු තහවුරු කෙරෙන විවිධ අභ්‍යාස පන්ති කාමරය තුළ සිදු කිරීම යෝග්‍ය ය. සමාරූපී පද, තත්සම පද හා සමානාර්ථ පද ඇතුළත් ප්‍රදර්ශන පත් පංති කාමරය තුළ ප්‍රදර්ශනය කිරීමත්, අපේක්ෂකයන් ලවා ඒ ඒ තේමාවන් යටතේ පොත් පිංච නිර්මාණය කරවීමත් මේ හා බැඳි තරග පැවැත්වීමත් නිදර්ශන ලෙස ඉදිරිපත් කළ හැකි ය.

**2.2.7 II ප්‍රශ්න පත්‍රයේ II කොටස හා අපේක්ෂිත පිළිතුරු, ලකුණු දීමේ පටිපාටිය, පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා :-**

## II කොටස

**02 ප්‍රශ්නය**

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සංස්කෘතික පරිසර විද්‍යාව නම් සංකල්පය පුරාවිද්‍යා ශික්ෂණයට පමණක් සීමා වූවක් නොවේ. එය දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව, ආර්ථික විද්‍යාව ආදී පුළුල් පරාසයක දිවෙන වෙනත් සමාජයීය හා මානව ශාස්ත්‍ර විෂයක්ෂේත්‍රයන් සමග ද බද්ධව පවතී. සංස්කෘතික පරිසර විද්‍යාවේ දී වඩාත් අවධානයට යොමු කෙරෙන්නේ අර්ථකථනාත්මක පුරාවිද්‍යාවේ ප්‍රධාන න්‍යායාත්මක සංකල්පයක් ලෙස සැලකෙන පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව නම් විෂයය පිළිබඳව ය. පොදුවේ ගත් කල සංස්කෘතික පරිසර විද්‍යාව නම් විෂයය සඳහා ක්‍රමික පදනම සැකසී ඇත්තේ දහඅටවන සියවසේ සිට පමණ ය. එතෙක් පැවති දේවනිර්මාණවාදී අදහස් බිඳ දමමින් චාර්ල්ස් ඩාවින්, තෝමස් හක්ලිස් ආදීන් ජීවවිද්‍යාත්මක පරිණාමයක් නැති නම් අනුවර්තීය යාන්ත්‍රණයක් පිළිබඳ ව දැක්වූ අදහස් ද කාල්මාක්ස්, ෆෙඩ්රිච් එංගල්ස් වැන්නන් සමාජ පරිණාමය පිළිබඳ ව දැක්වූ අදහස් ද මේ සඳහා මූල බීජ සපයා ඇත. බටහිර චින්තනය තුළ ඇති වූ අනුවර්තීය දාර්ශනික පරිණාමය බොහෝ ශික්ෂණයන්හි ගමන් මාර්ගය තීරණාත්මක ලෙස වෙනස් කිරීමට සමත් විය. පරිණාමවාදය, ව්‍යූහවාදය, නූතනවාදය හා පශ්චාද්නූතනවාදය මෙහි ලා ප්‍රධාන ගාමක බලවේග වශයෙන් විශාල මෙහෙයක් ඉටු කරනු හඳුනාගත හැකි ය. මෙම සංකල්පවල බලපෑම පුරාවිද්‍යා ශික්ෂණය කෙරෙහි ද විවිධාකාර න්‍යායාත්මක එළඹුම් ඔස්සේ සම්ප්‍රේෂණය වීම වර්ෂ 1960 පමණ සිට නව පුරාවිද්‍යාව නැතහොත් සංස්ලේෂී පුරාවිද්‍යාව නම් න්‍යායාත්මක සංකල්පයක් පුරාවිද්‍යා ශික්ෂණය තුළ වර්ධනය වීමෙන් පැහැදිලි වෙයි. ඉන් අනතුරුව විශේෂයෙන් පශ්චාද්නූතනවාදයේ ආභාසයෙන් පශ්චාත් සංස්ලේෂී පුරාවිද්‍යාව නම් සංකල්පයක් වර්ෂ 1970 පමණ සිට බටහිර රටවල බිහිවීමෙන් ද ඉහත සංකල්පවල බලපෑම තහවුරු වෙයි. මේ සියලු න්‍යායාත්මක සංකල්ප පුරාවිද්‍යාව තුළ පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාවේ දිශානතිය හා එහි භූමිකාවේ ස්වරූපය කෙරෙහි තීරණාත්මක බලපෑම් ඇති කළ ඒවා ය. පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව අවබෝධ කර ගැනීමට නම් මූලික වශයෙන් ම මිනිසා සහ පරිසරය අතර පැවති අන්‍යොන්‍ය සබඳතාවයේ ස්වරූපය හඳුනාගත යුතු ය. මානව ක්‍රියාකාරකම් පරිසරය මත පුළුල් පරාසයක් පුරා ව්‍යාප්ත වන ස්වරූපයේ වෙනස්කම් ඇති කිරීමට සමත් ය. පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව තත්ත්වාකාරයෙන් අවබෝධ කර ගැනීමට ඉවහල් වන තවත් වැදගත් න්‍යායාත්මක සංකල්ප දෙකක් ලෙස පරිණාමය හා අනුවර්තනය හැඳින්විය හැකි ය.

(i) සංස්කෘතික පරිසර විද්‍යාව බැඳී පවතින්නේ කවර විෂයයන් සමග ද?

(ii) අර්ථකථනාත්මක පුරාවිද්‍යාවෙහි ප්‍රධාන න්‍යායාත්මක සංකල්පය ලෙස සැලකෙන්නේ කුමක් ද?

(iii) බොහෝ ශික්ෂණයන්හි ගමන් මග තීරණාත්මක ලෙස වෙනස් කිරීමට බලපෑ ගාමක බලවේග මොනවා ද?

(iv) පශ්චාත් සංස්ලේෂී පුරාවිද්‍යාව බිහිවන්නේ කවර විෂයයක ආභාසයෙන් ද?

(v) පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව අවබෝධ කර ගැනීමට ඉවහල් වන්නේ කවර සංකල්ප ද?

(ලකුණු 10 යි.)

(i) පුරාවිද්‍යාව, දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යාව හා ආර්ථික විද්‍යාව

(ii) පුරාණ සංස්කෘතික පරිසර විද්‍යාව

(iii) පරිණාමවාදය, ව්‍යූහවාදය, නූතනවාදය හා පශ්චාද්නූතනවාදය

(iv) මිනිසා සහ පරිසරය අතර පුළුල් පරාසයක් පුරා පැවති අන්‍යොන්‍ය සබඳතාවයේ ස්වරූපය, පරිණාමය හා අනුවර්තන **(ලකුණු 10යි)**

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

අධ්‍යාපනයෙහි ලා ඉතා වැදගත් මෙහෙයක් කෞතුකාගාරවලින් සිදු විය හැකි බව බොහෝ දෙනා පිළිගනිති. කෞතුකාගාර ප්‍රදර්ශන භාණ්ඩ, ඉගැන්වීමෙහි දී ඉතා ප්‍රයෝජනවත් උපකරණ වන අතර පන්තියෙහි දී උගන්වන විෂය කරුණු වඩාත් තහවුරු කිරීම සඳහා ගුරුවරුනට ඒවා භාවිත කළ හැකි ය. බොහෝ කෞතුකාගාර වැඩසටහන් විමසීමේ දී පාසල් ළමයින් සඳහා මේවායින් සිදු කළ හැකි සේවාව අප්‍රමාණ බව පැහැදිලි වේ. මේ වැඩසටහන්වල සාර්ථකභාවය සහ කාර්යසාඵල්‍යයට හේතු වන සාධක ගණනාවක් ඇති බව ද සැලකිය යුතු ය. බාල පරපුරෙහි අනාගතය රැඳී ඇත්තේ ගුරුවරුන් අත හෙයින් ඔවුන් විසින් සමාජයට ඉමහත් සේවයක් ඉටු කරනු ලැබිය යුතු ය යන්න වර්තමානයේ පිළිගත් මතය යි. තමන් භාරයේ සිටින දරුවන් තැන්පත්, හොඳ හැදීමෙන් යුත්, ප්‍රයෝජනවත් පුරවැසියන් බවට පත් කිරීමේ භාරදූර වගකීම ඔවුන් සතු ය. මෙම බරපතළ වගකීම පන්ති කාමරයෙහි ඉගැන්වීමෙන් පමණක් ඉටු කළ නොහැකි බැවින් පාසල් අධ්‍යාපන පටිපාටියට අතිරේක ව කෞතුකාගාරවලින් ගත හැකි ප්‍රයෝජන බෙහෙවින් අගය කෙරේ. නානා යුගවලට සහ දේශවලට අයත් වූ ද විවිධ අංශවලට අයත් වූ ද තථ්‍ය වූ සහ ඉතා විශ්වාස කටයුතු වූ ද වස්තු කෞතුකාගාරවල දක්නට ඇත. මේවායින් බොහෝ වස්තු එරටෙහි වෙනත් තැනක දී දකින්නට වත් අධ්‍යයනය කරන්නට වත් පාසල් ළමයින්ට හෝ ගුරුවරුන්ට හෝ හැකිවෙතොත් ඒ කලාතුරකිනි.

(ලකුණු 15 යි.)

- කෞතුකාගාරවලින් අධ්‍යපනයට වැදගත් මෙහෙයක් ඉටුවන බව පිළිගැනීම
- පන්තියේ උගන්වන විෂය කරුණු තහවුරු කිරීමට කෞතුක ප්‍රදර්ශන භාණ්ඩ ප්‍රයෝජනවත් වන බව
- බාල පරපුරෙහි අනාගතය ගුරුවරුන් අත රැඳී ඇතැයි යන වර්තමාන පිළිගැනීම
- දරුවන් තැන්පත්, හොඳ හැදීමෙන් යුත්, ප්‍රයෝජනවත් පුරවැසියන් කිරීමේ කාර්යය පන්ති කාමර ඉගැන්වීමෙන් පමණක් ඉටුකර ගත නොහැකි වීම
- නොයෙක් යුගවලට සහ දේශවලට අයත් වූ ද, තථ්‍ය වූ හා ඉතා විශ්වාස කටයුතු වූ ද පුරා වස්තු කෞතුකාගාරවල තිබීම
- කෞතුකාගාරවලින් තොරව වෙනත් තැනක දී එහි ඇති පුරා වස්තු දකින්ට මෙන් ම අධ්‍යයනය කරන්නට ද ළමයින් ට හෝ ගුරුවරුන්ට නොහැකි වීම


ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර ඡේදවලට බෙදා ඇත්නම් සමස්තයෙන් ලකුණු 02ක් අඩු වේ. වචන සංඛ්‍යාව 50 - 60 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි වේ නම් ලකුණු 3ක් අඩු වේ.

**සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට - ලකුණු 03යි**

**අක්ෂර වින්‍යාසයට - ලකුණු 04යි**

**අන්තර්ගතයට - ලකුණු 08යි**


**2 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**





මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වන අතර ඒ සඳහා පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 97%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 06 ප්‍රාන්තරයේ 0%ක් ද
ලකුණු 07 - 12 ප්‍රාන්තරයේ 05%ක් ද
ලකුණු 13 - 18 ප්‍රාන්තරයේ 37%ක් ද
ලකුණු 19 - 25 ප්‍රාන්තරයේ 58%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 18ට වඩා ලබා ගත් පිරිස 58%ක් වන අතර 5%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 13ට අඩුවෙනි.




- ⋆ මෙම ප්‍රශ්නය (අ), (ආ)යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර (අ) කොටසේ අනුකොටස් (ii), (iii), (iv) සඳහා ද (ආ) කොටස සඳහා ද පහසුතාව 68% ඉක්මවා ඇත. (අ) කොටසේ (i), (v) අනුකොටස්වල පහසුතාව පිළිවෙළින් 54% සහ 57% වශයෙනි.




### පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ

කොටස් දෙකකින් සමන්විත මෙම ප්‍රශ්නයේ පළමු කොටසෙන් දී ඇති පාඨයක් ඇසුරෙන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සැපයීම අපේක්ෂා කරන අතර දෙවන කොටසෙන් කිසියම් පාඨයක් දී එය තුනෙන් එකක් වන සේ සාරාංශ කොට ලිවීම අපේක්ෂා කෙරේ.

දී ඇති පාඨය පහසුවෙන් අවබෝධ කර ගෙන ඉදිරිපත් කර ඇති ප්‍රශ්නවලට සාර්ථක ව පිළිතුරු සැපයීමට අපේක්ෂකයන්ට පහසු වී තිබුණේ (අ) කොටසේ II, III, IV අනුකොටස්වලට ය. එම කොටස් තුනේ පහසුතාව 86%ක් ඉක්මවා තිබිණි. (අ) කොටසේ I, V අනුකොටස් දෙකට පිළිතුරු සැපයීම එතරම් සාර්ථක වී නැත. එම කොටස්වල පහසුතාව පිළිවෙළින් 54%, 57% විය. ඊට හේතුව ලෙස පෙනෙන්නේ නිශ්චිත ව ඉදිරිපත් කෙරෙන ප්‍රශ්නයකට ඍජු පිළිතුරු සැපයීමට අපේක්ෂකයන් කුසලතාවක් දැක්වුව ද ප්‍රශ්නයක් විශ්ලේෂණය කරමින් පිළිතුරු ලිවීමේ දී ඔවුන් දුර්වලතා දක්වන බව යි.

2 ප්‍රශ්නයේ (ආ) කොටසේ පහසුතා මට්ටම 69%ක් විය. මෙය සාරාංශකරණයට අදාළ ප්‍රශ්නය වන අතර මධ්‍යස්ථ පහසුතා මට්ටමක් පෙන්නුම් කරයි. මීට හේතු වූ කරුණු ලෙස ප්‍රකාශයක කරුණු සම්පිණ්ඩනය කර ප්‍රකාශ කිරීමේ දුර්වලතා, අක්ෂර වින්‍යාසය, විරාම ලක්ෂණ භාවිතය හා උක්ත ආඛ්‍යාත සම්බන්ධ රීති පිළිබඳ අපේක්ෂකයන්ගේ අල්ප අවබෝධය මෙන් ම නියමිත වචන සංඛ්‍යාව අඩුවීම හා ඉක්මවීම දැක්විය හැකි ය.

### නිගමන හා යෝජනා

පාඨයක් ඇසුරෙන් පිළිතුරු සැපයීමේ දී නිශ්චිත පිළිතුරු ඉදිරිපත් කිරීමට මෙන් ම ප්‍රශ්න විශ්ලේෂණය කරමින් කරුණු දැක්වීමට අපේක්ෂකයන් තුළ ප්‍රාගුණ්‍යයක් ඇති කළ යුතු ය. එසේ ම පාඨයෙහි සම්පිණ්ඩිතාර්ථයට හානි නොවන පරිදි වචන සංශ්ලේෂණය කර දැක්වීමටත්, භාෂා රීති අනුල්ලංඝනය කිරීමටත් අපේක්ෂකයන් වග බලා ගත යුතු ය.

## 03 ප්‍රශ්නය


**3.** දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) සිංහල ගීතය පෝෂණයෙහි ලා ජන සාහිත්‍යයෙන් ලැබී ඇති ආභාසය
(ii) අදූරදර්ශී මානව ක්‍රියාකාරකම් හා ස්වාභාවික විපත්ති
(iii) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හා අනාගත අභියෝග
(iv) ලාංකේය ශ්‍රම බලකායට යාවත් ප්‍රජාව සම්බන්ධ කර ගැනීමේ ක්‍රමෝපාය
(v) රටක සංවර්ධනය කෙරෙහි සමබර වූ විදේශ ප්‍රතිපත්තියක අවශ්‍යතාව
(vi) ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්ෂේත්‍රය කෙරෙහි පෞද්ගලික විශ්වවිද්‍යාලයවල බලපෑම (ලකුණු 25 යි.)

(i) රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය
(ii) එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
(iii) කරුණුවල පැහැදිලි බව
(iv) නිවැරදි අක්ෂර වින්‍යාසය
(v) ව්‍යාකරණ දෝෂ රහිත වීම
(vi) භාෂාව ව්‍යක්ත ලෙස හැසිර වීම
(vii) සුදුසු ලෙස ඡේද වෙන් කිරීම
(viii) කියවිය හැකි සේ අත් අකුරු පැහැදිලි වීම
(ix) විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)

**(ලකුණු 25යි)**


### 3 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ නිගමන හා යෝජනා :




මෙය අනිවාර්ය ප්‍රශ්නයක් වන අතර ඒ සඳහා පිළිතුරු සපයා ඇති ප්‍රතිශතය 97%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 25ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 06 ප්‍රාන්තරයේ 1%ක් ද
ලකුණු 07 - 12 ප්‍රාන්තරයේ 19%ක් ද
ලකුණු 13 - 18 ප්‍රාන්තරයේ 66%ක් ද
ලකුණු 19 - 25 ප්‍රාන්තරයේ 14%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 18ට වඩා ලබා ගත් පිරිස 14%ක් වන අතර අපේක්ෂකයන්ගෙන් 20%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 13ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නයට අනුව දී ඇති රචනා මාතෘකා හයෙන් එකක් තෝරා ගෙන රචනයක් ලිවිය යුතු ව තිබිණි. සමස්ත රචනා මාතෘකා හය සඳහා 58%ක සමස්ත පහසුතාව පෙන්නුම් කරයි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

රචනාවල දී අපේක්ෂකයන්ගේ සාධනය මධ්‍යස්ථ මට්ටමක පවතින ආකාරය නිරූපණය වෙයි.

**නිගමන හා යෝජනා**

රචනාවල අන්තර්ගත කරුණු විමසීමේ දී විද්‍යමාන වන්නේ සතුටුදායක තත්ත්වයකි. අන්තර්ගත කරුණු සතුටුදායක තත්ත්වයක් පෙන්නුම් කළ ද ප්‍රකාශන ශක්තියේ දුර්වලතා දක්නට ලැබේ. අක්ෂර වින්‍යාසය හා වාක්‍ය රීති පිළිබඳ අවබෝධය සතුටුදායක තත්ත්වයක නො පවතී. ඒ නිසා රචනා නිතර ලිවීම මගින් භාෂා භාවිතය පිළිබඳ පරිචයක් ලබා ගැනීමට ශිෂ්‍යයන් උනන්දු කළ යුතු බව පැහැදිලි වේ. රචනා ලිවීම සඳහා විශේෂ ප්‍රාගුණ්‍යයක් ශිෂ්‍යයන් ඇති කර ගත යුතු ය. ඒ සඳහා විවිධ පොතපත පරිශීලනයෙන් විවිධ ලේඛන ශෛලි හඳුනා ගැනීමටත් ඒ ඇසුරෙන් ස්වාධීන ලේඛන ශෛලියක් ගොඩ නගා ගැනීමටත් ශිෂ්‍යයන් පෙළඹවිය යුතු ය. සතතාභ්‍යාසයේ යෙදෙමින් ස්වකීය ලේඛන කුසලතා වර්ධනය කර ගැනීමට ද ශිෂ්‍යයන් උනන්දු කළ යුතු ය.

**4** ප්‍රශ්නය

**4.** (අ) පහත සඳහන් වාක්‍යවල **සදෙස් තැන් ඇතොත් නිදෙස් කොට** ලියන්න.

(i) දරුවෝ එහි යතත් අපි එහි නො යමු.

(ii) අපි ජයගතිමු'යි දේශපාලකයන් උදම් ඇනූහ.

(iii) ඈත දියඹෙහි පිහිතන තල්මසුන් අපට පෙනෙති.

(iv) මවුපියෝ යහපත් වෙත් නම් දරුවෝ ද යහපත් වෙති.

(v) අම්මා ද අක්කා ද මම ද එහි ගියෙමි. (ලකුණු 05 යි.)

(i) දරුවන් එහි යතත් අපි එහි නො යමු.

(ii) අපි ජයගතිමු' යි දේශපාලකයෝ උදම් ඇනූහ.

(iii) ඇත දියඹෙහි පිහිනන තල්මස්සු අපට පෙනෙති.

(iv) නිවැරදි වැකියකි.

(v) අම්මා ද අක්කා ද මම ද එහි ගියෙමු. **(ලකුණු 05යි)**

(ආ) **පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.**

(i) **ශිෂ්‍යයෝ මහාචාර්යතුමා පසසති.**

(ii) **දඩයක්කාරයෝ අභයභූමියට වැදී වනසතුන් දඩයම් කළහ.**

(iii) **නවකතාකරුවෝ විචාරකයන් හෙළා දකිති.**

(iv) **ව්‍යාපාරිකයෝ තම උත්සව සඳහා ගායකයන් ගෙන්වති.**

(v) **ඔවුහු අප මුළා කළහ.** (ලකුණු 05 යි.)

(i) ශිෂ්‍යයන් විසින් මහාචාර්යතුමා පැසසෙයි/ පැසසේ/ පසසුනු ලබයි/ පසසුනු ලැබේ.

(ii) දඩයක්කාරයා විසින් අභයභූමියට වැදී වනසත්තු දඩයම් කෙරුණු/කැරුණු/කරන ලදහ/ලද්දාහු ය/ලද්දාහ/ ලද්දෝය, කරනු ලැබූහ/ ලැබුවෝය/ ලැබුවාහ/ ලැබුණෝය.

(iii) නවකතාකරුවන් විසින් විචාරකයෝ හෙළා දැකෙති/ දැකෙත්, දකිනු ලැබෙති/ ලැබෙත්/ ලබති/ ලබත්

(iv) ව්‍යාපාරිකයෝ විසින් තම උත්සව සඳහා ගායකයෝ ගෙන්වෙති/ ගෙන්වෙත්, ගෙන්වනු ලබති/ ලැබෙති/ ලබත්, ලැබෙත්.

(v) ඔවුන් විසින් අපි මුළා කෙරුණුමු/ කෙරුණෙමු/කැරුණෙමු, කරන ලදුමු/ ලද්දෙමු, කරන ලැබුවෙමු/ ලැබූමු. **(ලකුණු 05යි)**

(ඉ) **නිවැරදි වැකියක්** **නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.**

(i) දරු වියොවින් (ඔවුන්/ඔවුහු) හඬා වැලපෙති.

(ii) ස්තුති කථාවෙන් අනතුරුව (සභාව/සභාතොමෝ) විසිර ගියේ ය.

(iii) නාහිමියෝ (මිනිසුන්/මිනිස්සු) ලවා විහාර භූමිය පිළිසකර කරවති.

(iv) පියා විසින් (අප/අපි) රක්නා ලදුමු.

(v) (සොරුන්/සොරු) ආහ'යි ඔවුහු බිය වූහ. (ලකුණු 05 යි.)

(i) ඔවුහු


(ii) සභාව

(iii) මිනිසුන්

(iv) අපි

(v) සොරුන් **(ලකුණු 05යි)**


**4 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**





මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 68%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

| | | | |
|---|---|---|---|
| ඉන් ලකුණු | 00 - 03 | ප්‍රාන්තරයේ | 4% ක් ද |
| ලකුණු | 04 - 07 | ප්‍රාන්තරයේ | 22%ක් ද |
| ලකුණු | 08 - 11 | ප්‍රාන්තරයේ | 37%ක් ද |
| ලකුණු | 12 - 15 | ප්‍රාන්තරයේ | 37%ක් ද |

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 37%ක් වන අතර 26%ක් ම ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නය කොටස් තුනකින් ද, අනුකොටස් 15කින් ද යුක්ත වේ. එයින් (අ) කොටස 52%ක පහසුතාවක් පෙන්නුම් කරන අතර, වැඩි ම පහසුතාව වූ 76%ක් පෙන්නුම් කරනුයේ (ඉ) කොටස යි. 4 ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 64%කි.

## පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ

කොටස් තුනකින් සමන්විත මෙම ප්‍රශ්නය උක්තාඛ්‍යාත සම්බන්ධ වාක්‍ය රීති හා කර්තෘකාරක වාක්‍ය, කර්ම කාරකයට පරිවර්තනය කිරීමේ හැකියාව මැන බැලෙන්නකි. ඒ අනුව එහි (අ) කොටසෙන් දී ඇති වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කිරීමත් (ආ) කොටසෙන් කර්තෘ කාරක වාක්‍ය කර්ම කාරකයට පරිවර්තනය කිරීමත් (ඉ) කොටසෙන් නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලිවීමත් අපේක්ෂා කෙරේ. අපේක්ෂකයන් පිළිතුරු සැපයීමේ දී මෙම ප්‍රශ්නය තෝරා ගත් ප්‍රතිශතය 68%ක් වැනි ඉහළ අගයක් ගෙන තිබිණි.
මෙම ප්‍රශ්නයේ පහසුතා මට්ටම පිළිවෙළින් (අ) කොටසේ 52%ක් ද, (ආ) කොටසේ 63%ක් ද (ඉ) කොටසේ 76%ක් ද වේ. මෙයින් පැහැදිලි වන්නේ වරහන් තුළින් වචන තෝරා වාක්‍යයක් නිවැරදි ව ලිවීමට අපේක්ෂකයන් වැඩි කුසලතාවක් දක්වා ඇති බවයි. ඊට සාපේක්ෂ ව වාක්‍ය කර්මකාරයට හැරවීම හා සදොස් තැන් නිදොස් කිරීමට දක්වන්නේ අඩු සාධන මට්ටමකි.

## නිගමන හා යෝජනා

සිංහල ව්‍යාකරණයේ ලේඛන රීතිය සම්බන්ධ වැදගත් ම අංගය වන වාක්‍ය රටා නිර්මාණය කිරීමේ දී එහි ඇති සරල මෙන් ම සංකීර්ණ වාක්‍ය රීති පිළිබඳ අපේක්ෂකයන් මනාව දැනුවත් කිරීම වැදගත් ය. මේ සඳහා සරල රීතියේ සිට සංකීර්ණ රීතිය දක්වා වාක්‍ය රීති දැක්වෙන ලැයිස්තුවක් නිදර්ශන සහිත ව පිළියෙල කොට ශිෂ්‍යයන්ට ලබා දීම හා පන්ති කාමරය තුළ නිතර නෙත ගැටෙන පරිදි ප්‍රදර්ශනය කිරීමෙන් වාක්‍ය රීති පිළිබඳ යම් අවබෝධයක් ශිෂ්‍යයාට ලබා දිය හැකි ය. වාක්‍ය රීති පිළිබඳ අවබෝධය මැනෙන (අ) සහ (ඉ) යන කොටස් දෙකෙන් නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීමට වරහනෙන් සුදුසු පදය තේරීම සඳහා වූ (ඉ) කොටසට 76%ක පහසුතාවක් ලබා තිබීමෙන් යථෝක්ත කාර්යයේ වටිනාකම වඩාත් තහවුරු වේ. එසේම වාක්‍ය රීති ඉස්මතු වන ලෙස රචනාවක්, ඡේදයක්, වාර්තාවක් ගොඩ නැංවීමට දීම ද යෝග්‍ය ය. තව ද කර්මකාරක වාක්‍ය රටා රීතිය ද, අපේක්ෂකයන්ට නිවැරදි ව අවබෝධ කර දීමට සැලකිලිමත් විය යුතු ය. මෙහි දී කර්මකාරක වාක්‍ය සරල ව, ප්‍රයෝගික ව ඉගැන්වීම කෙරෙහි ගුරුභවතුන්ගේ අවධානය යොමු වීම වැදගත් ය. වාර්තාකරණයේ දී කර්මකාරක වාක්‍ය රටාව බහුල ව භාවිතා කෙරෙන බැවින් ඒ පිළිබඳ ව ශිෂ්‍යයන්ගේ අවධානය යොමු කොට නිවැරදි ව කර්මකාරක වාක්‍ය ගොඩ නැගීමට හුරු කිරීම සුදුසු ය. අකර්මක ධාතු සකර්මක ධාතු පැහැදිලි ව හඳුන්වා දී අකර්මක ධාතු සහිත වාක්‍ය කර්මකාරකයේ නොයෙදෙන බව අවධාරණය කළ යුතු ය. එමෙන් ම ශාස්ත්‍රීය ලිපි ලේඛන කියවීම කෙරෙහි අපේක්ෂකයන්ගේ අවධානය යොමු කළ යුතු අතර එමගින් ලේඛන වාක්‍ය රටා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඔවුන් පෙලඹවිය යුතු ය.

**5** ප්‍රශ්නය

**5.** (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** දක්වා ඇති පදවල **අර්ථ විග්‍රහ කර** ලියන්න.

(i) ඔවුන්ට **ප්‍රවේණියෙන්** හිමි වූ වස්තුව බොහෝ ය.

(ii) සිංහල ජනශ්‍රැතියට **පුරාවෘත්ත** ද අයත් වෙයි.

(iii) සිංහලයා බටහිර සිරිත්-විරිත් **අන්ධානුකරණය** එවක ගත්කරුවන්ගේ උපහාසයට ලක් විය. (ලකුණු 03 යි.)

(i) පරපුරෙන්, පරම්පරාවෙන්, පාරම්පරිකව, සන්තතියෙන්, උරුමයෙන්, පරවේණියෙන්

(ii)
- පුරාතන කාලය පිළිබඳ තොරතුරු ඇතුළත් කතා
- පෙර සිට පැවත එන කතා
- අතීතයේ සිට පැමිණෙන කතාන්දර

(iii) විමසීමෙන් තොරව කෙරෙන අනුකරණය / විචාරයෙන් තොරව අවිචාරයෙන් කෙරෙන අනුකරණය

**(ලකුණු 03යි)**

(ආ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් සුදුසු තනි පද** ලියන්න.

(i) මධ්‍ය කාලයට අයිති

(ii) වචනවල නිෂ්පත්තිය

(iii) කෙනකුගේ ඉරණම දැනගත් තැනැත්තා (ලකුණු 03 යි.)

(i) මධ්‍යතන / මධ්‍යකාලීන

(ii) නිරුක්ති

(iii) දෛවඥයා **(ලකුණු 03යි)**

(ඉ) පහත දැක්වෙන වාක්‍යවල **හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා** ලියන්න.

(i) පුද්ගල ................................ ගොඩනැගීමට අධ්‍යාපනය ද ඉවහල් වෙයි.

(ii) යෞවන ................................ ඔප් නංවන බවට ඇමතිතුමා පොරොන්දු විය.

(iii) සෑම සංස්කෘතියකට ම ................................ අංග ද අත්‍යවශ්‍ය වේ.

(iv) පුද්ගලයා..................... බන්ධනයන් කෙරෙහි ගිජු වෙයි.

(v) ඒ ශිෂ්‍යයා..................... ඥානයෙන් යුක්ත ය.

(vi) පැරණි කවියා අලංකාර ..................... කිරීමෙහි ලා දක්ෂ ය.

(ලෞකික, ව්‍යවහාරික, කුසලතා, පෞරුෂය, භෞතික, භාවිත) (ලකුණු 03 යි.)

(i) පෞරුෂය

(ii) කුසලතා

(iii) භෞතික

(iv) ලෞකික

(v) ව්‍යවහාරික


(vi) භාවිත **(ලකුණු 03යි)**

(ඊ) **තද කළු අකුරෙන්** දක්වා ඇති **බහු අර්ථ පදය යොදු වෙනත් අරුතක් දෙන ලෙස** වාක්‍යය බැගින් තනන්න.

(i) ඔහු තනතුරකට **පත්** වෙයි.
(ii) **සඳ** මත පා තැබීම කළ නොහැකි දෙයක් බව ඇතැමුන්ගේ විශ්වාසය යි.
(iii) අයදුම්පතක මුලින් ම ලිවිය යුත්තේ තම **නම** යි.
(iv) **පුර** පොහොය සෑම මසක් පාසා ම උදා වෙයි.
(v) වැද්දා වැවෙන් මාළු **බා** වනයට යයි.
(vi) **දන** රැස් කිරීම කවුරුත් ප්‍රිය කරති. (ලකුණු 06 යි.)

(i) පත් (පැමිණීම), පත්‍ර, කොළ, මාර්ග, පියාපත්, භාජන, තැටි
(ii) සඳ (චන්ද්‍රයා), උතුම්, කාන්තාව, සන්ධිය, ඡන්දස, චන්දන, කාලය, සන්ධ්‍යාව, සැකය, ලකුණ, ඡන්දය, සිත
(iii) නම (නාමය), නමය (ඉලක්කම), නම (විධික්‍රියාව), හිමිනම
(iv) පුර (පිරුණු), නගරය, රට, අන්තඃපුරය
(v) බා (පූර්වක්‍රියාව), භාග්‍ය, භාගය, කොටස, බහුව, අඩු වූ, බියවීම්, ව්‍යක්තයා, උළුවස්සේ හෝ ජනේලයේ කණුව
(vi) දන (ධනය), ජනතාව, දානය, පිළිස්සෙන, කැපීම **(ලකුණු 06යි)**


**5 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**





මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති ප්‍රතිශතය 28%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 14%ක් ද
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 47%ක් ද
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 33%ක් ද
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 6%ක් ද

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 6%ක් වන අතර 61%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




මෙම ප්‍රශ්නය කොටස් 4කින් හා අනුකොටස් 18කින් ද යුක්ත වේ. එයින් 76%ක් වූ වැඩි පහසුතාවක් දක්වනුයේ (ඉ) කොටස වන අතර 26%ක් ලබා ගත් (ආ) කොටස අඩු ම පහසුතාවක් පෙන්නුම් කරයි. 5 ප්‍රශ්නයේ සමස්ත පහසුතාව 42.5%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

(අ), (ආ), (ඉ), (ඊ) යන අනුකොටස් හතරක් යටතේ ඉදිරිපත් කෙරෙන මෙම ප්‍රශ්නයේ අරමුණ වන්නේ භාෂාවේ අර්ථ විභාගය සහ වචන කෝෂ භාවිතය පිළිබඳ අපේක්ෂකයන්ගේ අවබෝධය මැන බැලීම යි. මෙහි (අ) හා (ආ) කොටස් දෙක භාෂාවේ අර්ථ විභාගය කෙරෙහි යොමු වී ඇත. මෙහි (අ) කොටසෙන් වාක්‍යයක යෙදී ඇති වචනවල අර්ථ විග්‍රහ කර දැක්වීම අපේක්ෂිත ය. (ඊ) කොටසෙන් අපේක්ෂා කරන්නේ බහ්වර්ථ පදවලින් නිරූපිත අර්ථ විග්‍රහ කිරීම සඳහා අපේක්ෂකයන් දක්වන කුසලතා විමර්ශනය කිරීමයි. (ආ) සහ (ඉ) යන කොටස් වචන කෝෂය සඳහා යොමු වේ. (ආ) කොටසෙන් යම් යම් යෙදුම් සඳහා තනි පද විමසීමත් (ඉ) කොටසෙන් හිස් තැනට යෝග්‍ය ආකාරයෙන් පද තේරීමත් අපේක්ෂිත ය.
අර්ථ විභාග යටතේ (අ) කොටසෙහි පහසුතාව 32%කි. එය අඩු මට්ටමක පවතී. අඩු ම පහසුතාව දක්වන්නේ (ආ) කොටසෙනි. එය 26%ක ප්‍රතිශතයකි. වැඩි ම පහසුතාව 76%ක් දක්වන්නේ (ඉ) කොටසෙනි. (ඊ) කොටසෙහි පහසුතාව 36%කි.

**නිගමන හා යෝජනා**

කිසියම් වාක්‍ය පරිසරයක් තුළ සුදුසු අයුරින් හිස්තැන් පිරවීමට අපේක්ෂකයන් තුළ පරිචයක් පවත්නා බව පෙනේ. බහ්වර්ථ පද ඒ ඒ අර්ථයට අනුරූපී ව යෙදීම පිළිබඳ ව ද මධ්‍යස්ථ දැනුමක් අපේක්ෂකයන් සතු ව ඇත. එහෙත් විදග්ධ භාවිතයේ යෙදෙන වචන පිළිබඳ දැනුම පහළ මට්ටමක පවතී. විවිධ ගද්‍ය, පද්‍ය, විචාර, ශාස්ත්‍රීය ලිපි ආදිය කියවීමට යොමු කිරීමෙන් විදග්ධ වචන හඳුනා ගැනීමටත් එය භාවිත කිරීමටත් හුරු කළ යුතු බව පෙනී යයි.

**6.** පහත දැක්වෙන වාක්‍යවල **තදකළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය** දක්වා ඇත. ඒවායෙහි **අනුඅංගය** දක්වන්න.

(i) තනකුරු පිටුපස **ලුහුබඳින** මිනිස්සු ඇතැම් විට **පාපතර** ක්‍රියාවල **ද** නිරත වෙති. (**බඳින** - කෘදන්ත, **පාපතර** - තද්ධිත, **ද** - නිපාත)

(ii) **බමුණාණෝ සූර්යෝදයට** පෙර **ගංගානදියෙහි** ජලස්නානය කළහ. (**බමුණාණෝ** - තද්ධිත, **සූර්යෝදය** - සන්ධි, **ගංගානදිය** - සමාස)

(iii) **සුනිල්** දියදහර මත සුපිපි **සුදුනෙළුම** පරිසරය **ප්‍රභාවත්** කළේ ය. (**සුනිල්** - උපසර්ග, **සුදුනෙළුම** - සමාස, **ප්‍රභාවත්** - තද්ධිත)

(iv) දරුවා **ගසින්** ගෙඩියක් කඩා, **පිහියෙන්** එය **කපමින්** මුවගට සිනා නැඟී ය. (**ගසින්** - විභක්ති, **පිහියෙන්** - විභක්ති, **කපමින්** - ක්‍රියා)

(v) **දෙසබසරැස** නඟනු වස් මහමෙහෙයක් **කළ කුමරතුගුවෝ** හෙළුහවුල ඇරඹූහ. (**දෙසබසරැස** - සමාස, **කළ** - කෘදන්ත, **කුමරතුගුවෝ** - විභක්ති)

(ලකුණු 15 යි.)

(i) බඳින - වර්තමාන කෘදන්ත/වර්තමාන කර්තෘ කාරක කෘදන්ත
පාපතර - තුලනාර්ථයේ/ වඩා යන අර්ථයේ තද්ධිත
ද - සමුච්චයාර්ථ/අවධාරණාර්ථ/ (පද/වාක්‍ය) සම්බන්ධාර්ථ නිපාතය


(ii) බමුණාණෝ - ගෞරවාර්ථයේ තද්ධිත
සූර්යෝදය - ස්වරාදේශ සන්ධිය, ගුණ සන්ධිය
ගංගානදිය - විශේෂණ සමාසය/ විශේෂණ උත්තර (අපර) පද සමාසය

(iii) සුනිල් - උත්තමාර්ථ (අධිකඅර්ථ)/ උත්කෘෂ්ටාර්ථ/ භූෂණාර්ථ/ ශෝභනාර්ථ/ මනා යන අර්ථයේ
සුදු නෙළුම - විශේෂණ සමාසය/ විශේෂණ පූර්ව පද සමාසය
ප්‍රභාවත් - අස්ත්‍යර්ථයේ/ ඇත යන අර්ථයේ තද්ධිත

(iv) ගසින් - අවදි විබත්/අවධි විභක්තිය/ පඤ්චමී විභක්තිය/ අපාදනාර්ථයේ පඤ්චමී
පිහියෙන් - කරණ විභක්තිය
කපමින් - මිශ්‍ර ක්‍රියා / මුසු කිරිය

(v) දෙසබසරැස - ද අරුත් සමස්/ දකාර්ථ සමාස/ ද්වන්ද සමාස/'ච' අර්ථ සමාස
කළ - අතීතකාල කෘදන්ත/ අතීත කාල කර්තෘ කාරක කෘදන්ත/ අතීත කෘදන්ත
කුමරතුගුවෝ - පෙර විබත / ප්‍රථමා විභක්තිය


**6 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**





මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 18%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

| | | | | | |
|---|---|---|---|---|---|
| ඉන් ලකුණු | 00 | - | 03 | ප්‍රාන්තරයේ | 3%ක් ද |
| ලකුණු | 04 | - | 07 | ප්‍රාන්තරයේ | 25%ක් ද |
| ලකුණු | 08 | - | 11 | ප්‍රාන්තරයේ | 53%ක් ද |
| ලකුණු | 12 | - | 15 | ප්‍රාන්තරයේ | 19%ක් ද |

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 19%ක් වන අතර 28%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.



**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

මෙම ප්‍රශ්නයෙන් එක් එක් ව්‍යාකරණ අංග හා ඒවායෙහි ප්‍රභේද පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම මැන බැලෙයි. ප්‍රශ්නය තෝරා ගත් ප්‍රතිශතය 18%ක් වැනි අඩු ප්‍රතිශතයක් ගෙන තිබේ. එයින් ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 19%ක් වන අතර ලකුණු 8ට වඩා අඩුවෙන් ලබා ගත් පිරිස 28%කි. මෙහි සමස්ත පහසුතාව 51%කි.

ඒ අනුව (I) කොටසෙහි පහසුතාව 34%ක් ද (II) කොටසෙහි පහසුතාව 51%ක් ද, (III) කොටසෙහි පහසුතාව 38%ක් ද, (IV) කොටසෙහි පහසුතාව 65%ක් ද, (V) කොටසෙහි පහසුතාව 68% ක් ද වශයෙන් බෙදී ගොස් තිබේ.

මෙයින් ඉහළ පහසුතා මට්ටමක් පෙන්නුම් කරන්නේ සමාස, කෘදන්ත හා විභක්ති ඇසුරෙන් සකස් වූ (V) වන කොටස ය. එය 68%කි. 34%ක අවම පහසුතාව පෙන්නුම් කරන්නේ (I) කොටස වන අතර එය කෘදන්ත, තද්ධිත හා නිපාත ඇසුරෙන් සකස් වූවකි.

මෙම ප්‍රශ්නයේ දී ඉහළ සාධන මට්ටමක් ප්‍රදර්ශනය කරන්නට අපොහොසත් ව ඇත්තේ විවිධ ප්‍රභේද හඳුනා ගැනීමට තරම් නිවැරදි අවබෝධයක් නො තිබීම හේතුවෙනි.

**නිගමන හා යෝජනා**

මෙම ප්‍රශ්නයේ දී එක් එක් ව්‍යාකරණ අංග හා ඒවායේ අනු අංග නිවැරදි ව හඳුනා ගැනීම අවශ්‍ය වෙයි. ඒවා පිළිබඳ ව මනා අවබෝධයක් ඇති අපේක්ෂකයන්ට මෙම ප්‍රශ්නයේ දී ඉතා පහසුවෙන් ලකුණු උපයා ගත හැකි ය. මෙම ප්‍රශ්නයේ ඉහළ සාධන මට්ටමක් ලබා ගැනී ම සඳහා ව්‍යාකරණ හා ඊට අදාළ අනු අංග පිළිබඳ පැහැදිලි අවබෝධයක් ශිෂ්‍යයන්ට ලබා දීම කෙරෙහි ගුරුභවතුන්ගේ අවධානය යොමු විය යුතු ය. ඒ සඳහා සන්ධි, සමාස, ප්‍රත්‍යාර්ථ නාම, අව්‍ය (නිපාත, උපසර්ග) විභක්ති හා ක්‍රියා පද යන ව්‍යාකරණ අංග ඇතුළත් පිටුපෙරළන පොත්පිංච නිර්මාණය ආදී විවිධ ඉගෙනුම් හා ඉගැන්වීම් ශිල්පෝපක්‍රම පන්ති කාමරය තුළ බහුල ව භාවිතා කිරීම මෙහි දී වඩාත් වැදගත් ය. මෙමගින් අපේක්ෂකයා තුළ ආයාසයකින් තොර ව වියරණ සංකල්ප තහවුරු කළ හැකි ය. පුවත්පත් ලිපි කිහිපයක් අපේක්ෂකයන් අතර බෙදා දී එම ලිපිවල ඇති යථෝක්ත ව්‍යාකරණාංග තේරීමට දීම ආදී අභ්‍යාස ද මෙහි ලා වැදගත් වේ. එමෙන් ම ව්‍යාකරණ පිළිබඳ ලියැවී ඇති විවිධ පොත පත පරිශීලනය කිරීමට අපේක්ෂකයා යොමු කරවීම ද වැදගත් ය.

**07 ප්‍රශ්නය**

**7.** (අ) පහත දැක්වෙන යෙදුම්වලට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ ලියන්න.

(i) කථාවේ ප්‍රමාණයට ක්‍රියාව නැත

(ii) කිසිම විදිහකින් නිදහසක් නැති වීම

(iii) උගතා කලබල නොවෙයි

(iv) ආපසු නොඑන පුද්ගලයා අලාභ කොට යෑම

(v) නොසිතූ අන්දමේ ප්‍රතිඵලයක් ලැබීම

(vi) පමණ දැන කටයුතු කිරීම (ලකුණු 03 යි.)

(i) • කතාව දෝලාවෙන් ගමන පයින්

• කියන කොට එහෙමයි කරන කොට මෙහෙමයි

• ගොරවන තරමට වහින්නේ නෑ

• කටින් බතල කොළ හිටවනවා වගේ

(ii) • සෙක්කුවේ බැඳපු ගොනා වගේ
- කොටි වලිගය අල්ලගත්තා වගේ
- ගිරයට අහුවුණු පුවක් ගෙඩිය වගේ
- ඇම ගිල්ල මාළුවා වගේ

(iii) පිරුණු කළේ දිය නොසැලේ

(iv) යන යකා කොරහත් බිඳගෙන යනවා වගේ

(v) වඳින්න ගිය දේවාලේ ඉහේ කඩා වැටුණා වගේ
විද්දේ හාවාට වැදුණේ පඳුරට

(vi) ඇඟිල්ලේ තරමට ඉදිමෙන්න ඕනෙලු (ලකුණු ½ × 6 = 03යි)

(ආ) පහත දී ඇති **රුඪිවල අදහස පැහැදිලි වන සේ** වාක්‍යවල යොදන්න.

(i) හතර බීරි කථාව (ii) නිකිණි සෙවීම
(iii) බක තපස් රැකීම (iv) තෝන් ළණුව දා ගැනීම
(v) ඇඟේ මාළු නටනවා (vi) වහ කදුරු කැවීම (ලකුණු 03 යි.)

(i) කිසිවෙකුට නොතේරුණු

(ii) ඉතා අපහසු කාර්යයක නිරත වීම

(iii) බොරු සිල් පෙන්වීම

(iv) තමන්ට රිසි පරිදි හැසිරවීම

(v) අධික කෝපය/ ඇඩි තරහ

(vi) නීරස වීම, එපා වීම, ඇඩි අකමැත්ත (ලකුණු ½ × 6 = 03යි)

(ඉ) පහත දී ඇති **එක් එක් යුගල පද සෑදී ඇති රටාව** කුමක් දැයි දක්වන්න.

(i) ආවාහ - විවාහ (ii) අක්කා - නගෝ
(iii) මහත - දෙහෙත (iv) දරු - මල්ලෝ
(v) නහින - දෙහින (vi) පොඩි - පට්ටම් (ලකුණු 03 යි.)

(i) එකිනෙකට විරුද්ධ පද දෙකක් යෙදීම

(ii) අන්‍යෝන්‍ය සම්බන්ධතා ඇති පද දෙකක් යෙදීම

(iii) පළමු පදය අර්ථවත් ව ද දෙවෙනි පදය අර්ථ විරහිත ව ද යෙදීම

(iv) අන්‍යෝන්‍ය සම්බන්ධතා ඇති පද දෙකක් යෙදීම

(v) පළමු පදය අර්ථවත් ව ද දෙවෙනි පදය අර්ථ විරහිත ව ද යෙදීම

(vi) ස්වරූපයෙන් අසමාන පද දෙකක් එකතු වී අර්ථය තීව්‍ර කිරීම (ලකුණු ½ × 6 = 03යි)

(ඊ) පහත දී ඇති **ප්‍රාදේශික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පද** ලියා දක්වන්න.

(i) ගහමච්චා (ii) ඔයනවා
(iii) හොයනවා (iv) වැහි බීත්තර
(v) තැම්ම (vi) මන්ඩාරම (ලකුණු 03 යි.)

(i) විසි කරනවා

(ii) පොල් ලෙලි ගහනවා

(iii) සෙවිලි කරනවා

(iv) වැහි පොද/ බින්දු/ වැහි වලාකුළු

(v) දේව දානය

(vi) වැහි අඳුර

**(ලකුණු ½ × 6 = 03ය**

(උ) පහත දී ඇති **ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන අරුත්** ලියන්න.

(i) කමත අඹනවා (ii) ඇඹයා
(iii) දිස්ටිය (iv) අම්බුලි මාමා
(v) උද්දෙරි (vi) කරවාඩය (ලකුණු 03 යි.)

(i) කමත ශුද්ධ කරනවා

(ii) ගොයම් පාගන මිනිසා


(iii) බැල්ම හෙළීම

(iv) හඳ/සඳ/චන්ද්‍රයා/නිශාකර/ උළිඳු/ තුරුපති/තරුපති

(v) උඩට එසවීම

(vi) තද සුළඟ **(ලකුණු ½ × 6 = 03යි)**


**7 ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**





මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 4%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

| | | | |
|---|---|---|---|
| ලකුණු | 00 - 03 | ප්‍රාන්තරයේ | 15%ක් ද |
| ලකුණු | 04 - 07 | ප්‍රාන්තරයේ | 34%ක් ද |
| ලකුණු | 08 - 11 | ප්‍රාන්තරයේ | 26%ක් ද |
| ලකුණු | 12 - 15 | ප්‍රාන්තරයේ | 25%ක් ද |

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 25%ක් වන අතර 49%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

7 වන ප්‍රශ්නයේ කොටස් අතුරෙන් (අ) කොටස සඳහා පහසුතාව 40%ක් ද (ආ) කොටස සඳහා පහසුතාව 35%ක් ද (ඉ) කොටස සඳහා පහසුතාව 11%ක් ද, ලෙස පහසුතා මට්ටම අවරෝහණය වන අයුරු දක්නට ඇත. (ඉ), (ඊ), (උ), පිළිවෙළින් 11%, 7%, 4% ලෙස අඩු පහසුතා මට්ටම් පෙන්නුම් කිරීම මගින් පැහැදිලි වන්නේ යුගල පද සෑදී ඇති රටාව, ප්‍රාදේශීය ව්‍යවහාර සහ ප්‍රාස්තාවික ව්‍යවහාර පිළිබඳ ව අපේක්ෂකයන් සතු අනවබෝධයයි.

**නිගමන හා යෝජනා**

ප්‍රාදේශීය ව්‍යවහාර සහ ප්‍රාස්තාවික ව්‍යවහාර සඳහා පොදු භාවිතයේ යෙදෙන පදවල අරුත් පිළිබඳ ව මෙන් ම යුගල පද සෑදෙන රටා පිළිබඳවත් ප්‍රස්තා පිරුළු පිළිබඳ මනා අවබෝධයක් ඇතිකර ගැනීම මෙන් ම ඒවා භාවිතය කෙරෙහිත් අපේක්ෂකයන්ගේ අවධානය යොමු විය යුතු ය. විශේෂයෙන් මෙම කරුණු ඇතුළත් පොතපත පරිශීලනය කෙරෙහි උනන්දු කරවීම වඩාත් සුදුසු ය.

## 08 ප්‍රශ්නය

**8.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අහාප්‍රියයාණනිඔබමාදක්නටපැමිණියේසාරමසකටපසුවයිස්වාමීනිඔබනොමැතිවගෙවීගියශීතඍතුවමටග්‍රීෂ්මයක්මවිය
දැන්වසන්තඍතුවපැමිණඇතකෝකිලයෝකූජනයකරතිමයූරයෝකේකාධ්වනිපවත්වතිමුළුපරිසරයම
සශ්‍රීකත්වයෙන්බරවඇතමෙවරනම්මාඅතැරනොයනුමැනවපෙම්බරාණනිමාප්‍රේමියනිමටසමාවුවමැනවඅපගේ
පෞද්ගලිකසුඛවිහිරණයටවඩාජාතියේආරක්ෂාවදේශයේඅභිමානයමෙන්මවංශපරම්පරාවේප්‍රෞඪත්වයප්‍රමුඛත්ව
යෙහිලාසැලකියයුතුයපරසතුරන්ගෙන්රටගලවාගැනීමේකාර්යයෙහිව්‍යාවෘතවසිටිනබැවින්සේනාසංවිධානය
ටමුල්තැනදීමටසිදුවියඒකෙසේවුවත්මාහෙටනැවතසටන්බිමටයායුතුයඑසේනම්ප්‍රියයදියනාමාමේසැකසූරළුභෝජනය
අනුභවකොටමල්පහන්ගෙනවහවහාඅපිඉසුරුමුනිවිහාරයටයමුමටඔබසමඟඑහිදීකළයුතුමන්ත්‍රණයක්ඇතස්වාමීනිඅපිවි
හාරයවැඳදියපොකුණඅබියසඋද්‍යානයටයමුමාප්‍රියසුහදාණනිමානිවසෙහිදිවිගෙවනුයේහුදකලාවමයඔබගේනැදෑ
යෝදමටනොයෙකුත්ඇනුම්පදකියතිවඳඑකියකැයිනිග්‍රහදකරතිඅනේමාප්‍රියයමටඔබවැනිමවූපුත්රුවනකලබාදෙන්නැයිඇ
ඔහුගේඇකයේවාඩිවීපපුතුරටහිසතබාකනටසෙමින්මිමිණුවායප්‍රේමියමමඑයඉටුකරන්නෙමියිඔහුදඇයදැඩිවතමළයටසමීප
කරගත්තේය

(i) ඉහත ඡේදය අර්ථාවබෝධයට අනුකූල වන සේ වචන වෙන් කොට, අවශ්‍ය විරාම ලක්ෂණ යොදා නැවත ලියන්න.

(ii) **කාර්යය, ප්‍රාර්ථනා** යන වචන රේඵය යොදා නැවත ලියන්න.

(iii) '**පුද්ගල + ඉක** - පෞද්ගලික නම් **භූත + ඉක**' කෙසේ සකස් වේ ද?

(iv) '**ප්‍රෞඪ**' යන්නෙහි ස්වර හා ව්‍යඤ්ජන වෙන් කර ලියන්න.

(v) '**කණ්ඨජ, අඝෝෂ, මහාප්‍රාණයක්**' සහිත වචනයක් ඡේදයෙන් උපුටා දක්වන්න.

(ලකුණු 15 යි.)

(i) " අහා! ප්‍රියයාණනි, ඔබ දක්නට පැමිණියේ සාරමසකට පසුවයි. ස්වාමීනි, ඔබ නොමැති ව ගෙවී ගිය ශීත ඍතුව මට ග්‍රීෂ්මයක් ම විය. දැන් වසන්ත ඍතුව පැමිණ ඇත. කෝකිලයෝ කූජනය කරති. මයූරයෝ කේකාධ්වනි පවත්වති. මුළු පරිසරය ම සශ්‍රීකත්වයෙන් බර ව ඇත. මෙවර නම් මා අතැර නො යනු මැනව පෙම්බරාණනි." " මා ප්‍රේමියනි, මට සමාවුව මැනව. අපගේ පෞද්ගලික සුබ විහරණයට වඩා ජාතියේ ආරක්ෂාව, දේශයේ අභිමානය මෙන් ම වංශපරම්පරාවේ ප්‍රෞඪත්වය ප්‍රමුඛත්වයෙහි ලා සැලකිය යුතු ය. පරසතුරන්ගෙන් රට ගලවා ගැනීමේ කාර්යයෙහි ව්‍යාවෘත ව සිටින බැවින් සේනා සංවිධානයට මුල්තැන දීමට සිදු විය. ඒ කෙසේ වුවත් මා හෙට නැවත සටන් බිමට යා යුතු ය. " " එසේ නම් ප්‍රියය, දිය නා මා මේ සැකසූ රළු භෝජනය අනුභව කොට, මල්පහන් ගෙන, වහ වහා (වහවහා) අපි ඉසුරුමුනි විහාරයට යමු. මට ඔබ සමඟ එහි දී කළ යුතු මන්ත්‍රණයක් ඇත. ස්වාමීනි, අපි විහාරය වැඳ දිය පොකුණ අබියස උද්‍යානයට යමු. මා ප්‍රිය සුහදාණෙනි, මා නිවසෙහි දිවි ගෙවනුයේ හුදකලාව ම ය. ඔබගේ නැදෑයෝ ද මට නොයෙකුත් ඇනුම්පද කියති; වඳ එකියකැ' යි නිග්‍රහ ද කරති. අනේ! මා ප්‍රියය, මට ඔබ වැනි ම පුත් රුවනක ලබා දෙන්නැ' යි ඇ ඔහුගේ ඇකයේ වාඩි වී, පපුතුරට හිස තබා කනට සෙමින් මිමිණුවා ය." "ප්‍රේමිය, මම එය ඉටු කරන්නෙමි" යි ඔහු ඇය දැඩි ව ළයට සමීප කර ගත්තේ ය.

**(පද බෙදීමට ලකුණු 03යි)**

**(විරාම ලක්ෂණවලට ලකුණු 04යි)**

(ii) කාර්‍ය්‍ය/ කාර්‍යය, ප්‍රාර්‍ථනා


(iii) භෞතික

(iv) ප්+ර්+ඖ+ඪ්+අ

(v) සුබ/ප්‍රමුඛත්වයෙහි

**(ලකුණු 2 × 4 = 08යි)**


**8** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :




මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 78%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 15ක් හිමි වේ.

ලකුණු 00 - 03 ප්‍රාන්තරයේ 1%ක් ද,
ලකුණු 04 - 07 ප්‍රාන්තරයේ 19%ක් ද,
ලකුණු 08 - 11 ප්‍රාන්තරයේ 61%ක් ද,
ලකුණු 12 - 15 ප්‍රාන්තරයේ 19%ක් ද,

ලෙස ලකුණු ලබා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට ලකුණු 11ට වඩා ලබා ගත් පිරිස 19%ක් වන අතර 20%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8ට අඩුවෙනි.




8 වන ප්‍රශ්නයේ කොටස් අතුරෙන් 86%ක වැඩි ම පහසුතාව (iii) කොටසට ලැබී ඇත. අඩු ම පහසුතාව පෙන්නුම් කරනුයේ (iv) වන කොටසට වන අතර එය 6%කි.

**පිළිතුරු පිළිබඳ නිරීක්ෂණ**

කොටස් 5කින් සමන්විත මෙම ප්‍රශ්නයේ පළමු කොටසින් පද බෙදා නැති ඡේදයක් විරාම ලක්ෂණ භාවිත කොට විධිමත් අයුරින් පද බෙදා වෙන් කර නැවත ලිවීම අපේක්ෂා කෙරේ. ඉතිරි කොටස් හතරෙන් භාෂා ව්‍යාකරණ ලක්ෂණ කීපයක් පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම විමසා බැලෙයි.

මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ ප්‍රතිශතය 78%ක් වැනි ඉහළ අගයකින් යුක්ත ය. ඒ අනුව එහි ලකුණු 11ට වඩා ලබාගත් පිරිස 19%ක් වන අතර 20%ක් ලබා ගෙන ඇත්තේ ලකුණු 8කට වඩා අඩුවෙනි.


මෙම ප්‍රශ්නයේ කොටස් අතුරෙන් (I), (II) කොටස් සඳහා 70%ක පහසුතාව ද (III) කොටස සඳහා 86%ක පහසුතාවක් ද (IV) කොටස සඳහා 6%ක පහසුතාව ද (V) කොටස සඳහා 59% ක පහසුතාව ද දක්වා ඇත. ඒ අනුව ඉහළ ම පහසුතා මට්ටම දක්වා ඇත්තේ (III) කොටස වන අතර පහළ ම පහසුතාවක් දක්වා ඇත්තේ (IV) වන කොටස ය.

**නිගමන හා යෝජනා**


සිංහල ලේඛන සම්ප්‍රදායය හා සම්බන්ධිත විරාම ලක්ෂණ භාවිතය පිළිබඳ නිවැරදි අවබෝධයක් අපේක්ෂකයන්ට ලබා දීමට කටයුතු කිරීම වැදගත් ය.

එසේ ම ලේඛනයේ දී සම්මත ආකාරයෙන් පද බෙදීම පිළිබඳ අවබෝධයක් ද අක්ෂර හා පිලි භාවිතය පිළිබඳ වචනයක ස්වර ව්‍යංජන වෙන් කිරීම පිළිබඳ මනා අවබෝධයක් ද අපේක්ෂකයන්ට තිබිය යුතු ය. සතතාභ්‍යාසය මෙහි දී ඉතා වැදගත් ය. මේ සඳහා යෝග්‍ය පොතපත පරිශීලනය කිරීම අත්‍යවශ්‍ය වේ.

**2.2.8 II ප්‍රශ්න පත්‍රයේ II කොටසට පිළිතුරු සැපයීම පිළිබඳ සමස්ත නිරීක්ෂණ, නිගමන හා යෝජනා :**




II ප්‍රශ්න පත්‍රයේ II කොටසේ ඇතුළත් ප්‍රශ්න අතුරෙන් භාෂා අවබෝධය හා සංශ්ලේෂණය පිළිබඳ ව 2 ප්‍රශ්නය ද විශ්ලේෂණාත්මක රචනා ලිවීමේ හැකියාව පිළිබඳ ව 3 වන ප්‍රශ්නය ද දී ඇති අතර ඒවායේ පහසුතා පිළිවෙළින් 72% ක් හා 58% ක් වේ. ඉතිරි ප්‍රශ්න 5 භාෂා විග්‍රහයට ඇතුළත් වන අතර එයින් 7 වන ප්‍රශ්නය 19%ක අවම පහසුතා මට්ටමක් පෙන්නුම් කරයි. ඉතිරි ප්‍රශ්න 4හි පහසුතා මට්ටම් 41% හා 64% අතර පරාසයක පවතී.




වර්ගීකරණය අනුව සමස්ත පහසුතාව සැලකීමේ දී භාෂා අවබෝධය හා සංශ්ලේෂණයට 72%ක් වන ඉහළ ම පහසුතාව ද රචනය හා නිර්මාණකරණ හැකියාවට 58%ක පහසුතාව ද භාෂා විග්‍රහය ඇසුරෙන් සැකසී ඇති ප්‍රශ්න සඳහා අඩු ම පහසුතාව වන 57%ක් ද හිමි වී ඇත. විශ්ලේෂණාත්මක රචනා ලිවීමේ හැකියාව සඳහා ඉහළ පහසුතාවක් අපේක්ෂකයන්ගෙන් බලාපොරොත්තු වුවත් පෙන්නුම් කර තිබුණේ 58%ක මට්ටමකි. එබැවින් රචනා මාතෘකා කෙරෙහි ඔවුන් තුළ ඇති දැනුම, වචන කෝෂය හා ඉදිරිපත් කිරීම මෙන් ම ගලා යාමේ ස්වරූපය ද කෙරෙහි වැඩි අවධානයක් යොමු කළ යුතු බවත් කියවීමෙන් කරුණු රැස් කර ගත යුතු බවත් අවධාරණය කළ යුතු ය.

වර්ගීකරණයට අනුව අඩු ම පහසුතා මට්ටම පෙන්නුම් කරනුයේ භාෂා විග්‍රහයට අදාළ ප්‍රශ්න සඳහා ය. අපේක්ෂකයන්ගේ භාෂා, ව්‍යාකරණ හා වාක්කෝෂ දැනුම පුළුල් කිරීම සඳහා අභ්‍යාසකරණය හා පොතපත පරිශීලනයට හුරු කරවීම අත්‍යවශ්‍ය ය

## III කොටස

### 3.0 පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හා යෝජනා :

### 3.1. පිළිතුරු සැපයීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු :

**පොදු උපදෙස් :**

* පිළිතුරු සැපයීම ආරම්භ කිරීමට පෙර ප්‍රශ්න පත්‍රයේ ඇති මූලික උපදෙස් කියවා හොඳින් තේරුම් ගත යුතු ය. එක් එක් කොටසින් කොපමණ ප්‍රශ්න සංඛ්‍යාවකට පිළිතුරු සැපයිය යුතු ද, කුමන ප්‍රශ්න අනිවාර්ය ද, කොපමණ කාලයක් ලැබේ ද කොපමණ ලකුණු ලැබේ ද යන කරුණු පිළිබඳ ව සැලකිලිමත් විය යුතු වෙයි. එසේ ම ප්‍රශ්න හොඳින් කියවා නිරවුල් අවබෝධයක් ඇති ව ප්‍රශ්න තෝරා ගත යුතු ය.
* I පත්‍රයේ සහ II පත්‍රයේ II කොටසට අයත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සෑම ප්‍රධාන පිළිතුරක් ම අලුත් පිටුවකින් ආරම්භ කළ යුතු ය.
* II පත්‍රයේ I කොටස ප්‍රශ්න අංකයට ඉදිරියෙන් ඇති වරහන තුළ නිවැරදි වරණයට හිමි අංකය ප්‍රශ්න පත්‍රයේ ම සටහන් කළ යුතු ය.
* ප්‍රශ්න අංක, කොටස් හා අනුකොටස්වල සංකේත නිවැරදි ව ලිවිය යුතු ය.
* ප්‍රශ්නයක කිසියම් අනුකොටසකට පිළිතුරු නොසපයන්නේ නම් එම අනුකොටසට හිමි අක්ෂරය හෝ රෝම ඉලක්කම ලියා ඉදිරියෙන් ඉරක් ඇඳිය යුතු ය.
* අනිවාර්ය ප්‍රශ්න හැරුණු විට අනෙකුත් ප්‍රශ්න එක්වරක් කියවා ඔබ පිළිතුරු ලිවීමට අපේක්ෂිත ප්‍රශ්න මොනවා දැයි ලකුණු කරන්න.
* ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න අංක අනුපිළිවෙළට නො ව ඔබට ඉතා ම හොඳින් පිළිතුරු ලිවිය හැකි ප්‍රශ්නයකින් පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.
* ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට අනුගත ව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු අතර අමතර ව තවත් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමෙන් වැළකිය යුතු ය.
* පිළිතුරු පත්‍රයේ සෑම පිටුවක ම විභාග අංකය සටහන් කළ යුතු ය.
* ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී කාලය මනාව කළමනාකරණය කර ගැනීමට වග බලා ගත යුතු ය.
* පිළිතුරු සැපයීමේ දී රතු සහ කොළ පාට පෑන් භාවිත කිරීමෙන් වැළකිය යුතු ය.
* කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලට දීර්ඝ පිළිතුරු ලිවීමත්, දීර්ඝ පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලිවීමත් නො කළ යුතු ය.
* දීර්ඝ පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්නවල දී තර්කානුකූල ව හා විශ්ලේෂණාත්මක ව කරුණු ඉදිරිපත් කළ යුතු ය.

**විශේෂ උපදෙස්**

* I පත්‍රයේ සාහිත්‍ය විචාර ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමේ දී උද්ධෘත නිවැරදි ව යෙදීමට සැලකිලිමත් විය යුතු ය.
* ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිසි පරිදි කාලය කළමනාකරණයට හුරු විය යුතු ය.
* පැහැදිලි අත් අකුරු ලිවීමටත් නිවැරදි ලෙස අකුරු යොදා ගැනීමටත් හුරු විය යුතු ය.
* I පත්‍රයට අදාළ සාහිත්‍ය නිදසුන් දැක්වීමේ දී ප්‍රශ්නයට යෝග්‍ය ආකාරයෙන් නිදසුන් තෝරා ගත යුතු ය. එක සමාන නිදසුන් සෑම ප්‍රශ්නයකට ම යෙදීමට උත්සාහ නො කළ යුතු ය.
* II පත්‍රයේ I සහ II කොටස්වල ඇතුළත් ව්‍යාකරණ අනුකොටස්වලට පිළිතුරු සැපයීමේ දී යෝග්‍ය පිළිතුර ම තෝරා ගැනීමට උත්සාහ කළ යුතු ය. මෙහි දී අවබෝධය, දැනුම මෙන් ම තර්කානුකූල චින්තනය ද යොදා ගත හැකි විය යුතු ය.
* තමාගේ හිතුමතය පරිදි යෝග්‍ය යැයි සිතා අංක යෙදීම නො කළ යුතු ය.
* I පත්‍රයේ විචාර ප්‍රශ්නවල දී මෙන් ම II පත්‍රයේ රචනා ප්‍රශ්නයේ දී කරුණු ගැළපීම විධිමත් ව කළ යුතු ය. පිළිතුරෙහි මුල, මැද හා අග අතර විධිමත් ගැළපීමක් පැවතිය යුතු ය.
* ප්‍රශ්නයට අදාළ සෑම කරුණක් ම කිසියම් හේතුවක් නිසා පිළිතුරෙහි ඇතුළත් කිරීමට දුෂ්කරතා ඇති වන අවස්ථාවල දී ලියා ඇති පිළිතුරු මගින් තමන් තුළ පවත්නා දැනුම අනාවරණය කළ යුතු ය.

## 3.2 ඉගෙනුම් හා ඉගැන්වීම් පිළිබඳ අදහස් හා යෝජනා

**අයදුම්කරුවන් සඳහා යෝජනා :**

* විෂය නිර්දේශයට අදාළ පොත්පත් අධ්‍යයනය කිරීමේ දී වැදගත් කරුණු මතකයේ තබා ගැනීමත් ග්‍රන්ථ ආශ්‍රිත කරුණු විචාරාත්මක වශයෙන් විමර්ශනය කිරීමත් අවශ්‍ය වේ.
* නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රයෙන් සකස් කළ හැකි ප්‍රශ්න පිළිබඳව විචාරාත්මක ව සිතා බලා එම ප්‍රශ්නවලට පිළිතුරු සඳහා පාදක කර කරුණු ගොනු කර ගැනීමට උත්සාහ කළ යුතුය. මෙහි දී පැරණි ප්‍රශ්න පත්‍ර කියවා ඒවායේ අඩංගු කරුණු විශ්ලේෂණය කිරීම වැදගත් ය.
* නිර්දිෂ්ට ග්‍රන්ථ හොඳින් කියවා ඒවායේ චරිත නිරූපණය, පරිසර හා අවස්ථා වර්ණනා ගැන මනා අවබෝධයක් ලබා ගැනීම සුදුසු ය.

**ගුරුභවතුන් සඳහා යෝජනා :**

* ප්‍රශ්න පත්‍රවල ආකෘතිය පිළිබඳ ව මනා වැටහීමක් අපේක්ෂකයන් තුළ ඇති කිරීම අවශ්‍ය වේ.
* විෂය නිර්දේශයේ සියලු ම කොටස් පිළිබඳ ව මනා පරිචයක් අපේක්ෂකයන් තුළ ඇති කිරීම සුදුසු ය.
* නිර්දිෂ්ට සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනයේ අවශ්‍යතාව අපේක්ෂකයන්ට වටහා දී, මනා මග පෙන්වීමක් සිදු කිරීම අවශ්‍ය වේ.
* ප්‍රශ්න පත්‍රවල දී ඇති උපදෙස් අනුව ක්‍රියා කිරීමේ අවශ්‍යතාව හා එම උපදෙස් අභිබවා යෑමෙන් විය හැකි හානි පෙන්වා දීම සුදුසු ය.
* පිළිතුරු ලිවීමේ දී කාලය මනාව කළමනාකරණය කර ගැනීම සඳහා පිළිතුරු ලිවීමේ අභ්‍යාසවල නිරත කරවීම අවශ්‍ය වේ.
* හැකි සෑම විට ම පෙරහුරු පරීක්ෂණවල යොදවමින් විභාගයට මුහුණ දීමේ ශක්තිය අපේක්ෂකයන් තුළ වර්ධනය කිරීම අවශ්‍ය වේ.
* අතිරේක පොත පත කියවීමට සිසුන් ධෛර්යවත් කිරීම සුදුසු ය.
* තර්කානුකූල හා විශ්ලේෂණාත්මක චින්තනයට සිසුන් යොමු කරවීම අවශ්‍ය වේ.
* පොතපත ඇසුරෙන් ශිෂ්‍යයන්ගේ පෞරුෂ වර්ධනයට යොදා ගත හැකි යෝග්‍ය චරිත පැහැදිලි කරදීම ද අවශ්‍ය වේ.